

2022
වාර්ෂික වාර්තාව

IPS
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

අන්තර්ගතය

01 අප පිළිබඳ දැක්ම මෙහෙයුම පාලක මණ්ඩලය

02 සභාපතිතුමාගේ පණිවිඩය

04 විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

05 වැදගත් සිදුවීම් 2022

08 පර්යේෂණ වැඩසටහන

09 සාර්ව, වෙළඳාම සහ තරඟකාරිත්වය

19 ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය

25 සංක්‍රමණය සහ නාගරීකරණය

31 දරිද්‍රතාව සහ සමාජ ශුභසාධනය

36 කෘෂිකර්මය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

41 පරිසරය, ස්වභාවික සම්පත් සහ කාලගුණ වෙනස

45 පර්යේෂණ කාර්ය මණ්ඩලය

47 සහය කාර්ය මණ්ඩලය

48 සහය සේවා

48 මූල්‍ය සහ පරිපාලනය

51 මූල්‍ය විශේෂ අවස්ථා - 2013 - 2022

52 සන්නිවේදනය සහ ප්‍රවේශය

52 තොරතුරු පද්ධති ඒකකය

53 පුස්තකාලය

54 ප්‍රකාශන 2022

55 අභ්‍යන්තර සම්මන්ත්‍රණ

60 IPS සීමාවාසික වැඩසටහන 2022

61 මූල්‍ය ප්‍රකාශන

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ තිබෙන ඉහළ ම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය වේ. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි සපයා දීම පිණිස ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අපගේ මෙහෙවර වේ.

දශක තුනකට අධික කාලයක් පුරා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද විශිෂ්ඨ, ස්වාධීන පර්යේෂණ රාශිය නිසා මෙම අයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීමට ලක්වී තිබේ. මෙම ආයතනයෙහි පර්යේෂණ වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ සහ ආසියානු කලාපයේ වර්තමාන සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙයි. වාර්තා, පර්යේෂණ පත්‍රිකා, සඟරා ලිපි සහ ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් හරහා පුළුල්ව ප්‍රචාරණය කරනු ලබන ආනුභවික-පාදක පර්යේෂණ මගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට සහාය දීමේ ස්වකීය ජයග්‍රාහී වාර්තාව බිහි කිරීම සඳහා මූලික වූයේ මෙම ආයතනයේ ප්‍රබල අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි පරිපූර්ණ නිපුණත්වයයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන, ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, තියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මගින් අපගේ පාර්ශ්වකරුවන්ව දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැස්වීම සහ එමගින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම.

පාලක මණ්ඩලය

ජේෂ්ඨ මහාචාර්ය
එච්.ඩී. කරුණාරත්න මහතා
උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය (නිල බලයෙන්)

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය (නිල බලයෙන්)

ඒ.ආර්.කේ. විජේසේකර මහතා
සහකාර අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව (නිල බලයෙන්)

මහාචාර්ය අනෝමා එස්.පී. අභයරත්න මහත්මිය
ආර්ථික විද්‍යාව පිළිබඳ ජේෂ්ඨ මහාචාර්ය,
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඕ.පී. දයාරත්න බණ්ඩා මහතා
ආර්ථික විද්‍යාව පිළිබඳ ජේෂ්ඨ මහාචාර්ය
ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ආර්.එම්. අබේරත්න මහතා
සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය සහ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන අධ්‍යක්ෂ,
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය
විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

සභාපතිතුමාගේ පණිවිඩය

2022 වර්ෂයේ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කරමින් මෙම පණිවිඩය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටු වෙමි. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා සහ සියලු ම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් සාක්ෂි සපයා දීම පිණිස උසස් තත්ත්වයේ, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙවර වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2022 වර්ෂයේ දී සිදු කරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ඒවායෙහි ප්‍රතිඵල මගින් එම වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි සැබෑ තත්ත්වය සහ රටේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති අභියෝග පැහැදිලි කිරීමේ ස්වකීය සම්ප්‍රදාය තවදුරටත් ඉටු කළේය. විශේෂයෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය' නැමති වාර්තාව ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමුඛතම, ප්‍රායෝගික සහ ස්වාධීන ආර්ථික පර්යේෂණ වාර්තාවලින් එකක් ලෙස සලකනු ලැබේ.



ජෙෂ්ඨ මහාචාර්ය
එච්. ඩී. කරුණාරත්න

පාස්කු ඉරු දින ප්‍රහාර, කොවිඩ්-19 වසංගතය, විදේශ විනිමය අර්බුදය, ණය අර්බුදය සහ දේශපාලන හා සමාජ අස්ථාවරත්වය වැනි අර්බුද රාශියක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථිකය පසුගිය වසර තුනක කාලය පුරා දුෂ්කර කාල පරිච්ඡේදයකට මුහුණ දී තිබේ. සාමාන්‍යයෙන් අපේක්ෂා කළ හැකි පරිදි අර්බුදකාරී අවස්ථාවක පර්යේෂණ සිදුකිරීම පහසු කාර්යයක් නොවේ. එවැනි වාතාවරණයන් තුළ දත්ත රැස් කිරීමේ සම්ප්‍රදායික ක්‍රම අනුගමනය කිරීම, සම්පත් වෙත ප්‍රවේශවීම, දක්ෂ පර්යේෂකයින් රඳවා තබා ගැනීම, සාකච්ඡා කිරීම සඳහා පුද්ගලයින් සෘජුව ම සම්බන්ධ කර ගැනීම, ප්‍රවාහන ක්‍රම මෙන්ම නියමිත වේලාවට ප්‍රතිඵල ලබා දීම සම්පූර්ණයෙන් ම වෙනස් වේ. ශ්‍රී ලංකාවේ ද මේ සම්බන්ධ තත්ත්වයෙහි වෙනසක් නැත.

වර්තමානයේ, ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල මුහුණ දී සිටින විශාලතම අර්බුදය වන්නේ අධික උද්ධමනය, රජයේ අධික බදු අයකිරීම්, සමාජ අස්ථාවරත්වය සහ රජය සහ පෞද්ගලික අංශය විසින් පනවා ඇති බඳවා ගැනීමේ සීමා කිරීම් වැනි බාහිර සාධක හේතුවෙන් සුදුසුකම් ලත්, දක්ෂ පර්යේෂකයන් රඳවා තබා ගැනීම යි. එවැනි වාතාවරණයක් යටතේ වුවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය උසස් තත්ත්වයේ පර්යේෂණ සිදු කිරීම සහ නියමිත වේලාවට පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම මගින් උසස් ම මට්ටමේ පර්යේෂණ ආයතනයක් ලෙස රැඳී සිටීමට සමත් වී ඇත. මෙම වර්ෂය මුළුල්ලේ සිදු කළ විශිෂ්ඨ මෙහෙවර වෙනුවෙන් ආයතනයේ විධායක අධ්‍යක්ෂ, ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ සුභාශිංසන පිරිනමමි.

අපි දන්නා පරිදි, අද අප මුහුණ දෙන නව ආකාරවල අර්බුද ජය ගැනීම සඳහා නව විසඳුම් සහ ක්‍රම අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව විවිධ අර්බුද රාශියක් මධ්‍යයෙහි කටයුතු කරන බැවින්, නව පර්යේෂණ සැලසුම් කිරීම, නව දත්ත රැස් කිරීම, නවීන පර්යේෂණ ක්‍රම අනුගමනය කිරීම, පර්යේෂණ ක්‍රියාවලියේ දී අන්තර්කරණය වූ ක්‍රමයක් අනුගමනය කරන බව සහතික කිරීම, නවෝත්පාදන ඉදිරිපත් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පර්යේෂණවල සොයාගැනීම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ. එහෙයින්, ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින පෙර නොවූ විරූ අර්බුද සඳහා ප්‍රතිපත්ති විසඳුම් සෙවීම පිණිස නව්‍ය සහ සම්බන්ධිත ප්‍රවේශයන් අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ වෘත්තිකයන්ට අප ආයතනයේ කාර්යය නිර්දේශ කිරීමට මම කැමැත්තෙමි.

විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

ශ්‍රී ලංකාව මෙතෙක් මුහුණ දී ඇති දරුණුතම ආර්ථික අර්බුදය හමුවේ සහ එහි ඇඟවීම් තවමත් සම්පූර්ණයෙන් ම දැනී නොමැති තත්ත්වයක් හමුවේ, පසුගිය මාස 12 ක කාල පරිච්ඡේදය මෙරට පුරවැසියන්ට ආවර්ජනයක නිරතවීමේ කාල පරිච්ඡේදයක් විය. ශ්‍රී ලංකාව නිදහස ලබා 75 වසරක් සම්පූර්ණ වීමට ආසන්න අවස්ථාවේ මෙවැනි ආර්ථික කඩාවැටීමක් ඇතිවන අයුරින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආයතනික ව්‍යුහයන් බිඳ වැටුණු ආකාරය අවබෝධකර ගැනීම සඳහා ගැඹුරු ගවේෂණ බොහෝ සෙයින් සිදු කෙරෙමින් පවතියි. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලෙස අපගේ පර්යේෂණ මඟින් පසුගිය දශකය පුරාවට ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය දුර්වල වෙමින් පැවතීම, විදේශ ණයවලට නිරාවරණයවීම ඉහළ යමින් පැවතීම සහ බාහිර කම්පනවලට ගොදුරු වීමේ අවදානම පිළිබඳව නිරතුරුව අනතුරු ඇඟවීම් නිකුත් කර ඇත. ඇත්ත වශයෙන්ම, 2013 තරම් පෙර කාලයේ දී, 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය' නැමති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව මඟින් විදේශ ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ඇති අවදානම අවධාරණය කර ඇති අතර, පසුකාලීනව නිකුත් කරන ලද වාර්තා මඟින් මෙම ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා ශක්තිමත් ප්‍රතිපත්ති ප්‍රතිචාර දක්වන ලෙස අඛණ්ඩව ඉල්ලා සිටියේය. ආපසු හැරී බැලීම අපට වැදගත් පාඩම් සපයා දෙන අතර, ශ්‍රී ලංකාව දැන් කළ යුතු ප්‍රමුඛතම කාර්යය වන්නේ සියලු දෙනා එකට එක්වී, මෙම අර්බුදයේ ක්ෂණික බලපෑමෙන් රට බේරා ගැනීම සඳහා කටයුතු කිරීම යි.



ආචාර්ය දුෂ්නි වීරකෝන්

2022 වර්ෂයේ අපගේ වැඩසටහන මඟින් කෙටි කාලීන ප්‍රතිපත්ති අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, මධ්‍ය කාලීන බලපෑම් හඳුනා ගෙන ඒවා විශ්ලේෂණය කිරීම සඳහා සහ සුදුසු ප්‍රතිපත්ති විසඳුම් සැලසුම් කිරීම සඳහා කඩිනමින් කටයුතු කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සතු හැකියාව පෙන්නුම් කරයි. අපි අර්බුදයෙහි බලපෑම සහ එය රටේ වඩාත් ම අවදානම්සහගත සහ අවාසිසහගත තත්ත්වයන්හි තිබෙන කුටුම්භ කෙරෙහි විෂමානුපාතික ලෙස බලපාන ආකාරය තිරසාර සංවර්ධන ඉලක්ක රාමුව හරහා විශ්ලේෂණය කිරීමේ කාර්යය ක්‍රියාත්මක කළෙමු. ජීවන වියදම මඟින් එල්ලකරන පීඩනයෙහි සහ ආදායම් රැකියා සහ ජීවනෝපාය අහිමිවීම්වල අන්තර්-සම්බන්ධිත බලපෑම් රට පුරා ඉහළ යමින් පවතින දර්ද්‍රතාවය සහ ආහාර අනාරක්ෂිත භාවය තුළින් පැහැදිලි වෙයි. මෙම වර්ෂයේ "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය" නැමති වාර්තාව ජාතික ප්‍රමුඛතා හඳුනා ගැනීම සහ ප්‍රතිඵල අධීක්ෂණය කිරීම පිණිස ඇති සංකීර්ණ සහ අන්තර්-සම්බන්ධිත සමාජ-ආර්ථික අභියෝග පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් තුළ මෙම සාධක ඒකරාශී කරයි.

එමෙන් ම, ආර්ථික අර්බුදය සම්බන්ධ ඉතාමත් ම හදිසි ගැටළු කිහිපයක් වඩාත් හොඳින් අවබෝධ කර ගෙන ඒවාට විසඳුම් සෙවීම පිණිස වඩාත් සවිස්තර අධ්‍යයන මාලාවක් ද සිදු කරන ලදී. පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම වලින් කම්කරුවන්ට ලැබෙන ප්‍රතිලාභ මට්ටම්වල සහ ආවරණයෙහි ඇති හිදැස් හඳුනා ගැනීම සඳහා එම සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සිතියම්ගත කිරීම පිණිස "ශ්‍රී ලංකාවේ විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ක්‍රියාකාරී සහ විශ්‍රාම වයසේ සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම" පිළිබඳ අධ්‍යයනයන් ද මේවාට ඇතුළත් වේ. තවත් අධ්‍යයනයක් මඟින් ආහාර හානියෙහි ස්වභාවය, ඒ සඳහා ඇති අවකාශය සහ එයට පාදක වන හේතු විමසා බැලීම පිණිස සහ හානිවීම අවම කර ගැනීමට උපකාරී වන චර්යාත්මක වෙනස්කම් පොළඹවන නවෝත්පාදන මාලාවක ඵලදායීත්වය පැහැදිලි කිරීම පිණිස 'සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා ආහාර හානිවීම අවම කිරීමේ මාර්ග සකස් කිරීම' කෙරෙහි අවධානය යොමු කරන ලදී. සංක්‍රමණික සේවක ක්ෂේත්‍රය තුළ, එම සේවකයින්ගේ ආර්ථික, සමාජයීය සහ මනෝ-සමාජීය සම්බන්ධතා නැවත ස්ථාපනය කිරීම සහතික කිරීම පිණිස 'ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්ගේ කුසලතා, අභිලාෂයන් සහ යළි සමාජ සංකලනයවීම සම්බන්ධ අභියෝග' හඳුනාගැනීමේ අධ්‍යයනයක් සිදු කරමින් තිබේ. ඒ හා සමානව ම, රාජ්‍ය වියදම් සමාලෝචනය කිරීම සලකා බැලීමේ දී, ප්‍රධාන බදු සහ පැවරීමේ ක්‍රම පිළිබඳ ඇගයීමක් සිදුකිරීම පිණිස සහ අන්තර්කරණය වූ ප්‍රතිසාධනයකට සහාය වීමේ දී ඒවා රටේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මාර්ගයට බලපාන්නේ කෙසේද යන්න විමසා බැලීම පිණිස 'ශ්‍රී ලංකාවේ අසමානාත්මතාව සහ දර්ද්‍රතාවය කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑම ඇස්තමේන්තු කිරීම' පිළිබඳ අධ්‍යයනයක් ද සිදු කරමින් පවතියි.

මෙම අධ්‍යයනයන් මඟින් මෙන්ම මෙයට පෙර සිදු කරන ලද පර්යේෂණ තුළින් ද සොයාගත් කරුණු උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා රජය විසින් සුදුසු ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයන් සැකසීම සඳහා දරනු ලබන ප්‍රයත්නයන්ට සහාය දීමෙහි සක්‍රීයව නිරත විය. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමකට අනුව කටයුතු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව, ආසන්න-කාලීන සාර්ව ආර්ථික ස්ථායීකරණය ළඟාකර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ගවලට උපකාරී වන සහ මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීන දක්වා ප්‍රතිසාධනය සහ තිරසාර වර්ධනය අත්කර ගැනීමට


අවශ්‍ය කරන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය තොරතුරු සපයා දෙන ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කළේය. එයට අමතරව, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කැඳවන ලද ආර්ථික ස්ථායීකරණය, ප්‍රතිසාධනය සහ වර්ධනය වැඩිදියුණු කිරීම පිළිබඳ කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අයවැය සම්පාදන ක්‍රියාවලියට සහාය වීම පිණිස මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට විශේෂිත ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කරමින්, ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් පිළිබඳ සාකච්ඡා සඳහා ප්‍රතිපත්ති යෙදවුම් සහ යෝජනා ලබා දුන්නේය. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව්‍යවස්ථාදායක අධීක්ෂණය ශක්තිමත් කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'අයවැය 2023 පිළිබඳ වාර්තාව: රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ ඇගයීමක්' ද සකස් කරන ලදී.

එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සේවිකාවන් මුහුණ දෙන හානිකර සෞඛ්‍ය බලපෑම් අවම කිරීම සඳහා වසංගත ප්‍රතිචාර වැඩි දියුණු කිරීම' පිළිබඳ ස්වකීය යෝජනාව සඳහා ගෝලීය වශයෙන් තරඟකාරී බහු-වාර්ෂික පර්යේෂණ ප්‍රදානයක් දිනා ගනිමින්, ශක්තිමත් සහ ප්‍රබල පර්යේෂණ සිදු කිරීම සම්බන්ධයෙන් ආයතනය සතු කීර්ති නාමය තවදුරටත් තහවුරු කර ගත්තේය. මෙය 'ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන් ශක්තිමත් කිරීම', 'දුම්කොළ භාවිතය පාලනය කිරීම' සහ 'කාන්තාවන් සඳහා ඔබින රැකියා සපයාදීම කෙරෙහි බලපාන සමාජ, ආර්ථික සහ නෛතික බාධක' සම්බන්ධ අපගේ දැනට සිදු කරමින් පවතින අනෙකුත් බහු-වාර්ෂික පර්යේෂණ ව්‍යාපෘති ද තවත් වැඩිදියුණු කරයි. මෙම නව වැඩසටහන් සමඟින්, අපගේ ගෝලීය ප්‍රවේශය තවදුරටත් පුළුල්කර ගැනීමට අපට උපකාරී වනු පිණිස නව හවුල්කාරිත්වයන් ද පිහිටුවා ගන්නා ලදී. 2022 වර්ෂයේ දී පමණක්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය, ඩ්‍යුක් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, ලෝක බැංකුව සහ ශ්‍රම සංචලනය සහ සංක්‍රමණිකයන් සඳහා වූ දකුණු ආසියා මධ්‍යස්ථානය වැනි විවිධ හවුල්කරුවන් සහ අනෙකුත් සෙසු හවුල්කරුවන් සමඟ අඛණ්ඩව කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි ද පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත අපගේ පර්යේෂණ සාක්ෂි සහ අදහස් රැගෙන යාම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයෝ පුළුල් පරාසයක ප්‍රකාශන, සම්මන්ත්‍රණ සහ මාධ්‍ය නියැළීම් වලට සම්බන්ධ වූහ.

ප්‍රබල සාක්ෂි උත්පාදනය කිරීම සඳහා අපි ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක යන ක්‍රම දෙකෙහි ම අපගේ ප්‍රවීණත්වය අඛණ්ඩව යොදා ගන්නා අතර ම, ආර්ථික හා සමාජීය ප්‍රශ්න පිළිබඳ අපගේ අවබෝධය සහ ප්‍රතිපත්ති මඟින් වෙනසක් සිදු කළ හැකි ආකාර වැඩිදියුණු කිරීම යන අපගේ පුළුල් අරමුණ නොවෙනස්ව පවත්වාගෙන ඇත. මෙම වාර්ෂික වාර්තාව මඟින් ඔබට අපගේ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍ර හය අතරින් එක එකක් පිළිබඳ අවබෝධය ලබා දෙන අතර, විශේෂයෙන් ම අපගේ පර්යේෂණ අධ්‍යයන සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වලට අදාළව එක් එක් ක්ෂේත්‍රය තුළ අප විසින් සිදු කර ඇති කාර්යයන් ද අවධාරණය කර පෙන්වයි.

ඇතියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තිබියදීත්, 2022 වර්ෂය සඳහා වන අයවැය මඟින් නියම කරගෙන ඇති ඉලක්ක සපුරා ගැනීමේ දී ශක්තිමත් ප්‍රගතියක් අත්කර ගැනීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට හැකි විය. කැළඹිලි සහගත ආර්ථික තත්ත්වය හේතුවෙන් නිවසේ සිට රාජකාරී කිරීමේ වැඩපිළිවෙළ යෙදීම සහ සේවා සැපයීම අධීක්ෂණය කිරීම වැනි අභියෝග නිර්මාණය වූ අතර, අධික උද්ධමනය සහ ඒ ආශ්‍රිත ඉහළ පිරිවැය හේතුවෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය හැකියාවට ද සැලකිය යුතු අවදානමක් ඇතිකළ නමුත් අපි ව්‍යාපෘති අයවැය වරින් වර සමාලෝචනය කිරීම මඟින් සහ අපගේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීම් වැඩි කිරීම මඟින් සාර්ථක ලෙස මෙම අවදානම් අවම කර ගත්තෙමු. ඇත්ත වශයෙන්ම, ජාතික විගණන කාර්යාලය විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වෙත නිකුත් කරන ලද සතුටුදායක විගණන වාර්තාව මඟින් ආයතනය තුළ ශක්තිමත් පද්ධති සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මකව පවතින බව පැහැදිලි වෙයි.

විවිධ ක්ෂේත්‍රවල දක්ෂතාවය ඇති අපගේ නිපුණ අභ්‍යන්තර පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩලයෙහි කැපවීම නොතිබෙන්නට ආයතනයේ ප්‍රබල පර්යේෂණ හා ප්‍රතිපත්ති සැලසුම් සහ මූල්‍ය තිරසාරභාවය යන මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් පසුගිය මාස 12 ක කාලය තුළ ආයතනය අත්කරගත් ප්‍රගතිය කළ නොහැක්කක් වන්නට තිබුණි. දැඩි කැපවීමෙන් කටයුතු කළ අපගේ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පළ කර සිටින අතර, අපගේ පර්යේෂණ න්‍යාය පත්‍රය වැඩිදියුණු කර ගැනීමට සහ ප්‍රතිපත්ති සංකල්ප සංවර්ධනය කර බෙදා හැරීමේ අභිප්‍රායය ඇතිව සිටින අප වෙත ලබා දුන් සහයෝගය වෙනුවෙන් සභාපතිතුමාට සහ පාලක මණ්ඩලයට ද මාගේ ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාව කර ගනිමි.



දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂ

විශේෂ අවස්ථා

ජනවාරි

ආචාර්ය බිලේෂා වීරරත්න මහත්මිය ජනවාරි 17 වැනි දින TV1 රූපවාහිනී නාලිකාවේ විකාශය වූ 'ෆෙස් ද නේෂන්' වැඩසටහනේ දී ප්‍රේෂණ විශාල ලෙස පහත වැටීමට හේතු සහ විධිමත් ප්‍රේෂණ මාර්ග භාවිතා කිරීම පිළිබඳ සාකච්ඡා කළාය.



මාර්තු

ආචාර්ය ගංගා තිලකරත්න මහත්මිය 'ශ්‍රී ලංකාවේ වත්මන් සමාජ ආරක්ෂණ පද්ධතිවල විස්තීර්ණ පසුබිම අනුරූපණය කිරීම' පිළිබඳ වාර්තාව මගින් සොයාගත් කරුණු සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළාය. මාර්තු 14, කොළඹ.



මැයි

වොෂින්ටනය කේන්ද්‍ර කර ගත් අත්ලාන්තික් කවුන්සිලයේ දකුණු ආසියා මධ්‍යස්ථානය විසින් සත්කාරකත්වය දරන ලද අතථ්‍ය විද්වත් මණ්ඩල සාකච්ඡාවක දී ආචාර්ය අසංක විජේසිංහ මහතා ශ්‍රී ලංකාවට එහි ආහාර සුරක්ෂිතතාව සහ දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සඳහා දකුණු ආසියානු රටවල් සමග සමීප සහයෝගීතාවය උපකාරී වන ආකාරය පිළිබඳ කරුණු ගෙනහැර දැක්වූයේය. මැයි 12.



පෙබරවාරි

පර්යේෂණ නායිකාව ලෙස ආචාර්ය නිශා අරුණතිලක මහත්මිය, 'යෝග්‍ය රැකියාවල කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වයට බලපාන සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම: බහු-දේශ, මිශ්‍ර-ක්‍රමවේද, ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදී විශ්ලේෂණය' පිළිබඳ බහු-දේශ අධ්‍යයනයක් දියත් කිරීමේ අවස්ථාවේ දී අරමුණු සහ විශ්ලේෂණ රාමුව පැහැදිලි කළාය, පෙබරවාරි 9.



අප්‍රේල්





ශ්‍රී ලංකාවේ තේ වගා කරන කලාප හතක, චිනම් බදුරලිය, මාතර, ගාල්ල, රත්නපුර, බදුල්ල, නුවරඑළිය සහ මහනුවර යන කලාපවල තේ කර්මාන්ත ශාලා හිමියන්, තේ අපනයනකරුවන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු දිස්ත්‍රික් සමිති සහ පර්යේෂකයින් ඇතුළු තේ කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට 'ශ්‍රී ලංකා තේ' සඳහා වන භූගෝලීය දර්ශක පද්ධතියක් (GI System) ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ ජාතික සම්බන්ධීකාරක ලෙස ඩිලානි හිරිමුතුගොඩගේ මහත්මිය 'ශ්‍රී ලංකාවේ වර්තමාන භූගෝලීය දර්ශක පද්ධතිය' පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදු කළාය.

ජූනි

කෘෂිකර්ම, පෝෂණ හා සෞඛ්‍ය විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද 7 වන වාර්ෂික කෘෂිකර්ම, පෝෂණ සහ සෞඛ්‍ය විද්‍යාපීඨ සතියේ 2022 පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී ප්‍රියංකා ජයවර්ධන මහත්මිය 'ශ්‍රී ලංකාවේ සීනි යොදා රසගන්වන ලද පැණි බීම වර්ග වල අඩංගු පෝෂක ද්‍රව්‍ය ලැයිස්තුව චිත්‍ර ලේබල්වල සඳහන් කිරීම මගින් ඇතිකර තිබෙන බලපෑම' පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කළාය.






විශේෂ අවස්ථා

ජූලි

කෘෂිකර්ම, පෝෂණ හා සෞඛ්‍ය විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද 7 වන වාර්ෂික කෘෂිකර්ම, පෝෂණ සහ සෞඛ්‍ය විද්‍යාපීඨ සතියේ 2022 පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී සුනිමලී මදුරාවල මහත්මිය 'අදහස්, ආයතන, සහ බල ගතිකයන්: ශ්‍රී ලංකාව තුළ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් ප්‍රවර්ධනය කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල සහ නියමයන්හි දේශපාලන ආර්ථිකය' පිළිබඳව පෝස්ටර් ඉදිරිපත් කිරීමක් සිදු කළාය, මාර්ගත.





අගෝස්තු

ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද පැසිෆික් සංවර්ධන පර්යේෂණ වැඩමුළුවේදී ආචාර්ය ලක්මිණී ප්‍රනාන්දු මහත්මිය 'වනාන්තර විළි කිරීම සහ වනාන්තර හායනයවීම හේතුවෙන් සිදුවන විමෝචන අඩුකිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ වැඩසටහන (UNREDD) මගින් පැපුවා නිව්ගිනියාවට ඵලදායී හරිත ප්‍රතිසාධන විසඳුම් සපයා දී තිබේද?' යන මාතෘකාව යටත් පත්‍රිකාවක් ඉදිරිපත් කළාය. සැප්තැම්බර් 27.






සැප්තැම්බර්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද 'ලෝක ආහාර සංවිධානයේ රට සඳහා වැඩසටහන්කරණ රාමුව සකස් කිරීම සඳහා වන ජාතික විශේෂඥයින්ගේ රැස්වීම' අවස්ථාවේ දී ආචාර්ය චිරන්දතී පතිරාජ මහත්මිය කෘෂිකර්මාන්තය, පශු සම්පත් අංශය, ධීවර කර්මාන්තය, වන වගාව සහ පරිසරය සම්බන්ධ ගෝලීය හා ජාතික සන්දර්භ තුළ සිදුවී ඇති සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව කතා කළාය, සැප්තැම්බර් 27.



ඔක්තෝබර්

'අර්බුදයෙන් ප්‍රකෘතිමත් වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙහෙයවීම' යන මාතෘකාව යටතේ පැවති සම්මන්ත්‍රණයක දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022' නැමති වාර්තාව නිකුත් කළේය, ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 25.



නොවැම්බර්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද 'Dissecting the Budget 2023' (2023 අයවැය සියුම්ව විශ්ලේෂණය කිරීම) නැමති සංසදයේ දී ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල සහ ඒවා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමේ හැකියාවෙහි අවශ්‍යතාවය පැහැදිලි කර දුන්නාය, නොවැම්බර් 15.



දෙසැම්බර්

පරිසර අමාත්‍යාංශයේ පැවති 'ජාතික පරිසර ප්‍රතිපත්තිය' සහ 'ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම 2022-2030' එළිදැක්වීමේ උත්සවයේ දී ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව මහතා ශ්‍රී ලංකාවේ 'ජාතික පරිසර ප්‍රතිපත්තියෙහි' වැදගත්කම අවධාරණය කළේය, දෙසැම්බර් 19.



පර්යේෂණ වැඩසටහන



පර්යේෂණ

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රතිපත්ති පසුබිම තුළ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කාර්යභාරය වනුයේ ප්‍රතිපත්තිමය තීරණ සඳහා දැනුවත් වීම පිණිස සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විවිධ ප්‍රතිපත්ති විකල්පවල ගම්‍යමානයන් අවබෝධ කර ගැනීමට උපකාර වීම පිණිස ප්‍රබල විශ්ලේෂණාත්මක සාක්ෂි සපයා දීම වේ. අනෙකුත් සෙසු කරුණු අතර, ප්‍රතිපත්ති අනනුකූලතා, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල දුර්වල රාජ්‍ය සේවා සැපයුම, පුහුණුව හිඟවීම, බලශක්ති පිරිවැය ඉහළ යමින් පැවතීම සහ මූල්‍යය හා ඉඩම් සඳහා ප්‍රවේශ වීමට ඇති බාධාවන් වැනි වර්ධනය කෙරෙහි ඇති තීරණාත්මක අවහිරතා පිළිබඳ දැඩි විශ්ලේෂණයන් සිදු කිරීම අවශ්‍ය වේ. එයට අමතරව, ආදායම සහ ධනය සම්බන්ධයෙන් නිරන්තරව පවතින අසමානතාවයන්, පරිසර හානිය සහ ස්වාභාවික සම්පත් ක්ෂය වීම, වැඩිහිටියන්ගේ සහ අනෙකුත් අවදානම් සහගත ජනගහනයේ යහපැවැත්ම යනාදිය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සිදු කිරීමේ අරමුණ ඇතිව ප්‍රධාන ආර්ථික සංකල්ප, ආකෘති සහ දර්ශක අඛණ්ඩව සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රය මගින් රටෙහි ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්ට අනුව මෙම ගැටළු සහ අනෙකුත් ගැටළු ආමන්ත්‍රණය කරයි. පර්යේෂණ වැඩසටහන මගින් මූලික තේමාත්මක ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර, එතුළින් විවිධ පර්යේෂණ මාතෘකා රාශියක් ගවේෂණය කරනු ලැබේ. පර්යේෂණ ක්‍රියාකාරකම්වලට අදාළ වන ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත සාක්ෂි මත පදනම් වූ සොයාගැනීම් බෙදා හැරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. පර්යේෂණ ප්‍රකාශන පළකිරීම, ප්‍රතිපත්ති යෙදවුම් සපයදීම සඳහා විවිධ කමිටුවලට සහභාගී වීම, අදහස් වේදිකාවලට දායක වීම සහ ප්‍රතිපත්ති සාකච්ඡා සංසදවල නියැළීම හරහා මෙය සිදු කරනු ලැබේ.

1.1 සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය

වර්ධනය වූ අර්බුදයකට පරිපූර්ණ විසඳුමක් සපයාදීම සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති අනුගත කර ගැනීම මගින් විශ්වසනීයත්වය තහවුරු කිරීම දුර්වල වූ ආර්ථිකය ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රධාන ම ප්‍රමුඛතාවයක් වී තිබේ. දශක ගණනාවක් පුරා ආර්ථිකය වැරදි ලෙස කළමනාකරණය කිරීම සහ වසංගතය මගින් ආර්ථිකයට ඇතිවූ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ දිගු කාලයක් පුරා පවතින ඉහළ උද්ධමනය ආමන්ත්‍රණය කිරීම සඳහා වෙළඳ සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ඇතුළු රාජ්‍ය මූල්‍ය මෙවලම් කට්ටලය වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. රාජ්‍ය අංශය (රාජ්‍ය ආයෝජන, රාජ්‍ය ව්‍යවසාය) විසින් භාවිතා කරනු ලබන සම්පත්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, ආර්ථික දිරිගැන්වීම් (වෙළඳ ප්‍රතිසංස්කරණ, කෘෂිකර්මාන්තයේ මිල පද්ධති, විදුලිය වැනි රාජ්‍ය උපයෝගිතා) වැඩිදියුණු කිරීම සහ ආයතනික කාර්යක්ෂමතාවය (රේගුව, බදු පරිපාලනය) වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ආර්ථික ප්‍රතිපත්ති තිරසාර වර්ධන උත්සාහයන් දිරිගන්වන ප්‍රධාන ප්‍රේරකයන් වේ. 2022 වර්ෂයේ දී සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන මගින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී:

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන '**ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022**' නැමති වාර්තාව මගින් කොවිඩ්-19 වසංගතය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ සමාජ-ආර්ථික බිඳවැටීම් හමුවේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී මුහුණ දීමට සිදුවන ගෝලීය අභියෝග සහ ශ්‍රී ලංකාව අත්කරගෙන ඇති ප්‍රගතිය විමසා බලයි. එමෙන් ම මෙම වාර්තාව මගින් දේශීය හා විදේශීය ප්‍රතිපත්ති තත්ත්වයන් හමුවේ වර්ධනය සහ සංවර්ධනය පිළිබඳ රටේ පුළුල් ආර්ථික ඉදිරි දැක්ම සම්බන්ධයෙන් ඇගයීමක් ද සිදු කරයි. **ආර්ථික අර්බුද සහ ප්‍රතිසාධනය සඳහා වන ප්‍රතිපත්ති ගැළපීම්** පිළිබඳව සාකච්ඡා කරන එම වාර්තාවේ ප්‍රධාන පරිච්ඡේදයක දී දුෂ්නි වීරකෝන් මහත්මිය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සන්දර්භය විශ්ලේෂණය කරන අතර, ආයෝජකයින්ගේ විශ්වාසය නැවත දිනා ගැනීමේ වැදගත්කම අවධාරණය කරමින් සාර්ව ආර්ථික-ස්ථායීකරණ ප්‍රයත්න සහ රටේ ණය අයකර ගැනීම පහසු කිරීම පිණිස හා උග්‍ර ද්‍රවශීලතා අවහිරයන් මගහරවා ගැනීම පිණිස මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ගැළපීම් සිදු කරන ලෙස ඉල්ලා සිටියි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද, **තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා අරමුදල් යෙදවීමේ පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය ආයෝජන** පිළිබඳ අධ්‍යයනය මගින් තිරසාර සංවර්ධන ඉලක්කවල අර්ථවත් ප්‍රගතියක් අත්කරගැනීම සඳහා අවශ්‍ය කරන වාර්ෂික ආයෝජනය ඇස්තමේන්තු කළ අතර, රාජ්‍ය ආයෝජන භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ යෝජනා කරන ලදී. මෙම අධ්‍යයනය මගින් අරමුදල් රැස්කිරීමේ අභියෝග ජය ගැනීම, තිරසාර සංවර්ධන අංශ වෙත ආයෝජන යොමු කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීමෙහි ධනාත්මක බලපෑම් උපරිම කිරීම සඳහා ප්‍රතිපත්ති උපදෙස් ද සපයා දෙන ලදී.

නවදිල්ලියේ 'රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම්ස්' නැමති පර්යේෂණ ආයතනය සමග එක්ව '**බාධාකාරී යුගයක ශ්‍රී ලංකාවේ වර්ධන සහ සංවර්ධන අභියෝග**' පිළිබඳව සිදු කරන ලද තවත් අධ්‍යයනයක් මගින් නිරපේක්ෂ දරිද්‍රතාවය, අසමානාත්මතාවය සහ දුර්වල සේවානියුක්ති වර්ධනය අවධාරණය කළ කොවිඩ්-19 වසංගතයේ බලපෑම විමර්ශනය කරන ලදී. දකුණු ආසියානු රටවල් සමාජ සංවර්ධනය අතින් පසුගාමීව පවතින බැවින් සහ තිරසාර සංවර්ධන ඉලක්ක පරාමිතීන්හි සන්දර්භය තුළ දුර්වලව පිහිටා ඇති බැවින්, 'දකුණු ආසියා සංවර්ධන සහ සහයෝගිතා වාර්තාව' මගින් කලාපයේ මෙම පොදු ගැටළු ගවේෂණය කිරීම සඳහා රටවල අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමකට අනුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමග එක්ව **ශ්‍රී ලංකාව: ජාතික ප්‍රතිපත්ති** රාමුව පිළිබඳ තවත් වාර්තාවක් සම්පාදනය කිරීමට කටයුතු කරමින් සිටින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට ඉලක්ක කරයි. මෙය ආසන්න-කාලීන සාර්ව ආර්ථික ස්ථායීකරණයක් අත්කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවලට උපකාරී වන අතර, මධ්‍ය කාලීන සිට දීර්ඝ කාලීනව ප්‍රකෘතිමත් වීම සඳහා සහ තිරසාර වර්ධනයක්

අත්කර ගැනීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ පිළිබඳ සවිස්තර තොරතුරු සපයා දෙනු ඇත. ලෝක බැංකුව සමග එක්ව **ශ්‍රී ලංකාවේ අසමානාත්මතාවය සහ දරිද්‍රතාවය කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ බලපෑම ඇස්තමේන්තු කිරීම** පිළිබඳව සිදුකරනු ලබන තවත් අධ්‍යයනයක් මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු සහ පවරාදීමේ වැඩසටහන් පැවතීම පිළිබඳව ඇගයීමක් සිදු කරනු ලබන අතර වීවා රටේ මූල්‍ය ප්‍රතිපත්තියට බලපා ඇති ආකාරය පරීක්ෂා කරයි. මෙම අධ්‍යයනය සඳහා ටියුලේන් විශ්ව විද්‍යාලයේ 'කමිට්මන්ට් ටු ඉක්විටි ආයතනය' විසින් සකස් කරන ලද ක්‍රමවේදය යොදා ගනු ලබන අතර 2019 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණයේ දත්ත භාවිතා කරනු ලැබේ.

පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂයේ දී ද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'ලෝක ආර්ථික සංසදය' විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දර්ශකය සකස් කිරීම සඳහා දායක වන ප්‍රතිපත්ති විශ්ලේෂණයක් සපයා දීමෙන් සහ විධායක මත විමසුමකට පහසුකම් සැලසීමෙන් **ගෝලීය තරඟකාරිත්වය පිළිබඳ වාර්තාව** සඳහා දායකත්වය ලබා දුන්නේය. මෙම වාර්තාව මගින් රටක ආර්ථික ඵලදායිතාවයට බලපාන ආයතන ප්‍රතිපත්ති සහ අනෙකුත් සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික මූලධර්ම වැනි මූලිකාංග පිළිබඳ ගැඹුරු තක්සේරුවක් සපයා දෙයි. එය විචල්‍යයන් 110 ට අධික සංඛ්‍යාවකින් සමන්විත වන අතර, වීවායින් තුනෙන් දෙකක් ම වීවායෙහි අදාළ රටවල ව්‍යාපාර නායකයින්ගේ නියෝජිත නියැදියක් පිළිබඳ සමීක්ෂණයකින් සමන්විත වන විධායක මත විමසුමකින් සකස් කරගනු ලැබේ.

■ ප්‍රතිපත්ති කමිටු:

- ආර්ථික ස්ථායීකරණය, ප්‍රතිසාධනය සහ වර්ධනය ඉහළ නැංවීම පිළිබඳ කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ජාතික ආර්ථික සභාවේ උපදේශක කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය, (2022 අප්‍රේල්-ජූලි).
- රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
- දුම්කොළ සහ මධ්‍යසාර සඳහා බදු සූත්‍රය සකස් කිරීම පිළිබඳ අනු කමිටුව, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය.
- සමාජ විද්‍යාව පිළිබඳ ක්‍රියාකාරී කමිටුව, ජාතික විද්‍යා පදනම.
- පර්යේෂණ අධීක්ෂණ කමිටුව, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය.

■ අදහස් වේදිකා:

- **ශ්‍රී ලංකාවේ ස්වෛරී විදේශ ණය: ප්‍රතිව්‍යුහගත කළ යුතුද, නැත්ද?**, දුෂ්නි වීරකෝන්, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 12 සහ ෆයිනෑන්ෂල් ටයිම්ස්, ඩේලි මිරර්, ද මෝර්නිං, සිලෝන් ටුඩේ, ද අයිලන්ඩ් සහ 'ලංකා බිස්නස් ඔන්ලයින්' පුවත්පවල පළ කරන ලද පුවත්පත් / මාධ්‍ය නිවේදන.
- **මුදල් මණ්ඩලය: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට විසඳුමක්?** අසංක විජේසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 31 සහ ඩේලි මිරර්, ද අයිලන්ඩ් සහ සන්ඩේ ඔබ්සර්වර් පුවත්පවත්වල පළ කරන ලද මාධ්‍ය නිවේදනය.
- **ආර්ථික අවශ්‍යතා පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව,** අසංක විජේසිංහ, ජූනි 6, TV1 රූපවාහිනී නාලිකාවේ 'ද පීපල්ස් ප්ලැට්ෆෝර්ම්' වැඩසටහන.



- **ශ්‍රී ලංකාවේ පාලනය කළ නොහැකි උද්ධමනය සහ මුදල් ප්‍රතිපත්තියේ සීමාවන්,** දුෂ්නි වීරකෝන්, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 27, සහ ඩේලි මිරර්, ද මෝර්නිං, සිලෝන් ටුඩේ, ද අයිලන්ඩ්, අද දෙරණ සහ ලංකා බිස්නස් ඔන්ලයින් පුවත්පත්වල පළ කළ පුවත්පත් / මාධ්‍ය නිවේදන.
- **ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් පුරා පවතින ඉහළ උද්ධමනය? අවදානම් සහ ප්‍රතිපත්ති ප්‍රතිචාර,** බිනුර සෙනෙවිරත්න, ටෝකිං ඉකොනොමික්ස්, අගෝස්තු 10, සහ ඩේලි මිරර්, ද අයිලන්ඩ්, සන්ඩේ ඔබ්සර්වර් සහ සන්ඩේ ටයිම්ස් පුවත්පත්වල පළවූ මාධ්‍ය නිවේදන.
- **ශ්‍රී ලංකාව සඳහා රාජ්‍ය මූල්‍ය සහාවක්: රාජ්‍ය මූල්‍ය පිළිබඳ විශ්වසනීයත්වය නැවත ලබා ගැනීමේ මාවත,** ලක්මිණී ප්‍රනාන්දු, ටෝකිං ඉකොනොමික්ස්, අගෝස්තු 29, සහ ඩේලි මිරර්, ඩේලි නිවුස්, සන්ඩේ ඔබ්සර්වර් සහ සන්ඩේ ටයිම්ස් පුවත්පත්වල පළවූ මාධ්‍ය නිවේදන.

■ පර්යේෂණ ප්‍රකාශන:

- **ශ්‍රී ලංකාව අවදානමේ,** දුෂ්නි වීරකෝන්, ෆොරින් එෆෙයර්ස්, විදේශ සබඳතා පිළිබඳ සභාව, 2022 අප්‍රේල්.
- නීත්‍යානුකූලභාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ අර්බුදය, දුෂ්නි වීරකෝන්, ඊස්ට් ඒෂියා ෆෝරම්, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය, ජූලි 2022.



EASTASIAFORUM

Economics, Politics and Public Policy in East Asia and the Pacific

Home Topics COVID-19 Countries Contributors Quarterly About

Sri Lanka's crisis of legitimacy

16 July 2022

Author: Dushni Weerakoon, IPS

Sri Lanka's slide into political instability since April 2022 culminated in the resignation of former president Gotabaya Rajapaksa following public protests on 9 July 2022. The government's policy blunders and resistance to course correction were blamed for unleashing the harshest economic crisis on the Sri Lankan population in recent history. The former president's resignation paves the way for the formation of an interim all-party government.

Gotabaya Rajapaksa leaves behind an economy ravaged by shortages of essential goods, spiralling inflation and a historical-first debt default. Much of the blame for this sorry state of affairs can be placed on policy hubris.

The election-driven tax cuts and the stubborn resistance to reverse them were economically disastrous as COVID-19 pandemic-related spending pressures mounted. The central bank was made complicit in a money printing exercise that drained investors' faith in the currency — which lost more than 80 per cent of its value. This was coupled with an overly ambitious pursuit of environmental goals namely the banning of chemical fertilisers which devastated agricultural output in the process.

- **ශ්‍රී ලංකාව: ආර්ථිකය.** දුෂ්නි වීරකෝන්. යුරෝපා ප්‍රකාශනවල (සංස්කරණය) 'සවුත් ඒසියා 2023', රූට්ලෙජ්, ටේලර් සහ ෆ්‍රැන්සිස්, 2022.
- කැලරි පරිභෝජන කාර්යක්ෂමතාව සහ ආනයන මත යැපීම: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂි, අසංක විජේසිංහ සහ තිලනි කෞශල්‍යා, ආර්ථික විශ්ලේෂණය සහ ප්‍රතිපත්ති, 76 වෙනි වෙළුම, පිටු 420 - 438, 2022.
- බහුජාතික සමාගම් බදු ගෙවීමෙන් වැළකී සිටීමේ උපාය මාර්ග: ඇපල් සංස්ථාපිත සමාගම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්, උෂා පෙරේරා, ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 9(1), පි. 71-87, 2022.


■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- **ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වය** විසින් සංවිධානය කරන ලද ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වය පිළිබඳ **විද්වත් මණ්ඩල සාකච්ඡාවේ සාමාජිකයෙකු ලෙස 'දකුණ විසින් මෙහෙයවනු ලබන සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග'** පිළිබඳව ක්‍රියාකාරී විද්වත් මණ්ඩල සාකච්ඡාවක් ඉල්ලා සිටියි, ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වය, පෙබරවාරි 11, (නිශා අරුණතිලක).





- CT CLSA විසින් සංවිධානය කරන ලද, CT CLSA ආයතනයේ **'ජාත්‍යන්තර මූල්‍ය අරමුදල: ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙල'** නැමති අතථ්‍ය ආයෝජක වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්තු 23, (දුෂ්නි වීරකෝන්).
- ලන්ඩන් ආර්ථික විද්‍යා පාසලේ දකුණු ආසියා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද, **'දකුණු ආසියාවේ විපත්තිකර ආර්ථික විද්‍යාව, විදේශ ආයෝජන සහ ණය'** පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක විද්වත් මණ්ඩල සාමාජික, මැයි 12, (දුෂ්නි වීරකෝන්).



- මොනෑෂ් විශ්වවිද්‍යාලයේ සංවර්ධන ආර්ථිකවිද්‍යාව හා තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන අර්බුදය: අභියෝග සහ අනාගත අපේක්ෂා', පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයක දී **'ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය'** පිළිබඳ ඉදිරිපත් කිරීම, මැයි 24 (දුෂ්නි වීරකෝන්)
- ඩබ්ලින් සිටි විශ්වවිද්‍යාලයේ, අයර්ලන්ත ඉන්දියා ආයතනය විසින් සංවිධානය කරන ලද **ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන අර්බුදය** පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණයේ විද්වත් මණ්ඩල සාමාජික, මැයි 26, (දුෂ්නි වීරකෝන්)

- හොංකොං විදේශ වාර්තාකරුවන්ගේ සමාජය විසින් සංවිධානය කරන ලද, **'ක්ලබ් ඔන්ලයින් සූම් ඉවෙන්ට්: අර්බුදයට පත් ශ්‍රී ලංකාව'** වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික, ජුනි 01 (දුෂ්නි වීරකෝන්).



- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 'ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ වාර්ෂික සමුළුව - 2022' අවස්ථාවේ දී **ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන අර්බුදවලට මුහුණ දීම පිළිබඳ ආර්ථික සංසදය: පරිවර්තනය සඳහා ප්‍රමුඛතා** යන මාතෘකාව යටතේ පැවති සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, අගෝස්තු 26 (දුෂ්නි වීරකෝන්).




- **'පවතින කැළඹීම් මධ්‍යයේ ශ්‍රී ලංකාවට ආයෝජන දිනාගැනීම සඳහා තරඟ කළ හැක්කේ කෙසේද: ආර්ථික වර්ධනය සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය'** පිළිබඳ පැවති මාර්ගගත සම්මන්ත්‍රණයේ විද්වත් මණ්ඩල සාමාජික, ලංකා වාණිජ මණ්ඩලය, සැප්තැම්බර් 01 (දුෂ්නි වීරකෝන්).





- පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද **ආසියානු ආර්ථික සම්මන්ත්‍රණය** නැමති මාර්ගගත සම්මන්ත්‍රණයේ ආරාධිත දේශක, සැප්තැම්බර් 20 (අසංක විජේසිංහ).
- 'තිරසාර සංවර්ධනය පිළිබඳ 10 වැනි වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී' **තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා අරමුදල් සැපයීමේ හිදැස පියවා ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයෝජන** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, සැප්තැම්බර් 20, (ලක්මිණි ප්‍රනාන්දු).
- **ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022** වාර්තාව නිකුත් කිරීමේ අවස්ථාවේ දී **'ආර්ථික අර්බුද සහ ස්ථාවරවීම සඳහා ප්‍රතිපත්ති ගැළපීම්** පිළිබඳ ඉදිරිපත් කිරීම:, ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 25 (දුෂ්නි වීරකෝන්).
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද **2023 අයවැය සියුම්ව විශ්ලේෂණය කිරීම** නැමති සංසදයේ විද්වත් මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා මහ බැංකු ශ්‍රවණාගාරය, නොවැම්බර් 15 (දුෂ්නි වීරකෝන්).
- කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති ආදි ශිෂ්‍ය සංගමය සහ ඩේලි එෆ්.ටී. පුවත්පත විසින් සංවිධානය කරන ලද **2023 පශ්චාත් අයවැය සංසදයේ** විද්වත් මණ්ඩල සාමාජික, ෂැන්ග්‍රි-ලා, නොවැම්බර් 18 (දුෂ්නි වීරකෝන්)
- නවදිල්ලි නුවර, Carnegie India ආයතනය විසින් සංවිධානය කරන ලද **'ඩිජිටල් අනන්‍යතා: ඩිජිටල් සමාජයක් සඳහා පදනම් තාක්ෂණයන්'** පිළිබඳ සැසියක විද්වත් මණ්ඩල සාමාජික, නොවැම්බර් 29 - දෙසැම්බර් 01 (දුෂ්නි වීරකෝන්).





- ප්‍රතිපත්ති සංවාද මධ්‍යස්ථානය සහ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානය විසින් සංවිධානය කරන ලද 'බහුපාර්ශ්වික සංවර්ධන මූල්‍යය: දකුණු ආසියාවේ අන්තර්කරණය වූ සහ තිරසාර ප්‍රතිසාධනයකට සහාය වීම' යන මාතෘකාව යටතේ පැවති සමුළුවක දී **'බහුපාර්ශ්වික සංවර්ධන මූල්‍යය: ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ සහ තිරසාර ප්‍රතිසාධනයකට සහාය වීම'** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, දෙසැම්බර් 02 (නිශා අරුණතිලක).

වෙළඳ සහ කලාපීය ඒකාබද්ධතාවය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රී ලංකාව සහ තෝරාගත් රටවල් අතර අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම් පිළිබඳ පුරෝකථන පදනම්කරගත් ආර්ථික ඇගයීම** පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය මගින් විභව අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම් බලපෑම් තක්සේරුවක් පිළිබඳ විස්තීර්ණ ආර්ථික විශ්ලේෂණයක් සිදු කරයි. ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම් මගින් ඇතිවිය හැකි අහිතකර බලපෑම් සමනයකර ගනිමින් ප්‍රතිලාභ උපරිම කර ගැනීමට අවශ්‍ය ගැළපුම් ප්‍රතිපත්ති සකස් කළ යුතු බැවින් මෙය ශ්‍රී ලංකාවට අතිශය වැදගත් වේ. චීනය, තායිලන්තය, ඉන්දියාව, ජපානය සහ සිංගප්පූරුව සමග ශ්‍රී ලංකාව ඇතිකරගෙන තිබෙන අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම්වලින් අතිවිය හැකි බලපෑම පිළිබඳ පුරෝකථන පදනම් කර ගත් තක්සේරුවක් සිදු කිරීම සහ විවිධ රටවල් සමග අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම්වල ශක්‍යතාව මැන බැලීම සඳහා දර්ශකයක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද, **GSP+ පහසුකම ඉවත් කර ගැනීම ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමයේ රටවලට සිදුකරන අපනයන කෙරෙහි ඇතිකරන බලපෑම** පිළිබඳ තවත් අධ්‍යයනයක් මගින් ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කරන අපනයන සඳහා ඇති අනුග්‍රහය අහිමිවීමේ බලපෑම පුරෝකථන පදනම්කරගෙන විශ්ලේෂණය කරනු ලැබේ. එයට අමතරව, බහු-දේශ දත්ත කට්ටලයක් භාවිතා කරමින්, අපනයන සහ ගෝලීය වටිනාකම් දාමයට සහභාගීවීම කෙරෙහි ඊජ වෙළඳ වැඩපිළිවෙළ මගින් ඇතිකරන බලපෑම තක්සේරු කිරීම සඳහා තථ්‍ය ප්‍රතිඵල පදනම් කරගත් ඇගයීමක් සිදු කරනු ලැබේ.

ඒ හා සමානව ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරනු ලබන, **ශ්‍රී ලංකාවේ අපනයන සහ ආර්ථිකය කෙරෙහි ආනයන පාලනය මගින් ඇතිකරන බලපෑම** පිළිබඳ අධ්‍යයනය මගින් ආනයන පාලනවල ප්‍රමාණය සහ ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය කෙරෙහි එහි ආවරණය සහ බලපෑම විමර්ශනය කරන ලදී. එමෙන් ම, එමගින් ආදාන-ප්‍රතිදාන සම්බන්ධක මගින් දේශීය ආර්ථිකයට ඇති බලපෑම ද ඇස්තමේන්තු කරන ලදී. මෙම අධ්‍යයනය මගින් සිරස්ව ඒකාබද්ධවී ඇති නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ දේශීය නිෂ්පාදනයට අහිතකර ලෙස බලපා ඇති සීමිත යෙදවුම් සැපයුම පිළිබඳ ගැටළු සහ දේශීය වශයෙන් අතරමැදි භාණ්ඩවල මිල ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

ආසියා පදනම සමග එක්ව සිදු කරනු ලබන '**චීනයේ එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන**' පිළිබඳ අධ්‍යයනය මගින් මතු සඳහන් අංශ දෙක කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ: (අ) 'එක් තීරයක් - එක් මාවතක්' වැඩසටහන යටතේ චීනයේ අරමුදල් සැපයීම මත ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ නවතම වර්ධනයන් සහ අදාළ ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ සමාලෝචනය කිරීම; සහ (ආ) 'එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන' යටතේ ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන, තෝරාගත් ආයෝජන හේතුවෙන් බලපෑමට ලක් වී ඇති දේශීය ප්‍රජාවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් පිළිබඳ සමීක්ෂණයක් සැලසුම් කිරීම.

'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022' නැමති වාර්තාවේ '**ගෝලීය ආර්ථික වර්ධනයන් සහ ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිකරන බලපෑම්**' පිළිබඳ පරිච්ඡේදයක දී බිනුර සෙනෙවිරත්න, 2022 පෙබරවාරි මාසයේ දී රුසියා - යුක්‍රේන යුද්ධය ආරම්භවීමත් සමග ගෝලීය ආර්ථික අපේක්ෂාවන්, ගෝලීය වෙළඳාම සහ භාණ්ඩ මිල ගණන්, සහ ශ්‍රී ලංකාවේ බාහිර පරිසර තත්ත්වයන්හි වර්ධනයන් කෙරෙහි ඇතිවී තිබෙන බලපෑම් විශ්ලේෂණය කරයි. මෙම පරිච්ඡේදය මගින් රසායනික පොහොර ආනයනය සහ භාවිතය තහනම් කිරීමේ අදූරදර්ශී ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් වඩාත් සංකීර්ණ වූ ආහාර හිඟය, ඉන්ධන හිඟය සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟය නොවැළැක්විය හැකි ලෙස නිර්මාණය වීමට හේතු වූ විනිමය සහ ආනයන සීමාවන්හි ඇඟවීම් අවධාරණය කරයි. **දේශගුණික විපර්යාස තත්ත්වයන් යටතේ වෙළඳාම සහ තිරසාර සංවර්ධනය** පිළිබඳ තවත් පරිච්ඡේදයක දී, අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා වෙළඳ ප්‍රතිපත්ති කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම්, දරිද්‍රතාවය සහ නිෂ්පාදක ගැති වෙළඳ ප්‍රතිපත්ති පක්ෂග්‍රාහීත්වයන් තුරන් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරති.

■ අදහස් වේදිකා:


- **බංග්ලාදේශය - ශ්‍රී ලංකා අනුග්‍රහපූර්වක වෙළඳ ගිවිසුම: වාසි සහ ප්‍රතිපත්ති අභියෝග,** අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 20 සහ ඩේලි මිරර්, ද මෝර්නිං, සන්ඩේ ඔබ්සර්වර්, ද අයිලන්ඩ් සහ අද දෙරණ හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **රුසියා-යුක්රේන ගැටුම: ශ්‍රී ලංකාව සඳහා ඇති ආර්ථික ඇඟවීම්,** අසංක විජේසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 28 සහ ෆයිනෑන්ෂල් ටයිම්ස්, ඩේලි මිරර්, ද අයිලන්ඩ්, අද දෙරණ සහ ලංකා බිස්නස් ඔන්ලයින් හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **ගෝලීය තෙල් මිලෙහි අස්ථාවරත්වය: ශ්‍රී ලංකාවට එයට මුහුණ දිය හැක්කේ කෙසේද?** බිනුර සෙනෙවිරත්න, ටෝකිං ඉකොනොමික්ස්, ජුනි 1, සහ ද අයිලන්ඩ් පුවත්පතෙහි පළවූ මාධ්‍ය නිවේදනය.

- **ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදය: ආනයනවල කාර්යභාරය කුමක්ද?** අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා, ටෝකිං ඉකොනොමික්ස්, ජුනි 29, සහ ඩේලි මිරර්, ද මෝනිං, ද අයිලන්ඩ් සහ සන්ඩේ ඔබ්සර්වර් පුවත්පත්වල පළවූ මාධ්‍ය නිවේදන.


■ පර්යේෂණ ප්‍රකාශන:



- **දකුණු ආසියානු රටවල් ගෝලීය වටිනාකම් දාමවලට සහභාගීවීම කෙරෙහි වෙළඳ ප්‍රතිපත්තිවල බලපෑම,** අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා, එෂියන් ඉකොනොමික් ඉන්ටිග්‍රේෂන් සඟරාව, 4(1), SAGE ප්‍රකාශන, 2022.

- **දකුණු ආසියානු රටවල් ගෝලීය වටිනාකම් දාමවලට සහභාගීවීම කෙරෙහි වෙළඳ ප්‍රතිපත්තිවල බලපෑම: බංග්ලාදේශ - ශ්‍රී ලංකා වෙළඳ සාකච්ඡා සඳහා ඇති ඇඟවීම්,** අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා, ජාත්‍යන්තර ආර්ථික පර්යේෂණ මාලා අංක 14, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2022.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:



- වොෂින්ටන් ඩී.සී. හි පිහිටි **ආසියා පැසිෆික් උපායමාර්ග මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද චීනයේ එක් තීරයක් - එක් මාවතක්** වැඩසටහන පිළිබඳ ආසියා පැසිෆික් සමුද්‍රීය ආරක්ෂක වටමේස සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, පෙබරවාරි 14, (අසංක විජේසිංහ).

- 13 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවේ සමාරම්භක සැසිවාරයේ දේශක සහ නවදිල්ලියේ රිසර්ච් ඇන්ඩ් ඉන්ෆෝර්මේෂන් සිස්ටම් විසින් සංවිධානය කරන ලද **පශ්චාත් වසංගත සමයේ සංවර්ධන අවශ්‍යතා:** කලාපීය සහයෝගීතාවය සඳහා වන ගැටළු පිළිබඳ පූර්ණ සහභාගීත්වය සහිත සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, නවදිල්ලිය, අප්‍රේල් 19 සහ 20, (දුෂ්නි වීරකෝන්).



- ඇඩ්වොකාටා පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද, 'ශ්‍රී ලංකාව යථාවත් කිරීම' නැමති සමුළුවේ **ණය අර්බුදය, ව්‍යුහාත්මක ගැළපීම සහ වෙළඳ ප්‍රතිපත්ති** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, අගෝස්තු 6, (අසංක විජේසිංහ).

- නවදිල්ලියේ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද **'දකුණු ආසියාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර සඳහා වියදම් දැරීමට ඇති හැකියාව'** පිළිබඳ සම්මන්ත්‍රණයේ දී "බහුවිධ අංශ ඇතුළත් මාර්ග: රජයේ කාර්යභාරය, සාර්ව ආර්ථික විද්‍යාව සහ වෙළඳ ප්‍රතිපත්ති" යන මාතෘකාව යටතේ පැවති සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, නවදිල්ලිය, දෙසැම්බර් 15 සහ 16, (දුෂ්නි වීරකෝන්).

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ ව්‍යවසායකත්වය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද **ශ්‍රී ලංකාවේ පාම් ඔයිල් කර්මාන්තය: ආර්ථික විශ්ලේෂණයක්,** නැමති අධ්‍යයනය මගින් පාම් ඔයිල් කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති තීරණ සහ ඒ පිළිබඳ වැරදි අවබෝධයන් නැවත විමසා බලන ලද අතර, එය ප්‍රතිපත්ති නිර්දේශ සඳහා සහ මහජනයා දැනුවත් කිරීම සඳහා වන මාර්ගෝපදේශයක් විය. ආහාරයට ගත හැකි තෙල් ආනයනය සඳහා ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගත් රජය, ආනයන ආදේශන උපාය මාර්ගයක් ලෙස අසාරවත් ඉඩම් හෙක්ටයාර් 12,000 ක පාම් ඔයිල් ශාක වගාව ප්‍රවර්ධනය කළේය. කෙසේ වෙතත්, මෙම විදේශීය හෝගය වගා කිරීමේ පාරිසරික පිරිවැය පිළිබඳ කනස්සලු වර්ධනය වීම සහ පාම් ඔයිල් පරිභෝජනය පිළිබඳ අපැහැදිලි සෞඛ්‍ය ගැටළු පිළිබඳ අවධානයන් ඉහළ යාම හේතුවෙන් මෙම තීරණය අහෝසි කරන ලදී. එබැවින් මෙම අධ්‍යයනය ඉහත සඳහන් කළ සන්දර්භය තුළ පවතින ගැටලු ආමන්ත්‍රණය කළේය.

■ ප්‍රතිපත්ති කමිටු

- කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා වන මෙහෙයුම් කමිටුව, කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශය.

බුද්ධිමය දේපළ

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ප්‍රංශ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය (CIRAD) සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා තේ සඳහා ඵලදායී භූගෝලීය දර්ශක (GI) පද්ධතියක් සකස්කර ක්‍රියාත්මක කිරීම පිණිස **ශ්‍රී ලංකා තේ සඳහා භූගෝලීය දර්ශක (GI) ලියාපදිංචිය කඩිනම් කිරීම සඳහා සිතියම්කරණ අධ්‍යයනයක** නිරතවී සිටින අතර, වසර 31/2 ක එම ව්‍යාපෘතියේ පළමු අදියර 2022 වර්ෂයේ දී සාර්ථකව නිම කරන ලදී. ශ්‍රී ලංකා තේ සඳහා ඵලදායී භූගෝලීය දර්ශක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා ශ්‍රී ලංකා තේ අගය දාමය පුරා ඇති සුවිශේෂී පරිචයන් සහ පද්ධතිමය බාධාවන් සිතියම්ගත කිරීම එහි අරමුණ විය. එමෙන් ම, මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා තේ සඳහා අදාළ සහතිකකරණ පද්ධති ද සකස් කරනු ලබන අතර, භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා මේවා ලේඛනගත කරනු ලැබේ. එම පද්ධති සකස් කිරීම මගින් ශ්‍රී ලංකා තේ අගය දාමය පුරා අන්තර්කරණය වූ සහ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා දැනට පවතින පාරිසරික, සමාජීය සහ පාලන අංශයන් ශක්තිමත් කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ප්‍රංශ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය (CIRAD) එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග එක්ව සිදු කරන ලද **ජාතික අගය දාම සංවර්ධනය, සොයා ගැනීම් සහ අලෙවිකරණය** පිළිබඳ අධ්‍යයනය මගින් භූගෝලීය දර්ශක සඳහා ලියාපදිංචිය පදනම් කරගත් අනන්‍ය ජාතික පද්ධතියක් ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝග සඳහා භූගෝලීය දර්ශක ක්‍රමය හඳුන්වා දීම පිණිස මෙම අධ්‍යයනය මගින් නියමු ව්‍යාපෘති දෙකක් (කොලොන්න කළු ගම්මිරිස් සහ ලංකා රන් අන්නාසි) තෝරා ගන්නා ලදී. තවද, භූගෝලීය දර්ශක අගයදාම නියමු ව්‍යාපෘති දෙක සඳහා මාර්ග සිතියම් ද සකස් කරන ලදී. පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ ප්‍රචාරණ ක්‍රියාකාරකම් ගණනාවක් හරහා ජාතික භූගෝලීය දර්ශක පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා රජයේ සහ අදාළ පාර්ශවකරුවන්ගේ හැකියාවන් ගොඩනැගීමට ද මෙයින් අපේක්ෂා කෙරේ.

■ අදහස් වේදිකා:

- **සාම්ප්‍රදායික කාලගුණ අනාවැකි පිටුපස ඇති විද්‍යාව,** ඩිලානි හිරිමුතුගොඩගේ, විදුරාව විද්‍යා සඟරාව, වෙළුම (39) ජූලි - සැප්තැම්බර් 2022, ජාතික විද්‍යා පදනම.

- **ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ විභවය උපයෝගී කර ගැනීම,** ඩිලානි හිරිමුතුගොඩගේ, ඉන්සයිට්, ඩිවලොප්මන්ට් ඒෂියා (ආසියානු සංවර්ධන බැංකුවේ වැඩසටහනකි), සැප්තැම්බර් 22.

- **ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා භූගෝලීය දර්ශක (GIs): දේශීය ලියාපදිංචිය පුළුල් කිරීමේ අවශ්‍යතාවය,** ඩිලානි හිරිමුතුගොඩගේ සහ පියුමි රසාංගි, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 7 සහ ඩේලි මිරර්, ද මෝර්නිං, ද අයිලන්ඩ්, සන්ඩේ ඔබ්සර්වර් සහ අද දෙරණ හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **ශ්‍රී ලංකාවේ අත්කම් භාණ්ඩ කර්මාන්ත අංශය ආරක්ෂා කිරීම සඳහා භූගෝලීය දර්ශක පද්ධතිය,** ඩිලානි හිරිමුතුගොඩගේ, භූගෝලීය දර්ශක පිළිබඳ ලෝක ව්‍යාප්ත දෘෂ්ටි කෝණයන් පිළිබඳ සම්මන්ත්‍රණයේ කටයුතු, සංවර්ධනය සඳහා කෘෂිකර්ම පර්යේෂණ (CIRAD) සහ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය, ප්‍රංශය: මොන්ට්පෙලියර්.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- සුළු බෝග සංවර්ධන හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදුල 'කොලොන්න ගම්මිරිස් භූගෝලීය දර්ශක සංගමයේ' පළමු වාර්ෂික මහා සභා රැස්වීමේදී **භූගෝලීය දර්ශකවල** (GI) වැදගත්කම පිළිබඳ ඉදිරිපත් කිරීම, පෙබරවාරි 10 (ඩිලානි හිරිමුතුගොඩගේ).



- සුළු බෝග වැවිලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද, **ලංකා රන් අන්නාසි සහ කොලොන්න ගම්මිරිස් සඳහා භූගෝලීය දර්ශක පද්ධතියක් ලබා ගැනීමේ ප්‍රගතිය** පිළිබඳ ජාතික සමුළුවේ දී සිදු කළ ඉදිරිපත් කිරීම, වෝටර්ස් එජ්, බත්තරමුල්ල, පෙබරවාරි 28 (ඩිලානි හිරිමුතුගොඩගේ).



- ජාත්‍යන්තර කෘෂිකර්මාන්ත සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය, Agence Française de Développement ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර, තේ වගා කරන කලාප හතක පවත්වන ලද 'ශ්‍රී ලංකා තේ සඳහා භූගෝලීය දර්ශක පද්ධතියක් ක්‍රියාත්මක කිරීම' පිළිබඳ කලාපීය වැඩමුළුවලදී **ශ්‍රී ලංකාවේ භූගෝලීය පද්ධතිය** පිළිබඳ ඉදිරිපත් කිරීම, නොවැම්බර් 22 - 30, (ඩිලානි හිරිමුතුගොඩගේ).



- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සුළු අපනයන බෝග වැවිලි අංශය විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි, ගම්පහ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද **ශ්‍රී ලංකාවේ භූගෝලීය දර්ශක පද්ධතිය** ස්ථාපනය කිරීම පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩමුළුවේ ආරාධිත දේශක, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සුළු අපනයන බෝග වැවිලි සංවර්ධන අංශය, දෙසැම්බර් 01, (ඩිලානි හිරිමුතුගොඩගේ).





1.2 ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය

පුද්ගලයින් යහපත් ජීවන තත්ත්වයක් සහිත ජීවිත ගත කරමින් ඵලදායී ලෙස ශ්‍රම වෙළඳපොළෙහි නිරත වීමට අවශ්‍ය මානව සම්පත ලබා ගන්නා බව සහතික කිරීම සඳහා යහපත් සෞඛ්‍ය සහ ගුණාත්මක අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැදගත් වේ. කෙසේ වෙතත්, පවතින මූල්‍ය, මානව සහ භෞතික සම්පත් බාධාවන් හමුවේ නව වර්ධනයන් සමග ඉදිරියට යාම සහ සැමට ගුණාත්මක ප්‍රවේශයක් සහතික කිරීම වඩ වඩාත් දුෂ්කර වන බැවින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙත ප්‍රවේශය සපයා දීමේදී දැනට පවතින ආකෘති අභියෝගයට ලක්වී ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මඟින් ශ්‍රමය, සේවා නියුක්තිය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති-දිශානත කරගත් දැනුම් හිදැස් ආමන්ත්‍රණය කිරීම මඟින් මෙම ප්‍රතිපත්ති අභියෝගවලට විසඳුම් සෙවීමේදී රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය වීමට අරමුණු කරයි.

කුසලතා සහ අධ්‍යාපනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද, කොවිඩ්-19 කාලය තුළ පුද්ගලික ඉගැන්වීම සඳහා පැවති ඉල්ලුම: ශ්‍රී ලංකාව පිළිබඳ මූලික විමර්ශනාත්මක ව්‍යායාමයක් පිළිබඳ අධ්‍යයනය 2022 වර්ෂයේ දී නිම කරන ලදී. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පුද්ගලික ඉගැන්වීම් සඳහා ඇති ඉල්ලුමෙහි වර්තමාන ප්‍රවනතා සහ කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිට වීවා වෙනස් වී ඇති ආකාරය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා වූ මූලික විමර්ශනාත්මක ව්‍යායාමයක් විය. එමෙන්ම, මෙම අධ්‍යයනය මඟින් පුද්ගලික ඉගැන්වීම් වෙත තිබෙන ප්‍රවේශය සහ එම ඉගැන්වීම්වල ගුණාත්මකභාවය සම්බන්ධ එකී වෙනස්කම්වල ගම්‍යමානයන්, ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනය සලකා බැලීමේ දී පුද්ගලික ඉගැන්වීම් කර්මාන්තයේ ප්‍රත්‍යක්ෂ භූමිකාවෙහි වෙනස්වීම් සහ එහි ප්‍රක්ෂේපිත අනාගත ගමන් පථය පිළිබඳව ද විමර්ශනය කරන ලදී.

'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022' වාර්තාවෙහි විශ්ව අධ්‍යාපනය සහ විශ්ව සෞඛ්‍ය රූකවරණය උදෙසා යන මාතෘකාව යටතේ ප්‍රියංකා ජයවර්ධන සහ ඌෂා පෙරේරා විසින් රචනා කරන ලද පරිච්ඡේදයක් මඟින් අනෙකුත් සෙසු කරුණු අතර, නිසි වයසේ දී පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකිරීමට හේතු, අධ්‍යාපනයේ සාධාරණාත්වය සහ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ප්‍රධාන සංක්‍රාන්ති අභියෝග හතර සහ විශ්ව සෞඛ්‍ය ආවරණය උදෙසා වන ප්‍රගතිය අත්කර ගැනීම කෙරෙහි වීවායෙහි බලපෑම් අවධාරණය කරමින් සෞඛ්‍යය සහ අධ්‍යාපනය පිළිබඳව පවතින ප්‍රධාන ගැටළු සාකච්ඡා කරයි. මෙහිදී, ගුණාත්මක අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීමෙහි ඇති අසමානතා ආමන්ත්‍රණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති ඇඟවීම් පිළිබඳව කතුවරු අවධාරණය කරති.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සමග එක්ව 'ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්: රට පිළිබඳ අධ්‍යයනයක්' මඟින් සෙයාගත් කරුණු ප්‍රචාරණය කිරීම පිළිබඳ අධ්‍යයන මඟින් 2021/2022 ගෝලීය අධ්‍යාපන නිරීක්ෂණ, දකුණු ආසියානු කලාපයේ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් පිළිබඳ වාර්තාව මඟින් සොයාගත් කරුණු ප්‍රචාරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම වාර්තාව මඟින් අධ්‍යාපනය සපයාදීම, අරමුදල් සැපයීම, නියාමනය, නවෝත්පාදන සහ ප්‍රතිපත්ති බලපෑම් අනුව රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ මානයන් පිළිබඳ අවධානය යොමු කරයි. ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ළඟා වීම පිණිස ප්‍රකාශනය, බෙදා හැරීම සහ සන්නිවේදන ක්‍රියාකාරකම්/අවස්ථා මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට ඇතුළත් වේ.

■ ප්‍රතිපත්ති කමිටු

- **උසස් අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව,** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- **සාමාන්‍ය අධ්‍යාපනය සහ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව,** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- **විද්‍යා හා තාක්ෂණ ආයතනවල කාර්ය සාධන සමාලෝචනය,** ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව.
- **අධ්‍යාපන පර්යේෂණ සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටුව,** අධ්‍යාපන අමාත්‍යාංශය.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- **අධ්‍යාපනයේ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්: ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්,** අශානි අබයසේකර, තිසලි ද සිල්වා සහ නිශා අරුණතිලක, දකුණු ආසියාව සඳහා වන ගෝලීය අධ්‍යාපන අධීක්ෂණ වාර්තාවේ පසුබිම් වාර්තාව, 2022.

■ අදහස් වේදිකා:

- **ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය මධ්‍යයේ පෞද්ගලික ඉගැන්වීම්: ශිෂ්‍යයින් මුහුණ දෙන ගැටළු,** ඌෂා පෙරේරා, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 24, සහ ඩේලි මිරර්, ද අයිලන්ඩ්, සන්ඩේ ඔබ්සර්වර් සහ අද දෙරණ හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **සිසුන් පාසලෙන් ගිලිහීම ඉහළ යාම: ශ්‍රී ලංකාවේ වතුකරයේ දරුවන්ගේ දුක්ඛිත තත්ත්වය,** හිමානි විතානගේ, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 17 සහ ද අයිලන්ඩ් හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදනය.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- **හැකියා ගොඩනැගීමේ, වැඩිදියුණු කිරීමේ සහ අහිමි කිරීමේ අවකාශයක් සහ ස්ථානයක් ලෙස පාසල: අඛණ්ඩව පවතින විවාද සහ වසංගතය මගින් ඇතිකර තිබෙන ගම්‍යමානයන්** පිළිබඳ මානව සංවර්ධන සහ හැකියා සංගමයේ සමුළුව, 2022, අවස්ථාවේ ඉදිරිපත් කිරීම, අන්තර්ජාල, අගෝස්තු 19 (නිශා අරුණතිලක).



- ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන **'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022'** වාර්තාව නිකුත් කිරීම සනිටුහන් කිරීම සඳහා පැවති 'අර්බුදයේ සිට ප්‍රතිසාධනය දක්වා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙහෙයවීම' නැමති සම්මන්ත්‍රණයේ දී **සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 25 (නිශා අරුණතිලක).

සෞඛ්‍යය

චික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනය සහ චික්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානය සමග එක්ව සිදු කරන **ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන - KIVU දුම්කොළ පාලන ව්‍යාප්ති වැඩසටහන** - දිගුව (අදියර I) මගින් ප්‍රතිපත්ති සංවාද සහ තීරණ කෙරෙහි ඇති කෙරෙන ප්‍රත්‍යක්ෂ ලෙස දැකිය හැකි බලපෑම් පිළිබඳ වඩාත් තියුණු අවධානයක් යොමු කිරීමට අරමුණු කරයි. එබැවින්, මෙම සමස්ත ව්‍යාපෘතිය මගින් දුම්කොළ පරිභෝජනය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කරනු ඇති සහ බලපෑමක් ඇති කිරීමේ විභවය සහිත අවස්ථාවල ප්‍රතිපත්ති බලපෑම් සඳහා ඉලක්ක හඳුනා ගැනීමට අරමුණු කරයි. **දේශපාලන ආර්ථික විශ්ලේෂණය - දුම්කොළ ප්‍රතිසංස්කරණ ගැටළු** පිළිබඳ අධ්‍යයනය මගින් දුම්කොළ සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ක්‍රියාකාරීන් හඳුනා ගැනීමට සහ එම ක්‍රියාකාරීන් අතර පවතින බල සම්බන්ධතා අවබෝධ කර ගැනීමට අරමුණු කරයි. **බීඩි සහ දුම් රහිත දුම්කොළ - පරිභෝජනය සහ වෙළඳපොළ විශ්ලේෂණය** පිළිබඳ අධ්‍යයනය මගින් බීඩි පරිභෝජනයේ මිල සහ ආදායම් සංවේදීතාව සහ විවිධ වර්ගවල දුම්කොළ නිෂ්පාදන සඳහා ආදේශකිරීම් ඇගයීමට අරමුණු කරයි.

චික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනය සහ චික්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානය සමග එක්ව සිදු කරන **ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන - KIVU දුම්කොළ පාලන ව්‍යාප්ති වැඩසටහන** - II වන අදියර මගින් සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම්, තෝරාගත් මාධ්‍ය සහ උපාය මාර්ගික සන්නිවේදන ක්‍රියාකාරකම් මගින් ඌනපූරනය කරනු ලබන අභ්‍යන්තර බලපෑම් භාවිතා කරමින් ප්‍රතිපත්ති වෙනස්කම් වෙනුවෙන් පෙනීසිටීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. දුම්කොළ බදු වැඩිකිරීම රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට, ආනයන වියදම් අඩු කිරීමට සහ රාජ්‍ය වියදම් අඩු කිරීමට (සෞඛ්‍යය සඳහා වන වියදම් අඩු කිරීම මගින්) ඉවහල් වන බව සාක්ෂි මගින් පෙන්නුම් කරන බැවින් ඉදිරි වර්ෂය තුළ දුම්වැටි සඳහා දුම්කොළ බදු වැඩිවීමක් ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණුවලට ඇතුළත් වේ. මෙම වැඩසටහනේ II වැනි අදියරේ දී ආරම්භ කරන ලද 'ශ්‍රී ලංකාවේ සිදුවන දුම්කොළ ජාවාරම: විමර්ශනාත්මක අධ්‍යයනයක්' නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සිදුවන දුම්කොළ ජාවාරම පිළිබඳ පුළුල් අවබෝධයක් සපයා දීමට සහ දුම්කොළ

අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය සහ නියෝග සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ජාවාරම් නියාමනය කිරීමේ ඵලදායී ක්‍රම හඳුනා ගැනීමට අරමුණු කරයි. දේශසීමා ආරක්ෂාව දුර්වලව පැවතීම සහ දත්ත සීමා කිරීම් වැනි සන්දර්භ-විශේෂිත ගැටළු හේතුවෙන් තවමත් නිගමනයකට එළඹීමට නොහැකිව පවතින කරුණක් වන, දුම්කොළ නිෂ්පාදන සඳහා වන ඉහළ බදු අනුපාත හේතුවෙන් ජාවාරම් උග්‍ර වෙයි යන තර්කය පිළිබඳව ඇති ගෝලීය අධ්‍යයනයන්හි ඇති හිස්බව ආමන්ත්‍රණය කිරීමට මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරනු ලැබේ.

ඩියුක් විශ්වවිද්‍යාලය/බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම සමග සිදු කරන ලද **සෞඛ්‍ය මූල්‍යයේ උපාය මාර්ගික සැලසුම්කරණය, කාර්යක්ෂමතාව වැඩිදියුණු** කිරීම සහ ප්‍රමුඛත්වය ලබා දීම සඳහා දත්ත සහ දැනුම වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය මූල්‍යකරණ ප්‍රතිපත්ති නියැළීම් ගවේෂණය කිරීමට, ආධාර ලබාදෙන්නන්ගේ සංක්‍රාන්තිය සඳහා රට සුදානම් කර ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ න්‍යාය පත්‍රයේ ඉහළින් ම තිබිය යුතු ප්‍රතිපත්ති ගැටලු හඳුනා ගැනීමට සහ සංක්‍රාන්තිය සම්බන්ධීකරණය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය අතර තවත් සම්බන්ධක ගොඩනැගීම. ඩියුක් විශ්ව විද්‍යාලයේ ගෝලීය සෞඛ්‍යය කෙරෙහි ප්‍රතිපත්ති බලපෑම පිළිබඳ මධ්‍යස්ථානය (CPIGH) විසින් සකස් කරන ලද 'දැනුම, ධාරිතාවය සහ ප්‍රතිපත්ති හිඩැස් රාමුව' පදනම් කරගත් මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය මූල්‍යකරණයේ ඇති විශේෂිත හිඩැස් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීමටත්, එම හිඩැස් වසාදැමීමට උපකාරී වන ප්‍රතිපත්ති විසඳුම් සකස් කිරීමට සහාය වීමටත්, සාක්ෂි-ප්‍රතිපත්ති පරිවර්තනයෙහි නිරත වීමටත් උපකාරී වනු ඇත.

කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය සමග එක්ව සිදු කරන **ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන් ශක්තිමත් කිරීම** පිළිබඳ අධ්‍යයනය මගින් සෞඛ්‍යයට අහිතකර ආහාර පුරුදු අඩු කිරීම සඳහා මෑතකදී හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය සහ නියාමන මැදිහත්වීම් දෙකක (එනම්, සීනි යොදා රසගන්වන ලද පැණි බීම වර්ග මත බද්දක් පැනවීමෙහි සහ එම බීම වර්ගවල සීනි මට්ටම පෙන්නුම් කරන, අඩංගු පෝෂක ද්‍රව්‍ය ලැයිස්තුව ලේබලයේ සඳහන් කිරීමේ ක්‍රමවේදයෙහි) ඵලදායීත්වය විමසා බලනු ලැබේ. එමෙන්ම, මෙම අධ්‍යයනය මගින් කොළඹ අවට තෝරාගත් ස්ථානවල අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙන ආහාර පරිසරයට කොවිඩ්-19 වසංගතය බලපා ඇති ආකාරය ගවේෂණය කර බලන අතර, එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි හිඩැස් සහ එම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සඵලතාවය තක්සේරු කරයි. එපමණක් නොව, මෙම අධ්‍යයනය මගින් සීනි යොදා රසගන්වන ලද පැහිබීම වර්ග මත බද්දක් පැනවීමෙහි දේශපාලන ආර්ථික පසුබිම, සීනි යොදා රසගන්වන ලද පැණිබීමවල අඩංගු පෝෂක ද්‍රව්‍ය ලැයිස්තුව ලේබලයේ මුද්‍රණය කිරීමේ ක්‍රමය සහ ශ්‍රී ලංකාවේ සමස්ත ආහාර පරිසරය ද විමර්ශනය කරයි. ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ වඩාත් ඵලදායී ප්‍රතිපත්ති විසඳුම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා මහජන සෞඛ්‍ය ක්‍රියාකාරීන් අනුගමනය කළ යුතු උපාය මාර්ග හඳුනා ගැනීමට උපකාරී වීම මෙහි අරමුණ වේ.

පර්යේෂණ ප්‍රකාශන:

- **සෞඛ්‍ය වියදම් සහ සැමට ආර්ථික වර්ධනය: ශ්‍රී ලංකාවේ උදාහරණය,** එස්. ප්‍රේමරත්න, එන්. වික්‍රමරත්න සහ යූ. මොරමුදලි ගේ 'සියලු දෙනා සඳහා ආර්ථිකය' ප්‍රකාශනයෙහි උෂා පෙරේරා සහ එන්. වික්‍රමරත්න, (පි. 121 - 136), කොළඹ විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2022.

- **වඩා හොඳ ආහාර වේල් සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති: ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් ප්‍රවර්ධනය කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියෝගවල දේශපාලන ආර්ථිකය,** සුනිමලී මදුරාවල, 'පොලිසි ඉන්සයිට්ස්', ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජූනි 3.

අදහස් වේදිකා:


- **ආහාරයේ අඩංගු පෝෂක ද්‍රව්‍ය සඳහන් ලේබල්: එමගින් ශ්‍රී ලංකාවේ වඩා සෞඛ්‍ය සම්පන්න ආහාර තෝරාගැනීම ප්‍රවර්ධනය කරන්නේද,** ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 6 සහ ඩේලි මිරර්, ද මෝර්නිං සහ සන්ඩේ ඔබ්සර්වර් හි පළවූ මාධ්‍ය නිවේදන.

- **දුම්කොළ බදු පැනවීම: බීඩි සඳහා අයකරනු ලබන බදු වලින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ සහ බර,** චිරන්දනී පතිරාජ, ටෝකිං ඉකොනොමික්ස්, ජූනි 20, සහ ඩේලි මිරර් සහ ද මෝනිං හි පළවූ පුවත්පත් නිවේදන.

- **දුම්කොළ බදු පැනවීම: 2023 අයවැය මගින් දුම්කොළ බදු වැඩි කළ යුත්තේ මන්ද,** පර්යේෂණ කණ්ඩායම, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 10 සහ 'ද අයිලන්ඩ්' හි පළවූ පුවත්පත් නිවේදනය.

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- එක්සත් රාජධානියේ 'කැන්සර් රිසර්ච්' ආයතනය විසින් සංවිධානය කරන ලද, 'ජාත්‍යන්තර පිළිකා මර්දන වැඩසටහනේ දුම්කොළ පාලන හවුල්කරු අංගයේ දී' **දුම්කොළවලට එරෙහි ශ්‍රී ලංකාවේ සටන: ප්‍රතිපත්ති මැදිහත්වීම්, ජයග්‍රහණ සහ නිම නොකළ න්‍යාය පත්‍රය** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, මාර්තු 3 (සුනිමලී මදුරාවල)



- 'ස්කේලිං අප් නියුට්‍රිෂන් ව්‍යාපාර ජාලය' විසින් සංවිධානය කරන ලද ස්කේලිං අප් නියුට්‍රිෂන් ව්‍යාපාර ජාලයේ අර්ධ වාර්ෂික හමුවේ දී **ආහාරයේ අඩංගු පෝෂක ද්‍රව්‍ය සඳහන් ලේබල් මගින් ශ්‍රී ලංකාවේ සීනි යොදා රසගන්වන ලද පාන වර්ග තෝරාගැනීම් ප්‍රවර්ධනය කරන්නේද?** යන මාතෘකව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම, හිල්ටන් කලම්බු රෙසිඩන්සීස්, මාර්තු 31 (ප්‍රියංකා ජයවර්ධන).

- රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම් (RIS) විසින් සංවිධාන කරන ලද දකුණු ආසියා ආර්ථික සමුළුවේ දී **සැමට සෞඛ්‍යය සහ ඩිජිටල් සෞඛ්‍ය වැඩසටහන්** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, අප්‍රේල් 20 (නිශා අරුණතිලක).

- මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) විසින් සංවිධානය කරන ලද **මත්පැන් සඳහා ආයෝජන අවස්ථාවක් සකස් කිරීම** පිළිබඳ සම්මන්ත්‍රණයේදී සාකච්ඡා මණ්ඩල සාමාජික, මැයි 12 (නිශා අරුණතිලක).

- කෘෂිකර්ම, පෝෂණය සහ සෞඛ්‍යය විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද 7 වැනි වාර්ෂික කෘෂිකර්ම, පෝෂණ හා සෞඛ්‍ය විද්‍යාපීඨ සතියේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2022 අවස්ථාවේ **ශ්‍රී ලංකාවේ සීනි යොදා රසගන්වන ලද පාන වර්ග තෝරා ගැනීම කෙරෙහි ඒවායෙහි අඩංගු පෝෂක ද්‍රව්‍ය ලේබලයෙහි සඳහන් කිරීම මගින් ඇති කර තිබෙන බලපෑම** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, ජූනි 28 - 30 (ප්‍රියංකා ජයවර්ධන).





- කෘෂිකර්ම, පෝෂණය සහ සෞඛ්‍යය විද්‍යාපීඨය විසින් සංවිධානය කරන ලද 7 වැනි වාර්ෂික කෘෂිකර්ම, පෝෂණ හා සෞඛ්‍ය විද්‍යාපීඨ සතියේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2022 අවස්ථාවේ දී **'අදහස්, ආයතන, සහ බල ගතිකයන්: ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර චේල් ප්‍රවර්ධනය කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන් පිළිබඳ දේශපාලන ආර්ථිකය'** නැමති මාතෘකාව යටතේ සිදුකළ ඉදිරිපත් කිරීම, කෘෂිකර්ම, පෝෂණ හා සෞඛ්‍ය විද්‍යාපීඨය, මාර්ගගත, ජූනි 28 - 30 (සුනිමලී මදුරාවල).

- පිනීවා නුවර පිහිටි ලෝක පිළිකා සංගමය වෙනුවෙන් එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනය විසින් (විස් පැක්ස්ටන් (KIVU ඉන්ටර්නැෂනල්), නටාලී වාර්නී හොප්කින්ස් (CRUK), සහ ජය කුමාර් ගුරුං) සමග එක්ව සංවිධානය කරන ලද **'දුම්කොළ පාලනය ප්‍රවර්ධනය කිරීමේ අභියෝග'**. (පූර්ව පටිගත කළ වීඩියෝ සාකච්ඡාව) ඔක්තෝබර් 18 - 21 (නිශා අරුණතිලක).

- ජාත්‍යන්තරය ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සම සත්කාරකත්වය දරන ලද, 'දකුණු ආසියාවේ පෝෂණය සඳහා තොරතුරු සපයා දීම (D4N): භෝජන පරිවර්තනය කිරීම' පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ දී **'ඉදිරිය බැලීම: දකුණු ආසියාවේ ආහාර භෝජන පරිවර්තනය කිරීම සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ පර්යේෂණ සඳහා වැදගත්වන ක්‍රියාමාර්ග'** නැමති පූර්ණ සහභාගීත්වය සහිත සමාප්ති සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, නොවැම්බර් 10 (ප්‍රියංකා ජයවර්ධන).





ශ්‍රම වෙළඳපොළ

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 වාර්තාව සඳහා නිශා අරුණතිලක සහ සුරේෂ් රණසිංහ විසින් රචනා කළ **ඔබින රැකියා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම** පිළිබඳ පරිච්ඡේදයක් මගින් කාන්තාවන්ට දරුවන් සිටීම ඔබින රැකියාවකට ප්‍රවේශ වීමට බාධාවක් වන බව සොයා ගන්නා අතර, ඔබින රැකියා උත්පාදනයට පහසුකම් සැලසීම, විධිමත් රැකියා අවස්ථා සඳහා ප්‍රවේශය වැඩි කිරීම සහ ශ්‍රම වෙළඳපොලේ ස්ත්‍රී පුරුෂ පරතරය අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ යෝජනා කරයි.

■ ප්‍රතිපත්ති කමිටු

- **තාක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව,** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

- **ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය,** ජාතික මානව සම්පත් සංවර්ධන සභාව.


■ පර්යේෂණ ප්‍රකාශන

- **ශ්‍රී ලංකාව අනුගමනය කළ නිවසේ සිට රාජකාරි කිරීමේ ප්‍රතිපත්තියෙහි ජයග්‍රාහකයින් සහ පරාජිතයින්,** සුරේෂ් රණසිංහ සහ නිශා අරුණතිලක, ශ්‍රම සහ සංක්‍රමණ පර්යේෂණ මාලා අංක 28, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2022.

- **ත්‍රිරෝද ආකර්ෂණයක්: ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි ත්‍රිරෝද රථ රියදුරන් පිළිබඳ විශ්ලේෂණයක්,** තිසලි ද සිල්වා, ඔකේෂනල් පේපර් සීරිස් ප්‍රකාශන මාලා අංක 72, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2022.



■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා



- කාර්මික තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ හතර වැනි කාර්මික විප්ලවය: අභියෝග, හිදැස් සහ අවස්ථා පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී (අන්තර්ජාල) **සිවිවන කාර්මික විප්ලවය සහ ශ්‍රී ලාංකීය ශ්‍රම වෙළඳපොළ - අපි සූදානම්ද?** නැමති මාතෘකාව යටතේ සිදුකළ ඉදිරිපත් කිරීම, මාර්තු 16 (නිශා අරුණතිලක).

- **ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශයට බලපාන නෛතික, සමාජ සහ ආර්ථික ශ්‍රම වෙළඳපොළ බාධක,** පිළිබඳ ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වයේ වාර්ෂික රැස්වීමේ සාකච්ඡාකරුවෙක් ලෙස සහභාගීවීම, ජූනි 8, මාර්ගගත (නිශා අරුණතිලක).

- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සහ ප්‍රියා විසින් සංවිධානය කරන ලද, **ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ පර්යේෂකයන් ලෙස තරුණයින්** පිළිබඳ පරම්පරා අතර වූ ප්‍රතිපත්ති සංවාදයෙහි විචාරක, සැප්තැම්බර් 26 (නිශා අරුණතිලක).

- යුනෙස්කෝ සංවිධානය විසින් සංවිධානය කරන ලද **ශ්‍රී ලංකාවේ තරුණයිනගේ රැකියා යෝග්‍යතාව** පිළිබඳ ඉදිරිපත් කිරීම, සැප්තැම්බර් 29 (නිශා අරුණතිලක).

කාන්තාව සහ ශ්‍රම බලකාය

සෞඛ්‍ය බලපෑම් වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සේවා ස්ථාන තත්ත්වයන් වැඩිදියුණු කිරීම පිණිස වසංගත ප්‍රතිචාර කාර්යපටිපාටියක් සැලසුම් කිරීම සහ නියාමන ප්‍රතිපත්ති සඳහා බලපෑම් කිරීම අරමුණු කරගනිමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය සමග එක්ව **ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සේවිකාවන්ට ඇතිවන අහිතකර සෞඛ්‍ය බලපෑම් අවම කිරීම සඳහා වසංගත ප්‍රතිචාර වැඩිදියුණු කිරීම** පිළිබඳ අධ්‍යයනයක නිරතව සිටියි. මෙම අධ්‍යයනය මගින් කාන්තාවන් ආධිපත්‍යය දරන ප්‍රධාන අපනයන ක්ෂේත්‍ර අතර ශ්‍රී ලංකාවේ ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳව සහ විදේශ විනිමය උත්පාදනය කිරීමේදී නිම් ඇඳුම් කර්මාන්තයේ වැදගත්කම වසංගතයෙන් ඇති වූ ආර්ථික අර්බුදයත් සමග වඩාත් තීරණාත්මක වී තිබීම පිළිබඳව ද අවධානය යොමු කරයි.

කාන්තාවන්ට ඔබින රැකියා සඳහා වන සමාජ, ආර්ථික සහ නෛතික බාධක පිළිබඳව Co-Impact සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද තවත් අධ්‍යයනයක් මගින්, කාන්තාවන්ට ඔබින රැකියාවකට ප්‍රවේශ වීමට ඇති සන්දර්භීය බාධක පිළිබඳව වඩා හොඳින් අවබෝධ කර ගෙන වඩාත් පුළුල් දැක්මක් සැපයීම සඳහා රටවල් හයක, එනම්, කෙන්යාව, සෙනගල්, පිලිපීනය, ශ්‍රී ලංකාව, බ්‍රසීලය සහ පේරු යන රටවල වෙනත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවල මිශ්‍රණයක් භාවිතා කරයි.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2022 නැමති වාර්තාවෙහි සුනිමලී මදුරාවල සහ කිමුතු කිරින්ගොඩ විසින් රචනා කරන ලද **ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම** පිළිබඳ පරිච්ඡේදයක දී ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයේ බලපෑමෙන් වඩාත්ම අවදානමට ලක්විය හැකි අය අතර කාන්තාව සිටින බවත්, කාන්තාවන් වැටුප් නොලබන රැකවරණ සැපයීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම රැකියා ප්‍රතිඵලවල හිදැස්, වැටුප් සහ විශ්‍රාම වැටුප් වැනි ශ්‍රම වෙලඳපොළවල බොහෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ විෂමතා සඳහා එක් හේතුවක් වන බව පෙන්වා දී තිබේ. කතුවරු කාන්තා නායකත්වයේ සහ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ප්‍රතිලාභ ඉස්මතු කරන අතර, අන්තර්කරණය කිරීම සහ සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරන ප්‍රතිපත්ති න්‍යායපත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කරති.

■ පර්යේෂණ ප්‍රකාශන

- **වසංගතයෙන් ඔබ්බට ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ රැකියාවල අවදානම්සහගත බව අඩු කිරීම,** සුනිමලී මදුරාවල, පොලිසි ඉන්සයිට්ස්, ඩිවලොප්මන්ට් ඒෂියා, මාර්තු 7.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- ශ්‍රී ලංකාවේ 'සමාජ විද්‍යාඥයින්ගේ සංගමය' සමග එක්ව, ශ්‍රී ලංකාවේ 'කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය' විසින් සංවිධානය කරන ලද 'වැටුප් නොගෙවන රැකවරණ සැපයීම් සහ දකුණු ආසියාවේ කාන්තා ශ්‍රමය පිළිගැනීමට ලක් කිරීමේ දී සමානාත්මතාවය සහ සාධාරණත්වය' යන තේමාව යටතේ පැවති සම්මන්ත්‍රණයේ දී, **'තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා: ශ්‍රී ලංකාවේ වැටුප් නොගෙවන රැකවරණය සපයාදීම් හඳුනා ගැනීම, අඩු කිරීම සහ නැවත බෙදාහැරීම'** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්ගගත, ඔක්තෝබර් 20 සහ 21, (සුනිමලී මදුරාවල).





1.3 සංක්‍රමණය සහ නාගරීකරණය

ගෝලීයකරණය වැඩිදියුණු වීම සහ සෑම රටකම වීක පුද්ගල ආදායම්වල විෂමතා ඉහළ යාමත් සමග ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා පමණක් නොව අධ්‍යාපනය සහ පවුල් වීකක සඳහා ද සංක්‍රමණය වෙති. වී සමග ම, සංචාරකයින් ලෙසත්, කම්කරුවන් ලෙසත් විදේශිකයින් ශ්‍රී ලංකාවට පැමිණෙති. වියට අමතරව, මිනිසුන් ආර්ථික අවස්ථා සොයමින් නාගරික කේන්ද්‍ර වෙත සංක්‍රමණය වන බැවින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණ රටා ද වෙනස් වෙමින් පවතියි. මෙමගින් හරිත, සුහුරු සහ ඔරොත්තු දෙන නගර සංවර්ධනය කිරීම, නාගරීකරණයේ විෂමතා ආමන්ත්‍රණය කිරීම සහ නාගරික ශ්‍රී ලංකාවේ නිවාස, ඉඩම් ප්‍රවාහනය සහ කසළ කළමනාකරණය වැඩිදියුණු කරන ලෙස ඉල්ලා සිටියි.

සංක්‍රමණය සහ සංවර්ධනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජාත්‍යන්තර විධායක සේවා බලකාය (IESC) සමග වක්ව **ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්ගේ කුසලතා, අභිලාෂයන් සහ නැවත සමාජ සංකලනය වීමේ අභියෝග** පිළිබඳ තවත් අධ්‍යයනයක නිරතව සිටියි. ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්ගේ කුසලතා, අභිලාෂයන් සහ නැවත වීකාබද්ධ කිරීමේ අභියෝග හඳුනා ගැනීම පිණිස පවතින දත්ත හිදැස් හඳුනා ගැනීම සහ මූලික පර්යේෂණ සිදුකිරීම මෙහි අරමුණ වේ. මෙම අධ්‍යයනය මගින් ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින් සඳහා තිරසාර නැවත වීකාබද්ධ කිරීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපදේශන වැඩසටහන් නිර්දේශ කරනු ඇත. අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සමගාමී, මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කරමින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රාථමික දත්ත රැස් කිරීම මගින් ඇතුළුව, තිබෙන දත්ත යොදා ගනිමින් පුළුල් පර්යේෂණයක් සිදු කර විශ්ලේෂණය කරන ලදී.

2022 වර්ෂයේ දී අධ්‍යයන කිහිපයක් සාර්ථකව නිම කරන ලදී. සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) සමග වක්ව **'දකුණු ආසියානු කොළඹ ක්‍රියාවලියේ' සාමාජික රටවල නැවත සමාජ සංකලනය කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තීරණ සිතියම්ගත කිරීම** නැමති අධ්‍යයනය මගින් සංක්‍රමණිකයින් නැවත සමාජ සංකලනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, වියට සංක්‍රමණිකයෙකු තමන්ගේ උපන් රටෙහි හෝ සුපුරුදු පදිංචි ස්ථානයේ ආර්ථික, සමාජ සහ මනෝ සමාජීය බැඳීම් නැවත ස්ථාපනය කිරීම ඇතුළත් වේ. මෙම අධ්‍යයනය මගින් ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව, පකිස්ථානය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන විශේෂිත දකුණු ආසියානු කොළඹ ක්‍රියාවලියේ සාමාජික රටවල තොරතුරු විස්තීර්ණ ලෙස සිතියම්ගත කිරීම මගින් පවතින ප්‍රතිසංවිධාන ක්‍රියාමාර්ග සැලකිල්ට ගෙන වීවායෙහි ඵලදායීත්වය තක්සේරු කරන ලදී.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයන ලද, **සංක්‍රමණය ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ගවල ප්‍රධාන ධාරාවට ගෙනඒම** නැමති අධ්‍යයනය 'සංක්‍රමණය' සංවර්ධනයෙහි ප්‍රධාන ප්‍රවාහයට ගෙන වීමේ විමර්ශන වෑයමක් ලෙස ක්‍රියා කළේ ය. වීමෙන්ම, වීමගින් ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සහ සංවර්ධනය අතර පවතින සම්බන්ධය පිළිබඳ සාක්ෂි මත පදනම් වූ දත්ත සකස් කිරීම සඳහා රට පිළිබඳ මූලික තක්සේරුවක් ලබා දුන් අතර, අනාගත සංවර්ධන උපාය මාර්ග සඳහා නිර්දේශ ද ලබා දුන්නේය. මෙම අධ්‍යයනය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ අරමුදල් සැපයීමේ අංශය වන 'සංක්‍රමණ සම්පත් වෙන් කිරීමේ කමිටුව' (MIRAC) විසින් සහාය දක්වන ලද 'ආසියා - පැසිෆික් කලාපයේ ඵලදායි වක්සත් ජාතීන්ගේ මැදිහත්වීම සඳහා හැකියා වැඩි දියුණු කිරීම' යන මාතෘකාව යටතේ ක්‍රියාත්මක වන කලාපීය ව්‍යාපෘතියේ කොටසකි.

■ ප්‍රතිපත්ති කමිටු

- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද **ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුව.**

■ පර්යේෂණ ප්‍රකාශන:

- **ශ්‍රම සංක්‍රමණිකයින් සහ කොවිඩ්-19 වසංගතය: විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබෙන සාක්ෂි,** බිලේෂා වීරරත්න, ටූ හෝම්ලන්ඩ්ස්, අංක 56/2022, ස්ලෝවේනියානු සංක්‍රමණ ආයතනය, 2022.

- **ශ්‍රී ලංකාවෙන් සිදුවන ශිෂ්‍ය සංක්‍රමණය අවබෝධ කර ගැනීම,** බිලේෂා වීරරත්න, හරිනි වීරසේකර සහ තිළිණි බණ්ඩාර, පොලිසි ඩිස්කෂන් බ්‍රීෆ්, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, පෙබරවාරි 2022.

■ අදහස් වේදිකා:

- **තරුණ සංක්‍රමණය: ශ්‍රී ලංකාව සඳහා අභියෝග සහ අවස්ථා,** තිසුරි ඒකනායක, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 7, සහ ද මෝර්නිං, සිලෝන් ටුඩේ, ද අයිලන්ඩ්, සන්ඩේ ඔබ්සර්වර්, ලංකා බිස්නස් ඔන්ලයින් සහ අද දෙරණ හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- **ශ්‍රම සංක්‍රමණය සඳහා නිපුණතා** යන මාතෘකාව යටතේ පැවති තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම් සහ ජාත්‍යන්තර කම්කරු සංවිධාන බහු-පාර්ශ්වකාර උපදේශන සැසියේ දී විද්වත් මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවන ලදී. ජනවාරි 24, වෝටර්ස් එජ් (බිලේෂා වීරරත්න).

- ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය විසින් සංවිධානය කරන ලද 'සංක්‍රමණික සේවකයින්ගේ ගැටළු' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී **කොවිඩ්-19 සහ ආර්ථික හා දේශපාලන අර්බුද හමුවේ සංක්‍රමණික සේවකයන්ගේ වර්තමාන තත්ත්වය** පිළිබඳ ඉදිරිපත් කිරීම, ජූනි 22 (බිලේෂා වීරරත්න).

සංක්‍රමණය සහ ප්‍රේෂණ

පවතින ආර්ථික අර්බුදයත් සමග ශ්‍රී ලංකාවට එවනු ලබන ප්‍රේෂණ විධිමත් හෝ අවිධිමත් මාර්ගවලින් එවන බව පෙනෙන්නට තිබුණි. මෙම සන්දර්භය තුළ, ජිනීවා නුවර පිහිටි ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රම සංචලනය සහ සංක්‍රමණිකයින් සඳහා වන දකුණ ආසියානු මධ්‍යස්ථානය (SALAM) සමග එක්ව සිදු කරනු ලබන සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඔබින රැකියා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය** යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'අවිධිමත් ප්‍රේෂණ අවබෝධ කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් ලැබෙන අත්දැකීම් පිළිබඳ අධ්‍යයනයක නිරත වේ. අවිධිමත් ප්‍රේෂණ වෙළෙඳපොළ තුළ සිදුවන සැඟවුණු ක්‍රියාකාරකම්වල ආවේණික ලක්ෂණ සැලකිල්ලට ගැනීමේදී, දත්ත සහ සාක්ෂි සම්බන්ධයෙන් සීමිත අවබෝධයක් සහ දැඩි සීමාවන් පවතියි. පවතින ලිඛිත වාර්තාවල මෙම හිදැස් පිළිගන්නා අතරම, ගුණාත්මක දත්ත සහ තේමාත්මක විශ්ලේෂණ ප්‍රවේශයක් භාවිතා කරමින්, ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කරමින් අවිධිමත් ප්‍රේෂණ පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

අධ්‍යාපන කාර්යයන් සඳහා සංක්‍රමණය වීම ශ්‍රී ලංකාවෙන් පිටතට සංක්‍රමණය වීම ඉහළ යමින් පවතින සංක්‍රමණික ගලා යාමක් බවට පත්ව ඇත. එසේ වුවද, ශ්‍රී ලංකාවෙන් සිදුවන ශිෂ්‍ය සංක්‍රමණය පිළිබඳ ක්‍රමානුකූල සහ ආනුභවික සාක්ෂි පදනම් කරගත් සීමිත සමාජ-ආර්ථික අවබෝධයක් ඇත. මෙම සන්දර්භය තුළ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද **ශිෂ්‍ය සංක්‍රමණය** පිළිබඳ අධ්‍යයනය මගින් උසස් අධ්‍යාපනය සඳහා සංක්‍රමණය වන ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සිසුන් පිළිබඳ මූලික ඇගයීමක් සහ අවබෝධයක් සපයා දුන්නේය. මෙම අංශය 2022 වර්ෂයේ දී මෙම අධ්‍යයනයන් සම්පූර්ණ කළේය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රම සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ සහ ආනුභවික විශ්ලේෂණය (REALM) සමග එක්ව සිදු කරන ලද **මෑත කාලයේදී ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වූ සංක්‍රමණික සේවකයින්ට කොවිඩ්-19 වසංගතයේ බලපෑම** පිළිබඳ අධ්‍යයනය මගින්, ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ව්‍යායාමයක් හරහා සංක්‍රමණිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට කොවිඩ්-19 වසංගතයන් විල්ලවූ බලපෑම විමසා බලන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් විවිධ කණ්ඩායම් අතර සංක්‍රමණික සේවකයින්ගේ අවදානම, ගමනාන්ත රටවලදී සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන අහිතකර බලපෑම්, සහ දුර රටක තනිව සිටින තම ආදරණීයයන්ගේ දුක්ඛිත තත්වය සහ පවුලට ප්‍රේෂණ අඩුවීම සහ / හෝ සංක්‍රමණික සේවකයාගේ හදිසි ආපසු පැමිණීම හේතුවෙන් නිත්‍ය ආදායම් ප්‍රවාහය අස්ථාවර වීම වැනි හේතු නිසා ශ්‍රී ලංකාවේ ඉතිරිව සිටින ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් තුළ ඇතිවන මානසික ආතතිය ඇතුළු විවිධ ආකාර වලින් විල්ලවන පීඩාවන් කෙරෙහි මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කළේය.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 නැමති වාර්තාව සඳහා බිලේෂා වීරරත්න, තිළිණි බණ්ඩාර සහ තිසුරි ඒකනායක විසින් රචනා කර ලද, **ආර්ථික ප්‍රතිසාධනයට සහාය වන සංක්‍රමණය සහ ප්‍රේෂණ** පිළිබඳ පරිච්ඡේදයක දී ශ්‍රම සංක්‍රමණයේ මෑත කාලීන ප්‍රවණතා සහ ගැටලු, සංක්‍රමණ

අවදානම් සහ විනිමය අනුපාත, පිරිවැය සහ අධෛර්යමත් කරවනසුළු නීති වැනි ප්‍රේෂණ කෙරෙහි බලපාන සාධක පිළිබඳව සාකච්ඡා කරයි. තවද, කතුවරු ශිෂ්‍ය සංක්‍රමණිකයින් සහ ප්‍රේෂණ යැවීමේදී මුහුණ දෙන ගැටළු අවධාරණය කරන අතර, දුර්වලතා අවම කර ගනිමින් විධිමත් ප්‍රේෂණ නාලිකා වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වන කෙටි කාලීන සිට දිගු කාලීන ක්‍රියාමාර්ග නිර්දේශ කරති.

■ පර්යේෂණ ප්‍රකාශන:

- **සංක්‍රමණය සහ ආර්ථික ප්‍රේෂණ: සංවර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම,** බිලේෂා වීරරත්න, ආගමනය හා සරණාගතයින් පිළිබඳ අධ්‍යයනය සඳහා වන රූට්ලෙජ් අත්පොතෙහි 27 වන පරිච්ඡේදය, සංස්කරණය: A. Triandafyllidou විසිනි, රූට්ලෙජ්, 2022.

■ අදහස් වේදිකා:

- බිලේෂා වීරරත්න මහත්මිය TV1 රූපවාහිනී නාලිකාවේ Face the Nation වැඩසටහනේ දී **ශ්‍රී ලංකාවේ පේෂණවල දැඩි වෙනස්කම්** පිළිබඳව පැහැදිලි කළාය, ජනවාරි 17.



- බිලේෂා වීරරත්න මහත්මිය TV1 රූපවාහිනී නාලිකාවේ News First වැඩසටහනේ දී **ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති** පිළිබඳ සාකච්ඡා කළාය, ජූලි 4.



- **පවුල් පසුබිම් වාර්තාව ඉවත් කිරීමේ සහනය: ශ්‍රී ලංකාවට සංක්‍රමණිකයින්ගේ ප්‍රේෂණ වැඩිකර ගැනීම සඳහා මීළඟට කළ යුත්තේ කුමක් ද?** බිලේෂා වීරරත්න, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 4, සහ ඩේලි මිරර්, ද අයිලන්ඩ් සහ සන්ඩේ ඔබ්සර්වර් හි පළවූ මාධ්‍ය නිවේදන.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සම්බන්ධීම් සඳහා වන නේපාල ආයතනය (NIICE) විසින් සංවිධානය කරන ලද, **ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය: ප්‍රේෂණවල සහ සංචාරක ව්‍යාපාරයේ භූමිකාව** පිළිබඳ ඉදිරිපත් කිරීම, ජුනි 23 (බිලේෂා වීරරත්න).

- 'දකුණු ආසියාවේ සංක්‍රමණය පිළිබඳව වන 10 වැනි දකුණු ආසියානු ආර්ථික ප්‍රතිපත්ති ජාල සමුළුවේදී' **සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ මගින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අර්බුදය සමනය කළ හැකිද?** යන මාතෘකාව යටතේ සිදුකළ ඉදිරිපත් කිරීම, නේපාලය, නොවැම්බර් 7 සහ 8 (බිලේෂා වීරරත්න).





අභ්‍යන්තර සංක්‍රමණය

ශ්‍රී ලංකාව විවිධ ආන්තික කාලගුණික බලපෑම්වලට නිරාවරණය වන අතර, පාරිසරික විචලනයන් ගෘහ මට්ටමින්, විශේෂයෙන් ම ජීවනෝපාය, ආහාර සුරක්ෂිතතාව, ජලය, සෞඛ්‍ය සහ යටිතල පහසුකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. සංක්‍රමණයවීම දේශගුණික විපර්යාස ආශ්‍රිත ඇඟවීම් වලට ප්‍රතිචාර දක්වන ප්‍රජාවන් විසින් අනුගමනය කරනු ලබන වැදගත් උපාය මාර්ගයකි. අදාළ ගැටළු ආමන්ත්‍රණය කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමග එක්ව ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස සහ සංක්‍රමණය අතර සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයක නිරත වේ. මිශ්‍ර ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සහ සංක්‍රමණය අතර සම්බන්ධය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කරයි.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා


- 'සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් සංවිධානය කරන ලද 'සංක්‍රමණය සහ දේශගුණික විපර්යාස අතර පවතින සම්බන්ධය අවබෝධ කර ගැනීම සඳහා වන ගැඹුරු පර්යේෂණය' පිළිබඳ ජාතික උපදේශන වැඩමුළුවේ දී ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස, පාරිසරික හායනය සහ සංක්‍රමණ අතර සම්බන්ධතා පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලදී, මොනාක් ඉම්පීරියල් හෝටලය, කෝට්ටේ, දෙසැම්බර් 20 (බිලේෂා වීරරත්න).

- සංක්‍රමණ සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 'දේශගුණික විපර්යාස' පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව වෙත **ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස, පාරිසරික හායනය සහ සංක්‍රමණය අතර සම්බන්ධතා** පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලදී, පරිසර අමාත්‍යාංශය, දෙසැම්බර් 21 (බිලේෂා වීරරත්න).

නාගරීකරණය

■ පර්යේෂණ ප්‍රකාශන:

- සංවර්ධනය වූ නාගරික ප්‍රවාහන පද්ධතියක් කරා: ශ්‍රී ලංකාව සඳහා පාඩම්, බිලේෂා වීරරත්න සහ චතුර්ගා කරුණානායක, "කාලීන පත්‍රිකා ප්‍රකාශනමාලා" අංක 73, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2022



1.4 දරිද්‍රතාවය සහ සමාජ සුබසාධනය

පසුගිය දශකය පුරාවට දරිද්‍රතාවය අවම කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් තිබියදීත්, අසමානාත්මතාවය සහ අනාරක්ෂිත බව ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති වාද විවාදවලදී තවදුරටත් දැඩි අවධානයට ලක්වන ගැටළු වේ. අත්‍යාවශ්‍ය සේවා සහ අධ්‍යාපනය, සෞඛ්‍ය, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සහ මූල්‍ය සේවා වැනි යටිතල පහසුකම් සඳහා ප්‍රවේශ වීමේ විෂමතා රටේ පවතින ඉහළ මට්ටමේ ආදායම් විෂමතාවයට දායක වේ. අවදානමට ලක්විය හැකි ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් පොකුරු වී සිටින බවත්, අහිතකර කම්පනයන් මැඩලීමට ප්‍රමාණවත් සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයක් නොමැතිවීම නිසා ඔවුන් දරිද්‍රතා මට්ටමට ඇදවැටීමේ ඉහළ අවදානමකට මුහුණ දෙන බවත් කොවිඩ්-19 වැනි කම්පනය ඇතිකරවන තත්ත්වයන් මගින් අවධාරණය කරයි.

සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාව තුළ පුළුල් පරාසයක සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මකව පවතින නමුත්, එම සමාජ ආරක්ෂණ පද්ධතිවල ආමන්ත්‍රණය කළ යුතු අඩුපාඩු / ගැටළු කිහිපයක් තිබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂක කණ්ඩායම 2022 වර්ෂයේ දී සමාජ ආරක්ෂණයට අදාළ අධ්‍යයන/ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කරන ලදී. ආයතනය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග එක්ව, පවතින නීති, ප්‍රතිපත්ති සහ වැඩසටහන්, යාන්ත්‍රණ සහ පාර්ශවකරුවන්; පවතින ඩිජිටල් යටිතල පහසුකම්; සහ ඒකාබද්ධ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියක් සහ ඒකාබද්ධ පද්ධතියක් සඳහා වන ඉදිරි මගක් ලෙස අත්‍යවශ්‍ය වන ඕනෑම ගෝලීය සහ කලාපීය යහපරිචයන් අවබෝධ කර ගැනීමේ අරමුණ ඇතිව **ශ්‍රී ලංකාවේ වත්මන් සමාජ ආරක්ෂණ පද්ධති පිළිබඳ විස්තීරණ භූ දර්ශන සිතියම්කරණය පිළිබඳ** අධ්‍යයනයක් සම්පූර්ණ කරන ලදී, මිනිසුන්ගේ ජීවන චක්‍රය පුරාවට ඔවුන්ව ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින්, සමාජ ආරක්ෂණය සඳහා ජීවන චක්‍ර ප්‍රවේශයක් සලකා බලන, සමාජ ආරක්ෂණ මහල් (SPF) රාමුව (ILO නිර්දේශ අංක 202 සහ සම්මුතිය අංක 102) පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එමගින් සමාජ ආරක්ෂණ මහල් රාමුවේ මාන හතර, එනම් (i) ළමුන් සඳහා සමාජ ආරක්ෂණය, (ii) ක්‍රියාකාරී වයස්වල පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණය, (iii) වැඩිහිටි පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණය සහ (iv) සෞඛ්‍ය රැකවරණය යන මාන හතර භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය සවිස්තරාත්මකව විශ්ලේෂණය කරන ලදී. 2022 මාර්තු 14 වන දින ඒෂක හිල්ටන් හි පවත්වන ලද, UNDP විසින් සංවිධානය කරන ලද වැඩමුළුවකදී මෙම අධ්‍යයනයේ සොයාගැනීම් සමෘද්ධි, ගෘහ ආර්ථික හා ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මහතා සහ අමාත්‍යාංශ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී.


ජිනීවා නුවර පිහිටි සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමග එක්ව සිදුකරන ලද **ශ්‍රී ලංකාවේ විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ක්‍රියාකාරී සහ විශ්‍රාම යන වයසේ සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම** පිළිබඳ අධ්‍යයනය මගින්, පුද්ගලයින් කුමන අංශයක රැකියාවක නිරත වුවද, ඔවුන් දරිද්‍රතාවයෙන් මුදවා ගැනීම සඳහා ඵලදායී සමාජ ආරක්ෂණයක වැදගත්කම අවධාරණය කර ඇත. ශ්‍රී ලංකාවේ පවතින සමාජ ආරක්ෂණ පද්ධතිවල දුර්වලතාවය නිසා රට මේ වන විට කොවිඩ්-19 හේතුවෙන් ආර්ථික පසුබෑමක් සමග දුෂ්කරතා අත්විඳිමින් සිටියි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙම අධ්‍යයනය මගින් ප්‍රතිලාභ මට්ටම් සහ ආවරණයේ ඇති හිඳැස් හඳුනා ගැනීම සඳහා ක්‍රියාකාරී වයසේ සහ විශ්‍රාම යන වයස්වල සිටින ශ්‍රී ලංකාවේ විධිමත් සහ අවිධිමත් අංශයේ සේවකයින් සඳහා පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සිතියම් ගත කරන ලදී. තවද, මෙම අධ්‍යයනය මගින් ඉහත සඳහන් කරන ලද සේවක කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකාවේ පවතින සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහ පරිචයන් මත පදනම් වූ නිර්දේශ සපයා දෙන ලදී.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද සමාජ ආරක්ෂණ වියදම් සමාලෝචනය සහ රජයේ කොවිඩ්-19 සමාජ ආරක්ෂණ ප්‍රතිචාරය ලේඛනගත කිරීම පිළිබඳ අධ්‍යයනය මගින් පවතින ප්‍රතිපත්ති පිළිබඳ ඇගයීමක් සිදු කර, ඉලක්කගත සමාජ ආරක්ෂණ උපාය මාර්ග සැලසුම් කරන ලදී. එයට අමතරව, එමගින් වයස්ගත ජනගහනය, ළමයින් සහ සමාජ සහනාධාර මගින් හෝ සමාජ රක්ෂණ යෝජනා ක්‍රම මගින් ආවරණය නොවන ජනගහන කොටස් ("missing middle" ලෙසද හඳුන්වනු ලබන) පිළිබඳ ඇගයීමක් සිදු කළේය. පවතින වැඩසටහන් වල විශේෂතා විස්තර කිරීම ප්‍රතිපත්ති සම්පාදකයින්ට ජාතික සමාජ ආරක්ෂණ

වැඩසටහන් වල ආවරණය, ප්‍රමාණවත් බව සහ ජීවන චක්‍ර ලක්ෂණ ඇගයීමට අවස්ථාව සලසා දුන්නේය.

■ පර්යේෂණ ප්‍රකාශන

- **ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සඳහා වන රාජ්‍ය වියදම් විශ්ලේෂණය,** බර්ඩ්, එන්., තිලකරත්න, ජී., සහ ඩැනියල්ස් වල්.එම්., අන්තර්කරණය වූ වර්ධනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිපත්ති මධ්‍යස්ථානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (ඕහෂෂෑත) පර්යේෂණ වාර්තා අංක 74, 2022.



- **ආසියා පැසිෆික් කලාපයේ සමාජ ආරක්ෂණ ආවරණය සහ පද්ධති ශක්තිමත් කිරීම,** ගංගා තිලකරත්න ආසියා පැසිෆික් කලාපයේ අනාගත කලාපීය සහයෝගීතාවය හැඩගැස්වීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාව, නිව් යෝර්ක්, 2022.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- **ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජ ආරක්ෂණ පද්ධතිවල විස්තීර්ණ පසුබිම සිතියම්ගත කිරීම** පිළිබඳ වාර්තාව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වෙත පිළිගන්වන ලදී, JAIC හිල්ටන්, කොළඹ, මාර්තු 14 (ගංගා තිලකරත්න).



- සමෘද්ධි, ගෘහ ආර්ථික හා ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ දී **ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජ ආරක්ෂණ පද්ධතිවල විස්තීරණ පසුබිම සිතියම්ගත කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම, මාර්තු 20 (ගංගා තිලකරත්න).

- ඇඩ්වොකාටා ඉන්ස්ටිට්‍යුට් විසින් සංවිධානය කරන ලද, 'අපි ශ්‍රී ලංකාව නැවත ස්ථාවර කරමු' නැමති සම්මන්ත්‍රණයේ දී **'සමෘද්ධිය යළි පිහිටුවීම: සමාජ ආරක්ෂණ ජාල'** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, අගෝස්තු 5 (ගංගා තිලකරත්න).



- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 නැමති වාර්තාව නිකුත් කිරීම සනිටුහන් කිරීම සඳහා පැවති 'අර්බුදයෙන් ප්‍රතිසාධනය දක්වා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙහෙයවීම' පිළිබඳ සම්මන්ත්‍රණයක දී 'ජාතික ප්‍රතිපත්ති රාමුව: සමාජ අන්තර්කරණය සහ වැඩිදියුණු කළ පාලනය පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 25 (ගංගා තිලකරත්න).



■ ප්‍රතිපත්ති කමිටු

- සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම පිළිබඳ අනු කමිටුව, කම්කරු අමාත්‍යාංශය (නිශා අරුණතිලක)

දරිද්‍රතාවය සහ අසමානාත්මතාවය

කැනඩාවේ IDRC ආයතනයේ අරමුදල් සැපයීම යටතේ, පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ මැලේසියාවේ Tenaga Nasional විශ්වවිද්‍යාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කොවිඩ්-19 හි සහ අනාගත වසංගතවල තර්ජන තක්සේරු කිරීම සහ ඒවා පාලනය කිරීම සඳහා කෘතිම බුද්ධි රාමුව පිළිබඳ අධ්‍යයනයක නිරත විය (දැනට සිදුකෙරෙමින් පවතික අධ්‍යයනයකි). අධ්‍යයනයේ අරමුණු පහත සඳහන් පරිදි වේ: (අ) වසංගත පාලන උපාය මාර්ග යටතේ 'හඳුනාගත් විවිධ කණ්ඩායම්' වල හැසිරීම හඳුනා ගැනීමට, ආකෘති කිරීමට සහ පුරෝකථනය කිරීමට කෘතිම බුද්ධි (AI) තාක්ෂණික ක්‍රම සකස් කිරීම; (ආ) ශ්‍රී ලංකාව සහ මැලේසියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ගෝලීය දකුණේ ක්‍රියාත්මක කරන ලද මෙම උපාය මාර්ගවල බලපෑම අවබෝධ කර ගැනීම; සහ (ඇ) කොවිඩ්-19 හෝ ඒ හා සමාන බෝවන රෝග පැතිරීම පිළිබඳ අනාගත ව්‍යාප්තිය පුරෝකථනය කිරීමට සහ කළමනාකරණය කිරීමට කෘතිම බුද්ධිය පදනම් කරගත් විසඳුම් සකස් කිරීම. ජනනය කරන ලද හැසිරීම් සහ චලනයන් මත පදනම්ව, අනාගතයේදී මේ හා සමාන හෝ වෙනත් බෝවන රෝග සම්බන්ධයෙන් වඩාත් දැනුවත්, සමාජීය සවිඥානක සහ වගකීම් සහගත ආකාරයකට සම්බන්ධතා සොයාගැනීමේ සහ සමාජ-ආර්ථික බලපෑම් අවම කිරීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා කෘතිම බුද්ධිය සංවර්ධනය කිරීමට මෙම අධ්‍යයනය යෝජනා කරයි. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස, කාන්තාවන්, ළමයින් සහ අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, කොවිඩ්-19 වසංගතයෙහි සමාජ-ආර්ථික බලපෑම පරීක්ෂා කිරීම සඳහා නිවාස 3000 ක් ආවරණය වන පරිදි දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කරන ලදී.





ගංගා තිලකරත්න 2022 දෙසැම්බර් 19 - 23 දිනවල මැලේසියාවේ පැවති "ෂ4කධඪෘ ව්‍යාපෘතියේ මධ්‍යකාලීන සමාලෝචන වැඩමුළුවට සහභාගී වූවාය.

2021 අප්‍රේල් - මැයි කාලය තුළ ඇතිවූ වසංගතයේ බලපෑම හඳුනා ගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද, **'කොවිඩ්-19 අඩු ආදායම් කුටුම්භ පිළිබඳ සමීක්ෂණ විශ්ලේෂණය'** 2022 වර්ෂයේ දී නිම කරන ලදී. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 10 ක නිවාස 300 ක් ආවරණය වන පරිදි සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරන ලද්දේ අඩු සහ මධ්‍යම ආදායම් ලබන පවුල් කෙරෙහි ය. කොවිඩ්-19 වසංගතයේ පළමු වන රැල්ල සහ දෙවන රැල්ල කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලද අතර, රැකියා, ආදායම සහ පරිභෝජනය කෙරෙහි වසංගතයේ බලපෑම සහ රජයේ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ගවල ඵලදායීත්වය පිළිබඳ ඇගයීමක් කරන ලදී.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 වාර්තාව සඳහා ලක්ෂිලා වනිගසිංහ විසින් රචනා කරන ලද **ශ්‍රී ලංකාවේ තිරසාර අනාගතයක් සඳහා අසමානාත්මතා අවම කිරීම** පිළිබඳ ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් මගින් ආදායම් බෙදීයාමේ පවතින අධික විෂමතාවයේ බරපතලකම සහ රටවල් අතර සහ රටවල් තුළ පවතින ආදායම් විෂමතා පෙන්වා දෙයි. ඒ මහත්මිය වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය දීම සඳහා ශක්තිමත් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තිබීමේ වැදගත්කම ද අවධාරණය කර ඇත.

■ පර්යේෂණ ප්‍රකාශන

- ජී.ඉලංගරත්න, එච්.වැලිගම්පොල, වයි. රණසිංහ, ඊ. ආටිගල, ආර්. ගොඩලියද්ද, වී. හේරත්, පී. ඒකනායක, එස්.වයි. ඒකනායක, එම්. පින්නවල, එස්. ධර්මරත්න, ජී. තිලකරත්න, ජේ. ඒකනායක (2022), **'කාන්තාවන්, ළමයින් සහ අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් සඳහා ඇතිකෙරෙන සමාජ ආර්ථික බලපෑම අවම කරගනිමින්, කොවිඩ්-19 සහ අනාගත වසංගත වලින් එල්ලවන තර්ජන තක්සේරු කිරීම සහ පාලනය කිරීම සඳහා වන කෘතිම බුද්ධි රාමුව'**, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සඟරාව, 2022 විශේෂ 81 - 92

- පී. ඉලංගරත්න, වයි. රණසිංහ, එච්. වැලිගම්පොල, ඊ. ආටිගල, ජේ. ඒකනායක, එස්. යටිගම්මන, එම්. පින්නවල, ආර්. ගොඩලියද්ද, වී. හේරත්, පී. ඒකනායක, පී. තිලකරත්න, සහ එස්. ධර්මරත්න (2022), **'කොවිඩ්-19 වසංගත කාල පරිච්ඡේද තුන තුළ අධ්‍යාපනය පිළිබඳ පරිපූර්ණ දළ විශ්ලේෂණයක්: ශ්‍රී ලංකාවේ ඉංජිනේරු සිසුන්ට ඇති බලපෑම,** අධ්‍යාපන විද්‍යා, 2022 මාර්තු

■ අදහස් වේදිකා:

- **දුප්පතුන් හිතවාදී වූ සංචාරක ව්‍යාපාරය: එයට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කළ හැකිද?,** කිමුතු කිරින්ගොඩ, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 14 සහ ඩේලි මිරර්, ද මෝර්නිං, සිලෝන් ටුඩේ, ද අයිලන්ඩ් සහ අද දෙරණ හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **පක්ෂග්‍රාහීත්වය බිඳීම: ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය වැඩි කිරීම,** ලක්ෂිලා වනිගසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 8, සහ ඩේලි මිරර් සහ සන්ඩේ ඔබ්සර්වර් හි පළවූ මාධ්‍ය නිවේදන.

- **'උග්‍ර වෙමින් පවතින ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය: දුප්පතුන්ගේ කණගාටුදායක තත්ත්වය',** ලක්ෂිලා වනිගසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 18 සහ ඩේලි මිරර්, ද අයිලන්ඩ්, සන්ඩේ ඔබ්සර්වර්, අද දෙරණ සහ ලංකා බිස්නස් ඔන්ලයින් හි පළවූ පුවත්පත් / මාධ්‍ය නිවේදන.

- **'ආහාර සටන: ආහාර සුරක්ෂිතතාවය සඳහා ශ්‍රී ලංකාවේ සටන',** ලක්ෂිලා වනිගසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 18, (ඔක්තෝබර් 16 දිනට යෙදෙන ලෝක ආහාර දිනය සැමරීම සඳහා) සහ ද අයිලන්ඩ් සහ සන්ඩේ ඔබ්සර්වර් හි පළවූ මාධ්‍ය නිවේදන.

තිරසාර සංවර්ධන ඉලක්ක

ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්ත්වය 2022 වාර්තාව සඳහා ගංගා තිලකරත්න සහ බිනුර සෙනෙවිරත්න විසින් රචනා කරන ලද **අර්බුද සහ ප්‍රතිසාධන: තිරසාර සංවර්ධන ඉලක්ක 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම** පිළිබඳ පරිච්ඡේදයක් මගින් 2016 සිට වසංගතය අතරතුර ඇතිවූ යම් යම් පසුබෑම් මධ්‍යයේ තිරසාර සංවර්ධන ඉලක්කවල කාර්යසාධනය පිළිබඳ ශ්‍රී ලංකාව මෙතෙක් අත්කරගෙන ඇති ප්‍රගතිය විශ්ලේෂණය කරයි. ඉදිරි වර්ෂවලදී දරිද්‍රතා මට්ටම් ඉහළ යා හැකි බවට කතුවරුන් අනතුරු අඟවති. ලක්මිණී ප්‍රනාන්දු විසින් රචනා කරන ලද **2030 න්‍යාය පත්‍රය ජාතික සංවර්ධන උපාය මාර්ගවල ස්ථිරසාර ලෙද ඇතුළත් කිරීම** පිළිබඳ තවත් පරිච්ඡේදයක් මගින්, දැනට ශ්‍රී ලංකාවට ශක්තිමත් ජාතික සංවර්ධන රාමුවක් සහ සම්පත් කාර්යක්ෂමව වෙන් කිරීම සඳහා ආශ්‍රිත ක්‍රියාවලියක් නොමැති තත්තවයක් තුළ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලියට ස්ථිරසාර ලෙස තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධ කිරීම ඉතාමත් වැදගත් වන බව තර්ක කරයි. එමෙන්ම එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය මගින් සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි වඩා හොඳ දේශීය ප්‍රතිපත්ති තේරීම් සිදු කිරීම සඳහා ජාතික සංවර්ධන සැලසුම් ක්‍රියාවලීන් ඵලදායී ලෙස විධිමත් කළ හැකි රාමුවක් සපයන බව මෙම පරිච්ඡේදයේ දී තවදුරටත් අවධාරණය කර ඇත.

■ ප්‍රතිපත්ති කමිටු

- 2022 ස්වේච්ඡා ජාතික සමාලෝචනය (VNR) සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාවලිය, මුදල් අමාත්‍යාංශය.

1.5 කෘෂිකර්මය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය අඩු ඵලදායිතාවය, අකාර්යක්ෂම සම්පත් භාවිතය සහ තිරසාර නොවන කෘෂිකාර්මික පිළිවෙත් හේතුවෙන් පීඩාවට පත්ව ඇත. අඩු ඵලදායිතාව, වෙනස්වන සුළු භාණ්ඩ මිල සහ අධික නිෂ්පාදන පිරිවැය හේතුවෙන් අපනයනය ඉලක්ක කරගත් වැවිලි අංශය ද අර්බුදයක පවතී. මේ සියල්ල රටේ ආහාර අනාරක්ෂිතභාවයට, මන්දපෝෂණයට සහ දරිද්‍රතාවයට දායක වේ. මේවා හඳුනාගැනීමේදී රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා උසස් තාක්ෂණ නවෝත්පාදන භාවිතා කිරීමට; දේශීයව නිෂ්පාදනය කරනු ලබන ධීවර හා කිරි නිෂ්පාදන ද ඇතුළත් ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීමට සහ නව තාක්ෂණය හරහා අගය එකතු කළ අපනයන වැඩි කිරීමට උත්සාහ දරයි.

ආහාර සුරක්ෂිතතාව

යුක්රේනයේ ගැටුම 2022 වර්ෂයේ දී දකුණු ආසියාවේ ආහාර සුරක්ෂිතතාවය සහ ආහාර පද්ධති කෙරෙහි පුළුල් පරාසයක බලපෑම් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව විවිධ භාණ්ඩ මිල වැඩිවීම් සහ වෙළඳ බාධා කිරීම්වලට ගොදුරු වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නවදිල්ලියේ පිහිටි, ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI), දකුණු ආසියාව, සමග එක්ව **යුක්රේන යුද්ධය ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි ඇතිකරන ඇඟවීම්** පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක නියැලී සිටියි. මෙම අධ්‍යයනය මගින් තියුණු මිල ඉහළ යාමක් දක්නට ලැබෙන, ශ්‍රී ලංකාව කලාපයෙන් මිලදී ගන්නා විශේෂිත භාණ්ඩ සහ ගෝලීය වෙළෙඳපොළෙන් මිලදී ගන්නා භාණ්ඩ පිළිබඳව ගවේෂණය කරයි. සහනාධාර, සමාජ ආරක්ෂණ ජාල හෝ වෙනත් ගෝලීය වෙළඳ හවුල්කරුවන්ගෙන් ප්‍රසම්පාදනය කිරීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හරහා පුරවැසියන්ට යුක්රේන අර්බුදයෙන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවට අනුගමනය කළ හැකි විභව ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙම අධ්‍යයනය මගින් විමසා බලනු ඇත. අවසාන වශයෙන්, ගැටුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම වැනි වෙළඳපළ අවස්ථා සහ ගෝලීය වෙලඳපොළවල සමාන කැලඹීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට රට වඩා හොඳින් සන්නද්ධ කළ හැකි දිගු කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ආදිය පිළිබඳවද මෙම අධ්‍යයනය මගින් විමර්ශණය කරනු ඇත.

USAID ආයතනය විසින් අරමුදල් සපයනු ලබන, සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI), වොෂින්ටන් ඩී.සී. විසින් ක්‍රියාත්මක කරනු ලබන, **සාම්ප්‍රදායික ගොවිතැනෙහි සිට කාබනික ගොවිතැනට මාරුවීම: ශ්‍රී ලංකාවේ රසායනික පොහොර තහනම් කිරීම** පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යයනයෙහි සමස්ත අරමුණ ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදන අංශයට අකාබනික පොහොර තහනම් කිරීමේ සමාජ-ආර්ථික බලපෑම් ඇස්තමේන්තු කිරීම වේ. මෙම අධ්‍යයනයේ විශේෂිත අරමුණු පහත සඳහන් පරිදි වේ: (i) අකාබනික පොහොර තහනම හේතුවෙන් සහල් ගොවීන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග කෙරෙහි අවධානය යොමු කරමින් සහල් අගය දාමය විශ්ලේෂණය කිරීම; (ii) අකාබනික පොහොර තහනම ජාතික මට්ටමින් සහල් නිෂ්පාදනයට සහ ආහාර සුරක්ෂිතතාවයට ඇති කරන බලපෑම් ඇස්තමේන්තු කිරීම; (iii) 2021/2022 මහ කන්නය තුළ අකාබනික පොහොර තහනම ගොවීන්ගේ ඵලදායිතාවයට සහ ආදායමට ඇති කළ බලපෑම විමසා බැලීම; (iv) කාබනික ගොවිතැනේ අභියෝග සහ සාර්ථකත්වයන් හඳුනාගැනීම පිණිස, සාම්ප්‍රදායික ගොවිතැනෙන් කාබනික ගොවිතැනට පරිවර්තනය කිරීමේ ගෝලීය අත්දැකීම් ඇගයීම; සහ (v) රට තුළ ඵලදායී පොහොර ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ යෝජනා කිරීම.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 නැමති වාර්තාවෙහි මනෝජ් තිබ්බොටුවාව විසින් රචනා කරන ලද **ආහාර අර්බුදවලදී ආහාර සුරක්ෂිතතාව පවත්වාගැනීම සහ සාගින්න ඇති නොවීම** පිළිබඳ පරිච්ඡේදයක දී ගෝලීය තෙල් මිලෙහි අස්ථාවරත්වය, ඉහළ යන ජාත්‍යන්තර ආහාර සහ අතරමැදි යෙදවුම් මිල, ඉහළ සැපයුම් පිරිවැය සහ දැඩි ලෙස මුදල් අවප්‍රමාණයවීම ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදය තවත් දැඩි කරමින් ආහාර මිල උද්දමනය කෙරෙහි විශාල වශයෙන් දායක වන බවට තර්ක කරයි. නැවත නැවත ඇතිවන ආහාර උද්දමනයට සහ ආහාර හිඟයට සැබෑ සහ තිරසාර විසඳුම වන්නේ දිගුකාලීන වශයෙන් ආහාර ඉල්ලුම සහ සැපයුම කළමනාකරණය කිරීම බව මෙම පරිච්ඡේදය මගින් යෝජනා කරනු ලැබේ.

■ පර්යේෂණ ප්‍රකාශන:

- **ආහාර අර්බුදයට හේතු සහ එහි ප්‍රතිවිපාක:** මනෝජ් තිබ්බොටුවාව, ශ්‍රී ලංකා එක්ස්පෝර්ටර් සඟරාව, 114 වැනි සංස්කරණය, 2022 අප්‍රේල් - ජූනි.

■ ප්‍රතිපත්ති කමිටු:

- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කැඳවන ලද **ආහාර ප්‍රතිපත්ති කමිටුව**.

■ අදහස් වේදිකා:

- **බිම්ස්ටෙක් කලාපයේ ආහාර සුරක්ෂිතතාව: ශ්‍රී ලංකාවේ සුහුරු ගොවිතැනින් උගත හැකි පාඩම්,** මනෝජ් තිබ්බොටුවාව, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 29 සහ ෆයිනෑන්ෂල් ටයිම්ස්, ඩේලි මිරර් සහ ද මෝර්නිං හි පළවූ පුවත්පත් නිවේදන.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- ඉන්දියාවේ "ඔබ්සර්වර් රිසර්ච් ෆවුන්ඩේෂන්" විසින් සංවිධානය කරන ලද, **ආහාර සුරක්ෂිතතාව සහ බිම්ස්ටෙක්: ශ්‍රී ලංකාවේ සුහුරු ගොවිතැනින් උගත හැකි පාඩම්**, පිළිබඳ සංකාච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, මාර්තු 29 (මනෝජ් තිබ්බටුවාව).

- ශ්‍රී ලංකා ආර්ථික සංගමය (SLEA) විසින් සංවිධානය කරන ලද, **ශ්‍රී ලංකාවේ ඉදිරි ආහාර අර්බුදය: හේතු, ප්‍රතිවිපාක සහ විසඳුම්** පිළිබඳ සම්මන්ත්‍රණයේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, අප්‍රේල් 2 (මනෝජ් තිබ්බොටුවාව)


- නවදිල්ලියේ රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම්ස් විසින් සංවිධානය කරන ලද, 'දහතුන්වන දකුණු ආසියා ආර්ථික සමුළුවේ' **ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතා අභියෝග** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, නවදිල්ලිය, ඉන්දියාව, මාර්ගගත, අප්‍රේල් 20 (මනෝජ් තිබ්බොටුවාව).

- Zoom තාක්ෂණය ඔස්සේ පැවති **ආර්ථික අර්බුදය, ඉහළ යන ආහාර මිල ගණන් සහ පෝෂණ යහපැවැත්ම: ශ්‍රී ලංකාවේ සුරක්ෂිතතා ජාල මැදිහත්වීම් සඳහා විකල්ප** පිළිබඳ ප්‍රතිපත්ති සම්මන්ත්‍රණය මෙහෙයවීම, මැයි 23 (මනෝජ් තිබ්බටුවාව).

- **ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදය,** මනෝජ් තිබ්බොටුවාව, සිරස ටීවී, 'මාවත' වැඩසටහන, මැයි 26.



- ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදයකට තුඩු දිය හැකි අභ්‍යන්තර හා බාහිර සාධක, TV1 රූපවාහිනී නාලිකාවේ "නිව්ස් ෆස්ට්" හි ජනතා වේදිකාව' වැඩසටහන, ජූලි 25 (මනෝජ් තිබ්බොටුවාව).



කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ආයතන

ආහාර හා කෘෂිකර්ම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් සඳහා රට සඳහා වන වැඩසටහන් රාමුව (CPF) 2007 - 2023 කෙටුම්පත් කිරීමේ අරමුණ ඇතිව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කොළඹ පිහිටි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය සමග එක්ව **ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ රට සඳහා වන වැඩසටහන් රාමුව 2023-2027** පිළිබඳ අධ්‍යයනයක නිරත විය. මෙම ව්‍යාපෘතිය මඟින් දැනට තිබෙන ප්‍රතිපත්ති ලියවිලි පිළිබඳ අභ්‍යන්තර සමාලෝචනයක් තුළින් සහ අදාළ රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කිරීම තුළින් ආහාර කෘෂිකර්මාන්ත, ධීවර, පශු සම්පත්, වන වගා සහ පරිසර යන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව සඳහා වන සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගනු ඇත. පළාත් නවයෙහි ම පවත්වන ප්‍රායෝගික වැඩමුළු හරහා රාජ්‍ය නිලධාරීන්, ගොවි/ධීවර සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ පෞද්ගලික අංශය ඇතුළු අදාළ සියලු ම පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර අදහස් විමසනු ලැබේ. ව්‍යාපෘතියේ අවසන් අදියර තවදුරටත් යෙදවුම් ලබා ගැනීම සඳහා සහ සොයාගත් කරුණු වලංගුකරණය කිරීම සඳහා වන ජාතික මට්ටමේ බහු පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුවකින් සමන්විත වේ.

කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය **ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශයේ තරුණ සහභාගීත්වය** පිළිබඳව සිදු කළ විමර්ශන අධ්‍යයනයක් මඟින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙහි සහ ආහාර පද්ධතියෙහි තරුණ සහභාගීත්වය සඳහා ඇති අවස්ථා සහ අභියෝග පිළිබඳ ඇගයීමක් කරනු ලැබේ. මෙම අධ්‍යයනයේ විශේෂිත අරමුණු පහත සඳහන් පරිදි වේ: (i) තරුණ ගොවීන් / තරුණ ව්‍යාපාරික ව්‍යවසායකයින් කෘෂිකර්මාන්තයට පිවිසීමේදී ඔවුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම; (ii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය වෙත තරුණයින් ආකර්ෂණය නොවීමට ප්‍රධාන හේතු අවබෝධ කර ගැනීම; (iii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට/කෘෂි ව්‍යාපාරවලට සම්බන්ධ වීමට තරුණ තරුණියන්ව පොළඹවන ප්‍රධාන පෙළඹවීම් සහ දිරිගැන්වීම් හඳුනා ගැනීම, සහ (iv) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශයේ සහ ආහාර පද්ධතිය තුළ තරුණ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්දේශ යෝජනා කිරීම.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 නැමති වාර්තාව සඳහා ඩිලානි හිරිමුතුගොඩගේ විසින් රචනා කරන ලද **ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් සඳහා ඵලදායී රැකියා සහ ඔබින වැඩ** පිළිබඳ පරිච්ඡේදයකදී ගෝලීය තරුණ ප්‍රවණතා, තරුණ ශ්‍රම සහභාගීත්ව අනුපාත සහ තරුණ සේවා නියුක්තිය පිළිබඳ විමසා බලනු ලැබේ. තරුණ තරුණියන්ට ඵලදායී හා ඔබින රැකියාවල නිරත වීමට මංපෙත් විවර කිරීම සඳහා කෘෂි ව්‍යාපාර සහ කෘෂිකාර්මික ව්‍යවසායකත්වය ව්‍යාප්ත කිරීමට ප්‍රයත්න දැරිය යුතු බව මෙම අධ්‍යයනය මඟින් යෝජනා කර ඇත. එමෙන් ම, මෙහි නිර්දේශ අතර, පවතින තාක්ෂණය වැඩිදියුණු කරන ලෙස සහ ගොවිතැන, කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ කෘෂි ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික මැදිහත්වීම් වැඩිදියුණු කරන ලෙස මෙම පරිච්ඡේදය මඟින් ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022 නැමති වාර්තාව සඳහා නිමේෂා දිසානායක විසින් රචනා කරන ලද **රසායනික පොහොර තහනම් කිරීම: තිරසාර කෘෂිකර්මාන්තයට සහ ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක්** නැමති ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් මගින්, රසායනික පොහොර තහනම සහ එහි අහිතකර බලපෑම් පිළිබඳව විශේෂ සඳහනක් කරමින්, ශ්‍රී ලංකාවේ පොහොර ක්ෂේත්‍රයේ තාවකාලික ප්‍රතිපත්ති වෙනස්කම් සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතභාවය සිරිතක් ලෙස පැවත ඇති බව අවධාරණය කරයි. රට සඳහා වන ඉදිරි මග ලෙස, ඵලදායී පොහොර ප්‍රතිපත්ති සහ විස්තීර්ණ, මනාව ව්‍යුහගත වූ ජාතික කාබනික කෘෂිකාර්මික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට, කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස ක්‍රමක්‍රමයෙන් කාබනික කෘෂි පිළිවෙත් ඇතුළත් කිරීමට සහ අධික ලෙස රසායනික පොහොර භාවිතය වැළැක්වීම සහ භෝග ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා නවීන කෘෂි තාක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීමට ඇය යෝජනා කරයි.

■ පර්යේෂණ ප්‍රකාශන:

- **තරුණ කාන්තාවන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය අත්හරින්නේද,** රුවන් සමරවීර, එස්. ධර්මදාස, සහ ටී. කුමාර, ශ්‍රී ලංකා ස්ටැටිස්ටිකල් රිවීව්, 1(1), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2022.

- **ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා ආයතනික සහයෝගය ලබා ගැනීම පිණිස කෘෂිකර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාරවල හිමිකරුවන්ගේ පෙරසූදානම සහ සාපේක්ෂ අදහස්: ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ උදාහරණය,** තිළිණි බණ්ඩාර, ජේ. උපුල්වෙහෙර, ඩී. ලියනගේ, ජේ. ලලනි, එස්. ගමගේ, පී. රාජපක්ෂ සහ ආර්. ප්‍රසන්න, ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 43 - 67, 2022.



DCS Sri Lanka Statistical Review
Department of Census and Statistics, Sri Lanka

Volume 1 Issue 1 March 2022

Article

Are Young Rural Women Abandoning Agriculture in Sri Lanka?

W.G.R.L. Samaraweera[1,*], R.A.P.I.S. Dharmadasa[2], P.H.T. Kumara[2], A.S.G.S. Bandara[2]

[1] Institute of Policy Studies of Sri Lanka, ruwan@ips.lk
[2] Uva Wellassa University of Sri Lanka, sampath@uwu.ac.lk (R.A.P.I.S.D.), thanitha@uwu.ac.lk (P.H.T.K.), samparth13041@gmail.com (A.S.G.S.B.)
[*] Correspondance: ruwan@ips.lk

Received: 13 September 2021; Accepted: 11 March 2022; Published: 31 March 2022

Abstract

Sri Lankan youth are abandoning small-scale agriculture at an alarming rate. Rural youth are similarly at relatively elevated risk of underemployment and/or unemployment compared to urban and estate sectors. As a result, a considerable number of youth have diversified predominant agricultural livelihoods or migrated in search of better economic opportunities, particularly in the domestic urban sector or abroad. Due to the sheer uneven gender distribution of youth in the population, gender-based evaluation of influences on livelihood choice-making by young men and women was the purpose of this paper. A nationally representative sample of rural youth was extracted, and a multinomial logit model under a random utility framework was estimated to assess livelihood diversification. A probit model of migration outcome was estimated to assess the rural youth's choice of migration. Results revealed that female youth's preferred choice of livelihood being agriculture would be less probable and more likely to be anything other than agriculture. Education is an upward driver in the choice of urban paid work, whereas educated young rural females do not choose agriculture. Rural young women are less prone to migrate; nonetheless, married female youth have a strong proclivity to migrate. Moreover, increased access to agricultural land lessens the propensity of rural young women to migrate.

Keywords:
rural youth, gender inclusivity, women empowerment, youth livelihood decisions, agriculture, youth migration

Introduction

Agriculture is one of the prominent livelihood strategies available for rural youth in Sri Lanka; nevertheless, they are less likely to pursue agriculture in the contemporary world (Samaraweera, et al., 2019). In contrast, recent policy initiatives such as the Overarching Agriculture Policy (draft) of 2019 aim to attain agricultural self-sufficiency in Sri Lanka. Policies supporting agricultural self-sufficiency could alleviate the country's progressively expanding balance of payments (Sanderatne & De Alwis, 2014). Therefore, an optimal combination of factors of production would support the country's attempts to increase agricultural output. Among the numerous factors of production, labour is a crucial element in determining the sector's level of production and productivity.

ISSN 2950-6743 1 www.statistics.gov.lk

■ ප්‍රතිපත්ති කමිටු:

- **දේශීය සීනි කර්මාන්ත ප්‍රතිපත්ති රාමුව පිළිබඳ කාර්ය සාධක බලකාය**, උක් පර්යේෂණ ආයතනය.

- **අපනයන කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වන ජාතික කමිටුව**, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය.

- **සමාජ-ආර්ථික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ කමිටුව**, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, කෘෂිකර්ම අමාත්‍යාංශය.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන '**ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022**' නැමති වාර්තාව නිකුත් කිරීම සනිටුහන් කිරීම සඳහා පැවති 'අර්බුදයේ සිට ප්‍රතිසාධනය දක්වා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය මෙහෙයවීම' නැමති සම්මන්ත්‍රණයේදී **තරඟකාරිත්වය සහ තිරසාරභාවය** පිළිබඳ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඔක්තෝබර් 25 (මනෝජ් තිබ්බොටුවාව).



කෘෂි ව්‍යාපාර අගය දාම

ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (ACIAR) සමඟ එක්ව ක්‍රියාත්මක කරන ලද **පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා ආහාර හානි අවම කිරීමේ මාර්ග සංවර්ධනය කිරීම** පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයෙහි අරමුණ වන්නේ, අඹ සහ තක්කාලි නිෂ්පාදන රේඛා කෙරෙහි ප්‍රධාන ම අවධානය යොමු කරමින් ආහාර හානිවීමේ ස්වභාවයන්, විෂය පථය සහ එයට පාදක වන හේතු පිළිබඳ විමසා බැලීමයි. හානිය අවම කර ගැනීමට ඉවහල් වන චර්යාත්මක වෙනස්කම් මෙහෙයවීමේ දී නවෝත්පාදන සමූහයක ඵලදායීත්වය ද මෙම අධ්‍යයනය මඟින් පෙන්නුම් කරයි. ඒ අනුව, පකිස්ථානයේ සහ ශ්‍රී ලංකාවේ කුඩා වතු හිමි ගොවි ප්‍රජාවන් සඳහා දිගුකාලීන ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර බලපෑම් ඇති කිරීම සඳහා නව්‍ය, දේශීය වශයෙන් මෙහෙයවනු ලබන විසඳුම් හරහා ආහාර හානිවීමේ ගැටළුවට විසඳුම් සපයා දීමට මෙම පර්යේෂණය මඟින් අපේක්ෂා කරනු ලැබේ.

PRCI - USAID/ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) සමඟ සිදුකරන ලද **වෙළඳ ප්‍රවාහ විශ්ලේෂණය: ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අගය දාම කෙරෙහි මත කොවිඩ්-19 කම්පනයේ බලපෑම**, පිළිබඳ අධ්‍යයනය 2022 වර්ෂයේ දී සාර්ථකව නිම කරන ලදී. එමෙන්ම, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ කෘෂි ආහාර වෙළඳාම සඳහා ශ්‍රී ලංකාවට ඇති අවස්ථා සහ අභියෝග ද මෙම අධ්‍යයනය මඟින් විශ්ලේෂණය කරනු ලැබේ. තවද, මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන සහ අපනයන හවුල්කරුවන්, වෙළඳපළ ලක්ෂණ, ප්‍රධාන අපනයන ගමනාන්ත සහ අනෙකුත් රටවලට කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය සඳහා ඇති විභවයන් ද විමසා බලන ලදී.

■ පර්යේෂණ ප්‍රකාශන:

- ශ්‍රී ලංකාවේ දුම්කොළ වගාවෙන් ඉවත් වීමට ගොවීන් ගත් තීරණය අවබෝධ කර ගැනීම, නිමේෂා දිසානායක සහ මනෝජ් තිබ්බොටුවාව, සමුළුවේ වැඩසටහන, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ආර්ථික විද්‍යාඥයින්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද 10 වැනි ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව, පිටු. 101 - 107, 2022.

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- කෘෂිකර්ම අංශයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ පළාත් වැඩමුළුවල ඉදිරිපත් කිරීම්, නොවැම්බර් 9, 12, 13, 19, 22 සහ 23 (මනෝජ් තිබ්බොටුවාව).

1.6 පරිසරය, ස්වාභාවික සම්පත් සහ කාලගුණ විපර්යාස

ගෝලීය කාලගුණික විපර්යාස තුළින් නුදුරේදීම ඇතිවිය හැකි තර්ජන හේතුවෙන් අඩු කාබන් විමෝචනයක් සහ කාලගුණික ප්‍රත්‍යස්ථිතියක් සහිත සංවර්ධනයක් සිදුවීමේ අවශ්‍යතාවය පිළිබඳව අතිරේක වගකීමක් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළින් ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 10න් එකක් වශයෙන් හඳුනාගෙන ඇත්තේ 'තිරසර පාරිසරික කළමනාකරණය' යි. එයට අමතරව වී තුළින් විදුලිබල සහ බලශක්තිය, ජලය, ආපදා කළමනාකරණය සහ අලි මිනිස් ගැටුම ආශ්‍රිත ක්ෂේත්‍රයන් තුළ ප්‍රතිපත්ති මැදිහත්වීම් ගණනාවක් යෝජනා කරනු ලැබේ. පරිසරය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමේ ප්‍රමුඛ වැදගත්කමද මෙම රාමුව තුළින් අවධාරණය කරනු ලැබේ.

පරිසර සහ ස්වාභාවික සම්පත් ප්‍රතිපත්ති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය සඳහා **ශ්‍රී ලංකා ජාතික සිසිලන** ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමෙහි නිරත වන ලදි. ඉක්මනින් නරක් වන සුළු ස්වභාවය හේතුකොට ගෙන හුවමාරු අවස්ථාවලදී සහ ගබඩා කිරීමේදී ප්‍රමාණවත් සිසිලන පහසුකම් නොමැතිවීම තුළින් ආහාර හානි වීම අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම, දේශීය කෘෂිකර්මාන්තයේ සහ සත්ව පාලනයේ ඵලදායිතාවය ඉහළ නැංවීම, ශීත දාමය තුළ ඖෂධ සහ එන්නත් ආදියේ සාර්ථකත්වය සහතික කිරීම, අවකාශ සිසිලනයේදී තිරසර සිසිලන පද්ධති සහතික කිරීම, බලශක්ති කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සහ විකල්ප තාක්ෂණයන් ඒකාබද්ධ පද්ධති ප්‍රවේශයක් සමග සම්බන්ධ කිරීම, සහ ශ්‍රී ලංකාව තුළ තිරසර සහ කාලගුණ මිතුරු සිසිලන දාම නිර්මාණය කිරීම යනාදිය ජාතික සිසිලන ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ අභිමතාර්ථ විය.

පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ අරමුදල් භාවිතා කරමින් **ශ්‍රී ලංකා ජාතික පරිසර ප්‍රතිපත්තිය (NEP) 2003 යාවත්කාලීන කිරීමේ කටයුත්තෙහි** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නියුක්ත විය. මෙම කාර්යයේ සමස්ත අභිමතාර්ථය වූයේ ජාතික පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමත්, වී ඔස්සේ ශ්‍රී ලංකාවේ පරිසරය තිරසර අයුරින් කළමනාකරණය කිරීම කෙරෙහි වන ක්‍රියාකාරකම් සඳහා මගපෙන්වනු ලබන ඉහළම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය වශයෙන් එහි අදාලත්වය සහ එහි ස්ථාවරය නැවත ඇති කිරීමත්ය. පරිසර ක්ෂේත්‍රය තුළ ඇති වෙනස්වන ප්‍රමුඛතාවයන් සලකා බැලීමේදී ජාතික පරිසර ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමෙන් පසුව පැන නැගුණ නව ගැටලු සහ අනෙකුත් අදාල ප්‍රතිපත්ති මඟින් ආවරණය වනු ලබන ගැටලු ද්විගුණ වීම හේතු කොට ගෙන ජාතික පරිසර ප්‍රතිපත්තිය සමාලෝචනයට ලක් කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. ශ්‍රී ලංකාවේ පරිසරය ආශ්‍රිත ගැටලු / ප්‍රශ්න සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සඳහා මගපෙන්වනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛනය වන ජාතික පරිසර ප්‍රතිපත්තිය 2003 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශය මඟින් පිලියෙල කරන ලදී.


ශ්‍රී ලංකාව තුළ අලියන්ගේ බලපෑමෙන් ජීවනෝපාය රක්ෂණය කිරීම පිලිබඳව එක්සත් රාජධානියේ පරිසර සහ සංවර්ධන ජාත්‍යන්තර ආයතනය (IIED), සමඟින් සිදුකරන ලද තවත් අධ්‍යයනයක් තුළින් ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන රක්ෂණාවරණ ක්‍රමයක් සම්පාදනය කිරීම සඳහා පවත්නා හැකියාව ගවේෂණය කරන ලදී. ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව මිනිස් සහ අලි ජීවිත සැලකිය යුතු සංඛ්‍යාවක් අහිමි කරන සහ බෝග හානි හා දේපල හානි ඉතා විශාල ප්‍රමාණයකට හේතු වන ඉහළ යන අලි මිනිස් ගැටුම ආමන්ත්‍රණය කිරීම සඳහා රක්ෂණාවරණ ක්‍රමයක් සකස් කිරීම සහ අත්හදා බැලීම එහි අරමුණ විය.

මෙම ව්‍යාපෘති 2022 වර්ෂයේදී අවසන් කරන ලදී.

ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ අභියෝග සහ තිරසර විදුලි කර්මාන්තය: 2022 වන විට ආර්ථිකයේ තත්ත්වය පිළිබඳ චිරන්දනී පතිරාජ විසින් ලියන ලද පරිච්ඡේදය තුළින් අවධාරණය කරනු ලබන්නේ නවීන බලශක්ති සේවාවන් වෙත ප්‍රවේශය සැලසීම ශ්‍රී ලංකාව සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් වශයෙන් පවතින බවයි. බලශක්ති සැපයුම සහ පරිභෝජනය, බලශක්ති තීව්‍රතාවය සහ වී ආශ්‍රිත බාධක පිළිබඳ ඇතැම් කාලෝචිත ගැටලු මෙම පරිච්ඡේදය තුළින් සාකච්ඡා කරනු ලබන අතර විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ පිලිබඳ අවශ්‍යතාවයත් එමෙන්ම බලශක්ති ක්ෂේත්‍රෙය් කඩිනම් යටිතල පහසුකම් සංවර්ධනයන් පිලිබඳ අවශ්‍යතාවයත් මතු කරනු ලැබේ.

■ පර්යේෂණ ප්‍රකාශන:

- රසායනික පොහොර ආනයන සහ පරිසරය: **සම්මුතිවලට අදාළ වන හරිත ආර්ථිකය සඳහා වන සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශය**, අසංක විජේසිංහ, ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 9(1), පි. 117, 2022.



CHEMICAL FERTILIZER IMPORTS AND THE ENVIRONMENT: EVIDENCE-BASED APPROACH FOR A GREEN ECONOMY ACCOUNTING FOR THE TRADEOFF

A Wijesinghe

Sri Lanka Journal of Economic Research
Volume 9(1) December 2021
SLJER 09.01 P: pp. 117-130
Sri Lanka Forum of University Economists
DOI: http://doi.org/10.4038/sljer.v9i1.158

SLJER

Abstract

The direct and indirect impact of high-input use agriculture- popularised by the Green Revolution- on the environment is the major thrust of this perspective. The paper discusses an integrated approach to minimise the negative impacts, accounting for the proposed ban of synthetic fertilizers and the tradeoff between the environment and productivity resulting from such a ban.

Noteworthy stylised facts of the discussion are threefold. First, the Green Revolution reduced the growth of extensive expansion of agricultural lands via intensification, which subdued the pressure on forest cover. Additionally, productivity increase releases marginal lands for vital ecological services such as pollinator habitats. Second, synthetic fertilizer resulted in higher productivity in the agriculture sector, increasing the GDP and facilitating structural transformation. Given that a quarter of the workforce is in the agriculture sector, gradual movement of the labor force to the industrial sector is vital, while the agriculture sector workforce become self-reliant in facing environmental and climatic events. Thus, continuous investment in agricultural productivity growth should be a priority to create fiscal space for the investments in meaningful green initiatives and reduce the vulnerability of the rural poor. Third, evidence-based solutions such as site-specific fertilizer recommendations, soil testing, and discouraging overuse of nitrogenous fertilizer through tariffs should be practised to mitigate the adverse environmental impact of synthetic fertilizer, especially nitrogen fertilizer.

Complete removal of the subsidy may generate overreaching welfare and environmental ramifications, although it is widely suggested.

A Wijesinghe
Institute of Policy Studies of Sri Lanka, Sri Lanka
Email: asanka@ips.lk, Tel: 94 11 2143 100
https://orcid.org/0000-0001-8207-0720

117

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා:

- 'පැසිෆික් සංවර්ධන පර්යේෂණ' නැමති වැඩමුළුවේදී **පැපුවා නිව්ගිනියාවට ඵලදායී හරිත ප්‍රතිසාධන විසඳුම් ලබා දීමට UNREDD වැඩසටහනට හැකි වී තිබේද?** මාර්ගගත, සැප්තැම්බර් 27, (ලක්මිණි ප්‍රනාන්දු).

- 2022 - 2030 සඳහා වන ජාතික පරිසර පනත සහ ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම විමසීදැක්වීමේ අවස්ථාවේදී, **ජාතික පරිසර ප්‍රතිපත්තිය** (NEP) පිළිබඳ ඉදිරිපත් කිරීම, පරිසර අමාත්‍යාංශය, දෙසැම්බර් 19, (මනෝජ් තිබ්බොටුවාව).

- ඒකාබද්ධ කඳුවැටි සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICIMOD) විසින් සංවිධානය කරන ලද, 'දකුණු ආසියාවේ වනාන්තර ප්‍රතිසංස්කරණ ආර්ථික විද්‍යාව' පිළිබඳ ව්‍යාපෘති රැස්වීම සහ ක්ෂේත්‍ර චාරිකාව (නේපාලය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය සහ පකිස්ථානය), කත්මණ්ඩු, නේපාලය දෙසැම්බර් 14 - 19, (චිරන්දතී පතිරාජ)

කාලගුණ විපර්යාස

"කාලගුණය සහ තිරසරභාවය: කෘෂිකර්මයේ අනාගතය" පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය තුලින් SOUTHERN VOICE සංවිධානය 'කාලගුණය සඳහා අනුවර්තනය වීම තුළ තාරුණ්‍යය: ශ්‍රී ලංකාව තුල තිරසර කෘෂිකර්මයක් කෙරෙහි ගමන් කිරීම' පිලිබඳව පරීක්ෂා කරනු ලැබේ. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා බලපෑම් කිරීමේදී තරුණයින්ගේ නියුක්තවීම පිළිබඳ විවිධ මාර්ග සකස් කිරීම, ඔවුන්ගේ හඬ නැගීමට අවස්ථා සැලසීම, තරුණයින් සඳහා වන අනුගතවීමේ පිලිවෙත් , අනුගතවීමේ ක්‍රියාමාර්ග සඳහා තරුණයින් අතර ශක්‍යතා වර්ධනය, තරුණයින් අතර දැනුවත්භාවය ඇති කිරීම සහ ඒ ඔස්සේ දේශපාලන සහ සමාජීය ක්‍රියාවලීන් තුළ තරුණයින්ගේ සහභාගිත්වය සඳහා ඉඩකඩ නිර්මාණය කිරීම යනාදිය පිළිබඳ නිර්දේශ මෙම අධ්‍යයනය තුලින් ඉදිරිපත් කරනු ලැබේ.

'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022' නැමති වාර්තාවෙහි **'කාලගුණික විපර්යාස සහ පාරිසරික හායනය: චක්‍රීය ආර්ථික විකල්ප'** පිළිබඳ ප්‍රතිපත්ති සංක්ෂිප්තයක දී රුවන් සමරවීර ඉහළ යන දරිද්‍රතාවය සහ අසමානතාවයන් හා බලශක්ති හිඟය වැනි ආර්ථික අර්බුදයේ සමුච්චිත බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා යෝග්‍ය වූ විසඳුම් ඉදිරිපත් කිරීමට වර්තමාන ආර්ථික පද්ධතිය අසමත් වනු ඇති බව පෙන්වා දෙයි. කාලගුණික විපර්යාස සහ පාරිසරික හායනය සඳහා හේතු වන ප්‍රේරක හා ඒවායේ ප්‍රතිඵල මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය තුලින් සාකච්ඡා කරනු ලබන අතර, සම්පත් භාවිතාව පිලිබඳ කාර්යක්ෂමතාවයන් ඉහළ නැංවීම සඳහා ප්‍රතිභාවිතය, ප්‍රති නිෂ්පාදනය, ප්‍රතිචක්‍රීකරණය සහ ප්‍රතිසාධනය පිලිබඳ මූලධර්මය ප්‍රවර්ධනය කිරීම ඔස්සේ තිරසර පරිභෝජනයක් අත්පත් කර ගැනීම උදෙසා වන මාර්ගය වන්නේ චක්‍රීය ආර්ථික ආකෘතියක් වෙත සංක්‍රමණය වීම බව ඔයින් පෙන්වා දෙයි.

■ ප්‍රතිපත්ති කමිටු:

- **ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස බලපෑම් සඳහා ජාතික අනුවර්තන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව**, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය.

- **ප්‍රතිපත්ති සහාය තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම,** 'ශ්‍රී ලංකාවේ කර්මාන්තවල දේශගුණ ප්‍රතිචාර කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය', කර්මාන්ත අංශය තුළ 'ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් නීර්ණය කළ දායකත්වයන්' කියාත්මක කිරීම සඳහා සහාය වීම, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) සමග එක්ව පරිසර අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, (චිරන්දතී පතිරාජ)

■ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා

- උපාධි අපේක්ෂකයින් සඳහා පවත්වන ලද, **දේශගුණ විපර්යාස සහ තිරසාර සංවර්ධන ඉලක්ක** පිළිබඳ ආරාධිත දේශනය, ආර්ථික විද්‍යා අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මාර්තු 24 (රුවන් සමරවීර).



- 'ඔරොත්තු දීම වැඩිදියුණු කිරීම සඳහා අවස්ථා' පිළිබඳ කලාපීය දේශගුණ දත්ත සම්මන්ත්‍රණයේදී **'දේශගුණික තොරතුරු හිදැස් සම්පූර්ණ කිරීම: ඒකාබද්ධ දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතිය'** පිළිබඳ ඉදිරිපත් කිරීම, හින්දු කුෂ් හිමාලය, ඩකා, බංග්ලාදේශය, ඔක්තෝබර් 12 සහ 13 (රුවන් සමරවීර).



- දකුණු ආසියානු අධ්‍යයන ආයතනය සහ ශ්‍රම සංචලනය සහ සංක්‍රමණිකයන් සඳහා වන දකුණු ආසියා මධ්‍යස්ථානය ඒකාබද්ධව සංවිධානය කරන ලද, දේශගුණ විපර්යාස වැඩසටහනේ **ගෝලීය දකුණේ දේශගුණ ප්‍රතිරෝධය** පිළිබඳ සමාරම්භක වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, ඔක්තෝබර් 13 (මනෝජ් තිබ්බොටුවාව).



- **COP27: ගැටළු, නඩාය පත්‍රය සහ අපේක්ෂාවන්** පිළිබඳ වෙළඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය පිළිබඳ දකුණු ආසියා රැකවල පිළිබඳ අන්තර්ජාල සම්මන්ත්‍රණයෙහි විද්වත් මණ්ඩල සාමාජික, මාර්ගගත, ඔක්තොම්බර් 20 (චිරන්දතී පතිරාජ).



පර්යේෂණ කාර්ය මණ්ඩලය



දුෂ්නි වීරකෝන්
BSc (බෙල්ෆාස්ට් ක්වීන්ස් විශ්වවිද්‍යාලය),
MA, PhD (මැන්චෙස්ටර්),
විධායක අධ්‍යක්ෂ



නිශා අරුණාතිලක
BSc (ඇමරිකා එක්සත් ජනපද දකුණු විශ්වවිද්‍යාලය),
MA, PhD (ඩ්‍යුක්)
පර්යේෂණ අධ්‍යක්ෂ



ගංගා තිලකරත්න
BA (මැන්චෙස්ටර්)
MPhil (කැන්ටබ්), PhD (මැන්චෙස්ටර්)
පර්යේෂණ සාමාජික



බිලේෂා වීරරත්න
BA (කොළඹ)
MA (රට්ගර්ස්), PhD (CUNY)
පර්යේෂණ සාමාජික



මනෝජ් තිබ්බොටුවාව
BSc, MSc (පේරාදෙණිය)
PhD (බටහිර ඕස්ට්‍රේලියාව),
පර්යේෂණ සාමාජික

පර්යේෂණ කාර්ය මණ්ඩලය



අසංක විජේසිංහ
BSc (පේරාදෙණිය)
MS (දකුණු දකෝටා ප්‍රාන්තය),
PhD (ඕහියෝ ප්‍රාන්තය),
පර්යේෂණ සාමාපික



එරන්දතී පතිරාජ
BSc, MPhil (පේරාදෙණිය),
PhD (මෙල්බර්න්), ආචාර්ය උපාධිය (මෙල්බර්න්)
පර්යේෂණ සාමාපික



ලක්මිණී ප්‍රනාන්දු
BSc (පේරාදෙණිය)
MDevEcon (ක්වීන්ස්ලන්තය),
PhD (ඇඩිලේඩ්),
පර්යේෂණ සාමාපික



ප්‍රියංකා ජයවර්ධන
BSc (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යා විශේෂඥ



සුනිමලී මදුරාවල
BA (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යා විශේෂඥ



ඩිලානි හිරිමුතුගොඩගේ
BA (කොළඹ)
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යා විශේෂඥ



අශානි අබයසේකර
BA (පේරාදෙණිය)
MA (ANU)
පර්යේෂණ ආර්ථිකවිද්‍යා විශේෂඥ



නිමේෂා දිසානායක
BSc (ගෞරව) (පේරාදෙණිය)
පර්යේෂණ නිලධාරී



රුවන් සමරවීර
BSc (ලෑව වෙල්ලස්ස)
පර්යේෂණ නිලධාරී



බිනුර සෙනෙවිරත්න
BSc (යෝර්ක්), MSc (ANU)
පර්යේෂණ නිලධාරී



ලක්ෂිලා වනිගසිංහ
BA (SIUC)
MSc (SIUC)
පර්යේෂණ නිලධාරී



කිමුතු කිරින්ගොඩ
BA (කොළඹ), LLB (ලන්ඩන්)
පර්යේෂණ සහකාර



ඌෂා පෙරේරා
BA (කොළඹ)
පර්යේෂණ සහකාර



පියුමි රණදේව
BSc (වයඹ)
පර්යේෂණ සහකාර



මනීෂා වීරද්දන
BA (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



හිමානි විතානගේ
BA (කොළඹ), BSc (LSE)
පර්යේෂණ සහකාර



චායා දිසානායක
BSc (යාපනය)
පර්යේෂණ සහකාර



රමේෂා නිලුපුලී රත්නායක
BA (කොළඹ), MSc (නොටින්හැම්)
පර්යේෂණ සහකාර



සුලෝචනා සිල්වා
BSc (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර

සහාය කාර්ය මණ්ඩලය



ගයනි කල්දේරා
ACA, BSc (ජයවර්ධනපුර)
අධ්‍යක්ෂ - මුදල් සහ පරිපාලන



නන්දක පොතුවැව
BSc (කැලණිය)
තොරතුරු පද්ධති ප්‍රධානී



ඩිනාලි පෙරේරා
කළමනාකරු - ප්‍රකාශන සහ විශේෂ අවස්ථා



දිලිනි ගල්කැටිය
කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලන



නිමිනා ද සිල්වා
ගණකාධිකාරී



නාලක ලියනපතිරණ
වෙබ් කළමනාකරු සහ පද්ධති පරිපාලක



ගිත්මා චන්ද්‍රසේකර
කළමනාකරු - සන්නිවේදන සහ උපාය මාර්ගික ප්‍රවේශය



තුවාන් බංසජයා
පහසුකම් කළමනාකරණ නිලධාරී



ගයේන්ද්‍රි කරුණාරත්න
සංස්කාරක



අමේෂ් තෙන්නකෝන්
ප්‍රකාශන නිලධාරී



නිල්මිණි ද අල්විස්
රහස්‍ය ලේකම්



නයෝමි ජයකොඩි
පරිපාලන සහාය නිලධාරී



විශාකා නර්මදා
සහකාර ප්‍රස්තකාලයාධිපති



මධුෂා හෙට්ටිආරච්චි
මුදල්/පරිපාලන සහකාර



තිලංකා ප්‍රසාදි
ප්‍රස්තකාල සහකාර



දිනිති උපේක්ෂා
ගිණුම් සහකාර



බර්නඩෙට් ප්‍රබාලෝජිනි
පෙරටු කාර්යාල සම්බන්ධීකාරක

සහාය කාර්ය මණ්ඩලය



ජී.ආර්. වික්‍රමසේන මහතා

රියදුරු/කාර්යාල සහායක



එච්.එස්. උදයකාන්ත මහතා

රියදුරු/කාර්යාල සහායක



නිහාල් වසන්ත මහතා

රියදුරු/කාර්යාල සහායක



පී.යූ.කේ. රාජසිරි මහතා

රියදුරු/කාර්යාල සහායක

සහාය සේවා

මුදල් සහ පරිපාලනය

මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන සහ ප්‍රසම්පාදන සේවා සැපයීම ඔස්සේ පර්යේෂණ ඒකකයන්හි ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට හා සහයෝගය දැක්වීමට මුදල් සහ පරිපාලන ඒකකය ස්ථාපිත කොට ඇත.

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ මූල්‍ය කාර්යසාධනය රු. මි. 50.4 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. රු. මිලියන 247.5 ක සමස්ත ආදායම, ව්‍යාපෘති ආදායම් (43%), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) ආයෝජන භාර අරමුදලෙන් එකතු වූ මුදල් (29%), පොලී ආදායම (27%) සහ වෙනත් විවිධ ආදායම් (1%) වලින් සමන්විත විය.

2022 වර්ෂයේදී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පර්යේෂකයින් 07 දෙනෙකුට සහ සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් 5 දෙනෙකුට සමු දුන් අතර, ආයතනය සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයන් 11 දෙනෙකු බඳවා ගන්නා ලදී.

ආයතනික පාලනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලන ව්‍යුහය සමන්විත වන්නේ පාලක මණ්ඩලයකින් ("IPS අධ්‍යක්ෂ මණ්ඩලය"), විධායක අධ්‍යක්ෂවරයාගෙන් සහ කළමනාකරණ කමිටු වලිනි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගේ පත්කිරීම් සහ වගකීම් 1988 අංක 53 දරණ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන (IPS) පනත තුළ නිර්වචනය කොට ඇත. ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ සහ කාර්යසාධනය පිළිබඳ කටයුතු මෙහෙයවීමේ වගකීම දරනුයේ විධායක අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ කමිටු විසිනි.

සෑම වසරක් ආරම්භයේදී ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රැස්වීම් පැවැත්වීමේ වැඩසටහනක් පිළිබඳ එකඟතාවයකට එළඹෙන අතර, අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්වීම සිදු වේ. එසේ ම අවශ්‍ය අවස්ථාවලදී අතිරේක රැස්වීම් කැඳවීමද සිදු වේ. වාර්ෂික සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සහ එකඟතාවයකට එළඹීම සඳහා සෑම වර්ෂයකම ආරම්භයේදී විධායක අධ්‍යක්ෂකවරයා විසින් සියලු කමිටු රැස්වීම් කැඳවනු ලබන අතර, ප්‍රගතිය අධීක්ෂණය කිරීම උදෙසා කාර්තුමය වශයෙන් රැස්වීම් කැඳවීමේ වගකීම දරනු ලබන්නේ එක් එක් කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විසිනි.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සහ ත්‍රෛවාර්ෂික ආයතනික සැලැස්මක් පිළියෙල කොට අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මන්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. අයවැයගත පිරිවැය හා සාපේක්ෂව අත් කර ගනු ලබන ප්‍රගතිය කාර්තුමය පදනමක් මත සමාලෝචනයට ලක් කොට වාර්තා කරනු ලැබේ.

විගණන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි (IPS) විගණන කමිටුව ආයතනික කළමනාකරණය, රාජ්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය යන ක්ෂේත්‍රයන් තුළ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුව ද කාර්තුමය වශයෙන් රැස් වේ. අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩ පදනමකින් ක්‍රියාත්මක වනු ලබන අතර, විගණන ඔස්සේ අනාවරණය කරනු ලබන සියලුම කරුණු කාර්තුමය පදනමක් මත සාකච්ඡාවට ලක් කරමින්, ඇති විය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගැනීමත්, එවන් අවදානම් තත්ත්වයන් අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීමත් සිදු වේ.

විගණන කමිටුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වශයෙන් ක්‍රියාත්මක වනු ලබන අතර, විගණන කමිටු රැස්වීම් වල කාර්යසටහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කරනු ලැබේ.

ආයෝජන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) ආයෝජන කමිටුවේ සභාපතිත්වය බැංකුකරණ ක්ෂේත්‍රයේ වෘත්තියවේදියෙකු වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් දරනු ලැබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) කළමනාකාරිත්වයේ සාමාජිකයන් සමගින් ආයෝජනය විෂය පිළිබඳ ප්‍රවීණයකු වන ස්වාධීන සාමාජිකයෙකුද මෙම කාරක සභාව තුළ කටයුතු කරනු ලැබේ. කාරක සභාව ද්වි වාර්ෂික වශයෙන් රැස් වන අතර අවශ්‍ය අවස්ථාවලදී අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ.

අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) විසින් ස්වකීය අභ්‍යන්තර සහ බාහිර වටපිටාවන් තුළින් පැහැනැගීමේ විභවතාවයක් පවතින අවදානම් තත්ත්වයන් ගණනාවක් පිලිබඳව කරුණු සොයා බලන අතර ව්‍යුහාත්මක සහ පූර්ව ක්‍රියාකාරී ආකාරයකින් මෙම අවදානම් තත්ත්ව හඳුනාගැනීමේ, මැන බැලීමේ සහ කළමනාකරණය කිරීමේ වැදගත්කම අවබෝධ කරගනු ලැබේ. ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටියේ අභිමතාර්ථය වන්නේ ආයතනික ඉලක්ක අත්පත් කර ගැනීම තුළදී වී සඳහා අවිනිශ්චිතතාවයන්ගෙන් බාධාවක් ඇති නොවීමට වග බලා ගැනීමයි. අවදානම් කළමනාකරණය පිලිබඳ අවසන් වගකීම සහ අධීක්ෂණ කාර්යභාරය දරනු ලබන්නේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මන්ඩලය විසිනි. සමස්ත අවදානම් පිළිබඳ ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) අධ්‍යක්ෂ මන්ඩලයට වී වෙනුවෙන් වෙන් වූ කළමනාකරණ කමිටුවේ සහයෝගය සැලසෙනු ලැබේ.


ඇතිවීමේ විභවතාවයක් පවතින අවදානම් තත්ත්ව සහ ප්‍රධාන අවදානම් අවම කිරීම සඳහා වන ප්‍රවේශ

මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම, මූල්‍ය අවදානම, අනුකූලතා අවදානම සහ තරඟකාරීත්ව අවදානම, මානව සම්පත් ආශ්‍රිත අවදානම, තොරතුරු තාක්ෂණ අවදානම යනාදිය ආයතනය කෙරෙහි ඇති වීමේ ඉඩකඩක් පවතින ප්‍රධාන අවදානම් තත්ත්වයන් වශයෙන් ආයතනය විසින් පොදුවේ හඳුනාගෙන ඇත.


අවදානම් වර්ගය	අවදානම අවම කිරීම සඳහා වන ප්‍රවේශ
මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම	• ඉලක්කගත සන්නිවේදන ක්‍රමෝපාය සහ මෙවලම් ඔස්සේ ස්වකීය ප්‍රධාන පාර්ශ්වකරුවන්ට සමීප වීම • තොරතුරු තාක්ෂණ සහ අනෙකුත් ආශ්‍රිත සහාය සේවාවන්හි සාධනීයභාවය ඇගයීමට ලක් කිරීම • අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන පැවැත්වීම සහ කාර්තුමය පදනමක් මත විගණන වලින් අනාවරණය කරගනු ලබන කාරණා සමාලෝචනයට ලක් කිරීම • වාර්ෂික පදනමක් මත බාහිර විගනන පැවැත්වීම සහ ඒවායේදී අවධාරණය කරනු ලබන කිසියම් විශේෂ කාරණා වේ නම් ඒවා සමීපව සමාලෝචනය කිරීම • ආයතනයේ සියලු දේපල සම්බන්ධයෙන් පුළුල් රක්ෂණ ආවරණයක් පවත්වා ගැනීම • සේවකයන්ගේ රෝහල්ගත කිරීම් සහ බරපතල රෝගාබාධ සඳහා රක්ෂණාවරණයක් සැපයීම
මූල්‍ය අවදානම	• මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම වනම්, 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැතිවීමේ තත්ත්වයක් මත පර්යේෂණ ප්‍රදාන සහ පොලී ආදායම ඉහළ නංවාගැනීම • ණය අවදානම අවම කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක් තුළ ආයතනයේ ආයෝජන කළඹ පවත්වා ගෙන යාම • කලින් කලට අයවැය පාලන සහ අධීක්ෂණ අපගමන සිදු කිරීම • බාධාවීමකින් තොරව ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා ද්‍රවශීල අරමුදල්වල (Liquid funds) ප්‍රමාණවත්භාවය සහතික කරමින් ආයතනයේ මූල්‍යමය ස්ථාවරය අඛණ්ඩවම අධීක්ෂණයට ලක් කිරීම • ආයෝජන තීරණ පිළිබඳ අවසන් තීරණයකට එළඹීමට ප්‍රථම විවිධ ආයෝජන ඇගයුම් තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම
අනුකූලතා අවදානම	• අදාල නියාමන ආයතන වෙත ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ ඒවායේ දී ගොනුගත කිරීමට අවශ්‍ය ලේඛන යනාදිය පිළිබඳව අඛණ්ඩව අධීක්ෂණය කිරීම
තරඟකාරීත්ව අවදානම	• අනෙකුත් තරඟකාරී පර්යේෂණ ආයතන සමඟ සන්සන්දනාත්මකව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මාධ්‍ය දෘශ්‍යතාවය අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම.
මානව සම්පත් ආශ්‍රිත අවදානම	• ගැලපෙන සුදුසුකම් සහිත කාර්යමණ්ඩලය බඳවාගැනීම සහ රඳවා ගැනීම • සේවක අගය ප්‍රස්තුතය සවිමත් කිරීම • පුහුණු සහ සංවර්ධන කටයුතු සඳහා අඛණ්ඩවම ආයෝජනය කිරීම • උසස් අධ්‍යාපනය සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම වැනි ආකාරයෙන් වෘත්තීයමය අභිවෘද්ධිය අත්පත් කරගැනීම උදෙසා අවස්ථා සැලසීම (PhD ආචාර්ය උපාධි හෝ MPhil දර්ශනපති) • සේවක නියුක්ත වීම ඉහළ මට්ටමෙන් පවත්වා ගැනීම • වාර්ෂික කාර්යසාධන සංවර්ධන සමාලෝචන (PDRs) සිදු කිරීම • පැමිණීම සහ නිවාඩු මෙන්ම පර්යේෂණ සහ සහාය කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා කාලය වෙන් කිරීම යන කාරණා කලමනාකරණය කිරීම සඳහා HRIS පද්ධතියක් භාවිතා කිරීම
තොරතුරු තාක්ෂණ අවදානම	• තොරතුරු තාක්ෂණ පද්ධතියක් සහ අන්තර්ජාල ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම • තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම • ආයතනය තුළ පවත්නා මධ්‍යගත තොරතුරු ගබඩා කළමනාකරණ පද්ධතියක් සහ ආයතනයෙන් බාහිර ක්ලවුඩ් අවකාශ කළමනාකරණ පද්ධතියක් (offsite cloud storage backup management system) ක්‍රියාත්මක කිරීම • වාර්ෂික තොරතුරු තාක්ෂණ ආරක්ෂක විගණන හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම

මූල්‍ය විශේෂ අවස්ථා - 2013 - 2022

ආදායම, වියදම සහ අතිරික්තය



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආදායමෙහි සංයුතිය



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදනය සහ ජනවිහිදුම්කරණය

සන්නිවේදන මාර්ග සාධනීය අයුරින් භාවිතා කිරීම ඔස්සේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ පිලිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීම සහ ජනවිහිදුම්කරණ වැඩසටහන් පුළුල් කිරීම ආයතනයේ එක් ප්‍රධාන අභිමතාර්ථයක් වේ. පළ කිරීම්, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, විශේෂ අවස්ථා සහ සංවාද වැනි විවිධ මාධ්‍ය ඔස්සේ දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මහජනතාව වෙත ස්වකීය බහුමාන (විවිධ පැතිකඩ ගත්) පර්යේෂණ ක්‍රියාකාරකම් පිලිබඳ තොරතුරු බෙදා හැරීම මෙයට ඇතුලත් වේ. තවද, විවිධ ඉලක්කගත ප්‍රේක්ෂකයන් වෙත ළඟාවීම අරමුණු කරගනිමින් විවිධ මාධ්‍ය වේදිකාවන් ඔස්සේ පුවත්පත් නිවේදන, ලිපි සහ සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණ වලින් අනාවරණය කරගනු ලබන කරුණු සහ තොරතුරු ප්‍රචාරණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් නිරන්තරයෙන්ම සිදු කරනු ලැබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් 2022 වර්ෂයේදී පළ කිරීම් 5 ක් සිදු කරන ලද අතර, 'ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්ත්වය 2022' නමැති ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව ද ඒ අතර වේ. 'ටෝකිං ඉකොනොමික්ස්' නැමති ආයතනයේ නිල බ්ලොග් අඩවිය තුළ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් බ්ලොග් 23 ක් නිර්මාණය කොට ඇති අතර, ඒවා වැඩි වශයෙන් කියවනු ලබන පුවත්පත් තුළ සහ අන්තර්ජාල පුවත් අඩවි තුළ පළ කොට ඇත. එයට අමතරව, ලිපි 20 ක් පළ කිරීම මගින් සහ සැලකිය යුතු කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් ගෝලීය වේදිකාවන් තුළ පෙනී සිටීම ඔස්සේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අඛණ්ඩවම ජාත්‍යන්තර වශයෙන්ද ස්වකීය කටයුතු ප්‍රසිද්ධියට පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති වාද විවාද වලට දායකත්වය සැලසීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් මුද්‍රිත, විකාශන සහ විද්‍යුත් මාධ්‍ය සමග සම්මුඛ සාකච්ඡා හයකට පෙනී සිටින ලදී. ආකර්ෂණීය අන්තර්ගතයන් සමගින් නිතිපතා යාවත්කාලීන කරන ලද ෆෙස්බුක්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, ලින්ක්ඩ්ඉන් සහ යූටියුබ් පිටු සමගින් 2022 වර්ෂයේ සිට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සමාජ මාධ්‍ය ක්‍රියාකාරිත්වය වඩා පුළුල් විය. මෙම ආයතනය විශේෂයෙන් ට්විටර් ජාලය ඔස්සේ වඩාත් සක්‍රිය වූ අතර මෙම පුළුල් සමාජ මාධ්‍ය ජාලය භාවිතා කරමින් විශේෂ අවස්ථා පිළිබඳ සජීවී යාවත්කාලීන තොරතුරු පළ කිරීමටත් ඒ ඔස්සේ සැලකිය යුතු ආකර්ෂණයක් දිනාගැනීමටත් සමත් විය.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය 2022 වර්ෂයේදී අති ප්‍රමුඛ අවධානයකට ලක් වූ කාරණයක් විය. ආයතනයේ පර්යේෂණ සහ ප්‍රචාරණය තුලදී අවධානය යොමු කරන ලද එක් ප්‍රධාන තේමාවක් වූයේ, ශ්‍රී ලංකාව මුහුණ දෙනු ලබන පෙර නොදුටු විරූ ආකාරයේ ආර්ථික අර්බුදය සහ ගෝලීය වශයෙන් පවත්නා ඉක්මනින් වෙනස්වන සුළු ආර්ථික හා දේශපාලන වටපිටාව මධ්‍යයේ ආර්ථික ස්ථාවරත්වය සහ ප්‍රතිසාධනය ඇතිකිරීම යි. 2022 වර්ෂයේ සිදුවූ තවත් එක් ප්‍රධාන සිදුවීමක් වූයේ 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022' වාර්තාව නිකුත් කිරීමයි. තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අන්තර්ජාලය ඔස්සේ සිදුකරන ලද ප්‍රචාරණ සම්මන්ත්‍රණ තුනක් සහ ව්‍යාපෘති ප්‍රාරම්භ වැඩ මුළු හතරක් සඳහා සත්කාරකත්වය සපයන ලදී. ඒ ආකාරයට ආයතනය විසින් ස්වකීය ප්‍රමුඛ පර්යේෂණ සමගින් පුළුල් පරාසයකට අයත් පාර්ශ්වකරුවන් පිරිසක් වෙත ළඟා වීමට සමත් වී ඇත.

තොරතුරු පද්ධති ඒකකය (ISU)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති ඒකකය විශිෂ්ඨත්වයේ කලාපීය කේන්ද්‍රයක් ලෙස ආයතනයේ තරඟකාරිත්වයට සහාය වෙමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තොරතුරු පද්ධති ඒකකය මෘදුකාංග, සන්නිවේදනය, දෘඩාංග, ජාලකරණය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් සංවර්ධනය, තොරතුරු බෙදා හැරීම සහ දත්ත සංචිත සංවර්ධනය කිරීම ඇතුළු තොරතුරු පද්ධතිවල විවිධ අංශ කළමනාකරණය කිරීමේ වගකීම දරයි. මෙම කාර්යයන් සාමූහිකව, කාර්යක්ෂම ලෙස මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සහ ආයතනයේ සාර්ථකත්වයට ඉවහල් වේ.

2022 වර්ෂයේ දී තොරතුරු පද්ධති ඒකකය අන්තර්ජාල තොරතුරු පද්ධතියේ ධාරිතාවයන් වැඩිදියුණු කරන නව සේවාදායක පද්ධතියක් ක්‍රියාත්මක කළේය. මෙම වැඩිදියුණු කිරීම පහත සඳහන් කාර්යයන් ඇතුළුව විවිධ පහසුකම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හේතු විය:

අතථ්‍ය පුද්ගලික ජාල (VPN) පද්ධතිය: ආයතනයේ ජාල සම්පත් වෙත ආරක්ෂිත දුරස්ථ ප්‍රවේශයක් සපයා දීම පිණිස සහ නිවසේ සිට රාජකාරි කිරීම සඳහා පහසු ක්‍රම සපයා දීම පිණිස ඒජඤ පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී රාජකාරි ඉටුකරන විට පවා බාධාවකින් තොරව

ඵලදායිතාවය සහතික කරමින් දුරස්ථ ලෙස අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට කාර්ය මණ්ඩලයට ඉඩ සලසන තාක්ෂණයන් සහ මෙවලම් ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් වේ.

වීඩියෝ සම්මන්ත්‍රණ: තොරතුරු පද්ධති ඒකකය Zoom තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන රැස්වීම් වැනි වීඩියෝ සම්මන්ත්‍රණ විසඳුම් භාවිතා කිරීම සඳහා පහසුකම් සලසා දී ඇත. වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය අන්තර්ජාලය ඔස්සේ අතථ්‍ය රැස්වීම් පැවැත්වීමට, හවුල්කාරිත්වයන්ට සහ ඉදිරිපත් කිරීම් සිදුකිරීමට පහසුකම් සලසමින් සන්නිවේදනය වැඩිදියුණු කරන බැවින් සහභාගීවන්නන් පෞද්ගලිකව පැමිණ රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවය අඩු කරයි.

මෙම ජයග්‍රහණවලට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2023 වර්ෂයේ දී ස්වකීය ජාල පද්ධති වැඩිදියුණු කිරීමට ද සැලසුම් කරයි. විශ්වාසනීය හා කාර්යක්ෂම සන්නිවේදනය, දත්ත හුවමාරුව සහ ආයතනය තුළ තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඉතා වැදගත් වන මෙම ජාල වැඩිදියුණු කිරීම මගින් සමස්ත ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ ඇති කැපවීම පෙන්නුම් කරයි.


තොරතුරු පද්ධති ප්‍රගාමී ලෙස කළමනාකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය තරඟකාරිත්වය පවත්වා ගනිමින් කලාපීය විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන බව තොරතුරු පද්ධති ඒකකය විසින් සහතික කරයි. මෙම ප්‍රයත්නයන් මගින් ආයතනයේ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය වන කාර්යක්ෂම කාර්ය ප්‍රවාහය, ඵලදායී සන්නිවේදනය සහ විවිධ මාර්ගගත ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසා දෙයි.

පුස්තකාලය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය මගින් ස්වකීය පර්යේෂණ සහ සහාය කාර්ය මණ්ඩලය වෙතත්, සේවා සපයනු ලබන බාහිර පරිශීලකයකන් වෙතත් තොරතුරු සපයනු ලැබේ. රට තුල පැවති වාතාවරණය සැලකිල්ලට ගනිමින් 2022 වසරේදී ප්‍රධාන අවධානය යොමුවී පැවතියේ පුස්තකාලය ඩිජිටල්කරණයට ලක් කිරීම සහ අන්තර්ජාල ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල සේවා අඛණ්ඩව පවත්වාගැනීම කෙරෙහිය. මෙහිදී JSTOR ඇතුළු විද්‍යුත් පුවත්පත් සහ විවිධ දත්ත ගබඩා වෙත ප්‍රවේශය සැලසීමද අඛන්ඩව සිදු විය. එසේම, දෛනික පුවත්පත් වල මුද්‍රිත පිටපත් මිලදී ගැනීම නවතා දමා ඒ වෙනුවට දෛනික පුවත්පත් වල විද්‍යුත් පුවත්පත් පිටපත මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

එසේම මෙම පුස්තකාලය මගින් ස්වකීය පරිශීලකයකන් එදිනෙදා කටයුතු පිලිබඳ නවතම තොරතුරු ලබාගැනීම සිදු කරන අතර කලින් කලට ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය අතර නවතම තොරතුරු ආදිය සංසරණය කරනු ලැබේ. පුස්තකාල අන්තර්ජාලය (intranet), OPAC සහ ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා හා ඩිජිටල් පුස්තකාල පිලිබඳව කාර්ය මණ්ඩලය තුල දැනුවත්භාවයක් සහ හුරු පුරුදු බවක් ඇති කිරීම සඳහා එමගින් අධ්‍යාපන ක්‍රියාකාරකම් වල නිරත වනු ලැබේ. “Mendeley Reference Management Software” මෘදුකාංගය භාවිතා කරමින් විමර්ශන කටයුතු කළමනාකරණය කරනුයේ කෙසේද යන්න පිළිබඳව වැඩමුළුවක් පුස්තකාලය සහ ආයතනයේ තාක්ෂණ පුහුණු කමිටුව විසින් සාමූහිකව සංවිධානය කරන ලද අතර මෙම වැඩසටහන පවත්වන ලද්දේ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ආචාර්ය අනෝමා වීරකෝන් විසිනි. එසේම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සඳහා අලුතින් සම්බන්ධ වන කාර්ය මන්ඩලය විසින් පුස්තකාලය වඩා හොඳින් භාවිතා කරනු ලැබීම සහතික කිරීම සඳහා හුරු කරවීමේ ආරම්භක පුහුණු පවැත්වීමේ කටයුත්තද පුස්තකාලය විසින් ආරම්භ කරන ලදී. එසේම, එමගින් අන්තර්-පුස්තකාල ණය (ILL) සහ ලේඛන බෙදා හැරීමේ (DD) ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් සඳහා ද එමගින් ප්‍රතිචාර දක්වා ඇත. 2023 වර්ෂය සඳහා පුස්තකාල ඩිජිටල්කරණය කිරීමේ ප්‍රමුඛතාවයන් අඛණ්ඩව සිදුකිරීම මෙන්ම පුස්තකාල හා තොරතුරු සේවා පිලිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමද එළඹෙන වර්ෂය සඳහා වන අනෙකුත් ප්‍රමුඛතාවයන් වේ.

ප්‍රකාශන - 2022




"ත්‍රිරෝද ආකර්ෂණයක්: ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි ත්‍රිරෝද රථ රියදුරන් පිළිබඳ විශ්ලේෂණයක්", "කාලීන පත්‍රිකා ප්‍රකාශනමාලා" අංක 72, ජනවාරි

(තිසලි ද සිල්වා)




"දකුණු ආසියානු රටවල ගෝලීය වටිනාකම් දාම සහභාගීත්වය කෙරෙහි වෙළඳ ප්‍රතිපත්ති බලපෑම්: බංග්ලාදේශ-ශ්‍රී ලංකා වෙළඳ සාකච්ඡා සඳහා වන ඇඟවීම්", ජාත්‍යන්තර ආර්ථික පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 14, මාර්තු.

(අසංක විජේසිංහ සහ චතුර්ධිකා යෝගරාජා)



"සංවර්ධනය වූ නාගරික ප්‍රවාහන පද්ධතියක් කරා: ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම්", "කාලීන පත්‍රිකා ප්‍රකාශනමාලා" අංක 73, ජූනි.

(බිලේෂා වීරරත්න සහ චතුර්ගා කරුණානායක)



"නිවසේ සිට රාජකාරි කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තියේ ජයග්‍රාහකයින් සහ පරාජිතයින්", කම්කරු හා සංක්‍රමණ පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 28, අගෝස්තු.

(සුරේෂ් රණසිංහ සහ නිශා අරුණතිලක)




"ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2022" හි "අර්බුදයේ සිට ප්‍රතිසාධනය දක්වා: තිරසාර සංවර්ධන ඉලක්ක ඔස්සේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙහෙයවීම", පිළිබඳ වාර්තාව, ඔක්තෝබර්.
(ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පර්යේෂණ කණ්ඩායම)

අභ්‍යන්තර සම්මන්ත්‍රණ

"කොවිඩ්-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාවේ එළවළු වෙළඳපොළේ අවකාශීය ඒකාබද්ධ කිරීම", නිමේෂා දිසානායක, පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, ජනවාරි 27



"කොවිඩ්-19 වසංගතය අතරතුර පුද්ගලික ඉගැන්වීම් සඳහා ඇති ඉල්ලුම: ශ්‍රී ලංකාව සඳහා වන මූලික විමර්ශන අභ්‍යාසයක්", උෂා පෙරේරා, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, පෙබරවාරි 23



"දකුණු ආසියා රටවල ගෝලීය වටිනාකම් දාම සහභාගීත්වය කෙරෙහි වෙළඳ ප්‍රතිපත්තියේ බලපෑම: බංග්ලාදේශ-ශ්‍රී ලංකා වෙළඳ සාකච්ඡා සඳහා වන ඇඟවීම්", චතුර්ධිකා යෝගරාජා, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, මාර්තු 24



"ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී කුටුම්භ කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ බලපෑම: කඩිනම් කුටුම්භ සමීක්ෂණයකින් ලබාගත් ප්‍රතිඵල", ලක්ෂිලා වනිගසිංහ, පර්යේෂණ නිලධාරී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 'දදප තාක්ෂණය ඔස්සේ, අප්‍රේල් 28.

Impact of COVID-19 on Household Income

Income Strata (LKR)	Share of total households		
	Pre-pandemic	First Wave	Second Wave
<25,000	70.0%	88.7%	86.3%
25,000 – 49,000	23.0%	9.3%	11.3%
50,000 – 79,000	5.7%	2.0%	2.1%
> 80,000	1.3%	0.0%	0.3%

COVID-19 adversely affected households of all income strata. Share of HH's earning <25,000 increased to over 80% during the pandemic.

Incomes of some HH's improved in the second wave (share of HH's earning <25,000 have reduced by 3% from first to the second wave).

80% of HH's experienced a decreased in HH income in the first wave. Impact in the second wave was less aggressive as only 61% of HH's experienced a fall in income.


Reasons for a decline in HH Income



Coping Strategies Adopted




"ආර්ථික අර්බුදය, ඉහළ යමින් පවතින ආහාර මිල සහ පෝෂණ යහපැවැත්ම: ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ජාල මැදිහත්වීම් සඳහා විකල්ප", ආචාර්ය සුරේෂ් බාබු, අංශ ප්‍රධානී, හැකියා ශක්තිමත් කිරීම් අංශය, ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI), මහාචාර්ය ජීවිකා වීරහේවා, මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සහ ආචාර්ය ප්‍රදීපා කෝරලේගෙදර , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මෙහෙයවීම - ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, මැයි 23



"ගුණාත්මක දත්ත විශ්ලේෂණය - උද්ගාමී ප්‍රවේශය", සුරේෂ් රණසිංහ සහ උෂා පෙරේරා, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, ජූනි 28





"ශ්‍රී ලංකාවේ වතු අංශයේ පාසලෙන් ගිලිහුණු සිසුන්", හිමානි විතානගේ, ව්‍යාපෘති සීමාවාසික සහ 2021 සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානයේ ජයග්‍රාහක, Zoom තාක්ෂණය ඔස්සේ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජූලි 25





"ආර්ථික අර්බුදය තුළ වෙළඳ ප්‍රතිපත්තිය: ආවරණය, බලපෑම සහ ප්‍රතිසංස්කරණ", ආචාර්ය අසංක විජේසිංහ, පර්යේෂණ සහකාර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, Zoom තාක්ෂණය ඔස්සේ, අගෝස්තු 31





"ශ්‍රී ලංකාවේ සීනි යොදා රසගන්වන ලද පැණි බීම තෝරාගැනීම කෙරෙහි ඒවායෙහි අඩංගු පෝෂක ද්‍රව්‍ය ලැයිස්තුව ලේබල්වල ප්‍රදර්ශනය කිරීමෙහි බලපෑම", ප්‍රියංකා ජයවර්ධන, පර්යේෂණ ආර්ථික විද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, සැප්තැම්බර් 29.



"ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන්හි දේශපාලන ආර්ථිකය", සුනිමලී මදුරාවල, පර්යේෂණ ආර්ථික විද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, නොවැම්බර් 30



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික පුහුණු වැඩසටහන 2022

	නම	තනතුර	විශ්වවිද්‍යාලය
1	චතුරී ස්වර්ණමාලි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
2	මද්‍රි යෙහියා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	බොස්ටන් විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ.
3	සචින්ත පිලපිටිය	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	නිව් යෝර්ක් විශ්වවිද්‍යාලය, අබුඩාබි, එක්සත් අරාබි එමිරේට්ස්
4	රාහුල් ඊරියගොල්ල	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	ලෆ්බරෝ විශ්වවිද්‍යාලය, එ. රාජධානිය
5	චතුරිකා පෙරේරා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
6	සදීෂා සේනානායක	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
7	උපුලි චම්පිකා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
8	සනුකි මෙලීෂා	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
9	සෙනත් රණවීර	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	මොනෑෂ් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන්	**2022** රු.	2021 රු.
ආදායම්			
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන	**2**	-	27,812,000
ව්‍යාපෘති ආදායම්	**3**	105,456,710	69,667,408
පොළී ආදායම්	**22**	67,934,669	30,831,385
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	**4**	71,146,433	28,232,540
සම්මන්ත්‍රණ/වැඩමුළු වලින් ලැබුණු ආදායම්	**5**	-	591,000
විවිධ ආදායම්		2,997,810	683,457
මුළු ආදායම්		**247,535,622**	157,817,790
වියදම්			
සේවක පිරිවැය	**6**	94,695,689	73,897,846
පර්යේෂණ පිරිවැය	**7**	37,905,793	23,294,574
උපයෝගිතා වියදම්		15,993,983	13,493,656
වෙනත් මෙහෙයුම් වියදම්		12,231,096	13,527,694
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිරිවැය	**8**	-	85,261
ගමන් වියදම්		150,815	30,988
මුළු වියදම		**160,977,376**	**124,330,019**
වර්ෂය සඳහා ජංගම අතිරික්තය		**86,558,246**	33,487,771
දේපළ, පිරියත සහ උපකරණ මත අගය ක්ෂය වීම	**16**	16,633,112	15,992,950
වර්ෂය සඳහා අගය ක්ෂය කිරීමෙන් පසු අතිරික්තය		**69,925,134**	**17,494,821**
ආදායම් බදු වියදම්	**9**	19,471,354	8,268,950
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය		**50,453,780**	**9,225,871**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන්	**2022** රු.	2021 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	**10**	222,102,590	280,708,203
ආයෝජන	**11**	93,893,803	110,157,200
ලැබිය යුතු වෙළඳ	**12**	23,156,315	13,152,327
තොග - ප්‍රකාශන		1,788,177	1,674,133
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**13**	12,456,038	8,091,456
ලැබිය යුතු පොළී	**14**	21,786,049	6,234,477
වෙනත් ලැබිය යුතු දෑ	**15**	76,090,145	22,653,428
මුළු ජංගම වත්කම්		**451,273,117**	442,671,233
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**16**	456,799,204	467,020,840
දීර්ඝ කාලීන ආයෝජන	**11**	264,961,074	122,210,600
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**13**	3,022,279	4,154,020
මුළු ජංගම නොවන වත්කම්		**724,782,557**	593,385,460
මුළු වත්කම්		**1,176,055,674**	1,036,056,693
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	**17**	24,285,219	15,223,664
ව්‍යාපෘති මත අත්තිකාරම් ලැබීම්	**18**	107,413,221	36,,314,558
මුළු ජංගම වගකීම්		**131,698,440**	51,538,222
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	**19**	28,828,338	21,262,898
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල		5,428,769	3,609,226
මුළු ජංගම නොවන වගකීම්		**34,257,107**	24,872,124
මුළු වගකීම්		**165,955,547**	76,410,346
ශුද්ධ වත්කම්		**1,010,100,127**	959,646,347
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		**1,010,100,127**	959,646,347

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇත.

....
ප්‍රධාන මූල්‍ය නිලධාරී විධායක අධ්‍යක්ෂ

....
සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙහි 5 වැනි පිටුවේ සිට 8 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 9 වැනි පිටුවේ සිට 15 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම දරයි.

.....
කොළඹදී ය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමුච්චිත අතිරික්තය
	රු.
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	950,420,476
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	9,225,871
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	959,646,347
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	50,453,780
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,010,100,127**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2022**	2021
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය	**සටහන්**		
බදු ගෙවීමෙන් පසු අතිරික්තය/(ඌනතාවය)		69,925,134	17,494,821
ගැලපීම්			
සේවක සුභසාධක අරමුදලෙහි මාරු කිරීම්		1,819,543	638,725
දේපළ, පිරියත හා උපකරණ මත අගය ක්ෂයවීම්	**16**	16,633,112	15,992,950
පාරිතෝෂික ප්‍රතිපාදන / (ප්‍රතිවර්තන)	**19**	8,272,692	1,295,505
පොළී ආදායම		(67,934,669)	(30,831,385)
බොල් ණය සඳහා ප්‍රතිපාදන (වැඩිවීම)/අඩුවීම		997,506	(341,571)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)		**29,713,318**	**4,249,045**
ලැබිය යුතු වෙළඳ (වැඩිවීම)/අඩුවීම		(11,001,494)	6,346,312
තොග (වැඩිවීම)/අඩුවීම		(114,044)	(159,617)
තැන්පතු සහ ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		(3,232,832)	(6,562,362)
වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		(53,436,717)	(6,722,491)
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම)/අඩුවීම		71,098,663	10,328,323
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		3,233,299	(1,521,024)
මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**36,260,193**	**5,958,186**
පාරිතෝෂික ගෙවීම්		(707,252)	(1,748,750)
ආදායම් බදු ගෙවීම්			
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)	**19**	(13,643,097)	(8,693,868)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ගලනය		**21,909,844**	**(4,484,432)**
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	**16**		
ලැබුණු පොළිය		(6,411,476)	(37,203,126)
ආයෝජන මිලදී ගැනීම		52,383,097	27,635,706
ආයෝජන විකිණීමෙන් ලැබුණු මුදල		(325,851,178)	(339,111,852)
		258,186,974	351,831,442
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**(21,692,583)**	**3,152,170**
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම		217,260	(1,332,262)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 10)		1,329,184	2,661,446
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		**1,546,444**	**1,329,184**
(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම			
බැංකුවේ ඇති මුදල්		1,416,444	1,239,184
අත ඇති මුදල්		130,000	90,000
		1,546,444	**1,329,184**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මඟින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මඟින් එය නීත්‍යානුකූල ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යනයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංක 100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2 සකස් කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රාකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස වෛතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩතාවය

ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩතාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකව ම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියයාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ඉන් පසුව කරනු ලබන වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනීත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මඟින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි දියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

දේපළ, පිරියත සහ උපකරණ (තව දුරටත් .....)

වත්කමෙහි ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ.

පරිගණක උපකරණ	33 %
වෙබ් පිටු සැලසුම්	33 %
මෝටර් සයිකල්	10%
ලීබඩු	10%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	10%
පුස්තකාල පොත්	25%
ගොඩනැගිලි	2%

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

හානිකරණය

සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

(ඇ) කල්බදු

වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරිත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සඵල ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ

(ඈ) ආයෝජන

මෙම ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරවලින් සමන්විත වේ.

i. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට උපචිත වන පොළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ

ii. භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්

භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ආයෝජන (තවදුරටත් ...)

iii. භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් ලෙස වර්ග කරනු ලැබේ.

iv. සාංගමික ණයකර

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් දක්වා කල් තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලැබේ

(ඉ) තොග

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

(ඊ) අය විය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩව සිදු කෙරෙන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

(උ) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු, සාංගමික ණයකර සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹ ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

(ඌ) බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධීවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(ඊ) සේවක ප්‍රතිලාභ

i. නිර්වචිත දායක සැලසුම්
ආයතනයෙහි සියලු ම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. නිර්වචිත ප්‍රනතිලාභ සැලැස්ම
ආයතනය විසින් ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාර්තෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඌ) ආදායම් හඳුනාගැනීම

i. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය
ශ්‍රී. ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. ව්‍යාපෘති ආදායම
ව්‍යාපෘති ආදායම ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් ගිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv. පොළී ආදායම
පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

(ඔ)

i. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම
ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

2 ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන

ආයතනයෙහි උපයෝගීතා, නඩත්තු සහ ආදයම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන වලින් සමන්විත වෙයි. සමාලෝචිත වර්ෂය තුළ කිසිම ප්‍රදානයක් නිදහස් කොට නොමැත.

		2022	2021
		රු.	රු.
3	**ව්‍යාපෘති ආදායම්**	**105,456,710**	69,667,408
	ආයතන වලින් ලැබුණු ආදායම		

4 සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලින් ලැබුණු ආදායම්

මෙය පරිත්‍යාග ලබා දෙන්නන්ගේ ඉල්ලීම මත, ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ වැඩ පිළිබඳ ප්‍රචාරණය කිරීමේ ක්‍රමයක් ලෙස පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබුණු ආදායමෙන් සමන්විත වේ.මෙම වර්ෂය තුළ කිසිඳු ආදායමක් උපයා නොමැත.

		2022	2021
5	**විවිධ ආදායම්**	රු.	රු.
	ප්‍රකාශන අලෙවි කිරීම	709,115	308,695
	තැපැල් ගාස්තු	3,930	3,930
	විනිමය ලාභය / (පාඩුව)	2,223,125	36,524
	වෙනත් ආදායම්	61,640	334,308
		2,997,810	683,457

		2022	2021
6	**සේවක පිරිවැය**	රු.	රු.
	ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප්	67,964,156	56,970,832
	සේ.අ.අ.	8,155,090	6,903,394
	සේ.නි.භා.අ.	2,038,772	1,725,848
	කෙටි කාලීන සේවක පිරිවැය	5,286,321	4,094,595
	අධ්‍යක්ෂක ගාස්තු සහ දීමනා	684,000	684,000
	සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු	1,746,078	1,981,857
	වෙනත් ප්‍රතිලාභ	548,580	241,817
	පාරිතෝෂික සඳහා වෙන් කිරීම් (සටහන 19)	8,272,692	1,295,503
		94,695,689	73,897,846

		2022	2021
7	**පර්යේෂණ පිරිවැය**	රු.	රු.
	මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු	987,020	471,877
	අන්තර්ජාල ගාස්තු	3,616,052	3,102,281
	උපදේශක ගාස්තු	13,952,377	10,731,462
	කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා	5,376,422	5,833,930
	ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය	8,508,813	1,429,926
	ජාත්‍යන්තර ගමන්	1,539,579	-
	වෙනත් පර්යේෂණ පිරිවැය	3,925,530	1,725,098
		37,905,793	23,294,574

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2022	2021
8	**වෙනත් මෙහෙයුම් වියදම්**	රු.	රු.
	ලියාපදිංචි සහ සාමාජික ගාස්තු	457,740	406,405
	කාර්යාල පිරිවැය	976,228	1,193,743
	සාමාන්‍ය කාර්යාල පිරිවැය	794,985	1,488,214
	වෘත්තීයවේදී සහ නීති ගාස්තු	2,533,931	3,315,351
	ජාල සහ සේවාදායක නඩත්තු කිරීම (සටහන 8.1)	7,355,885	5,143,940
	බාහිර විගණන ගාස්තු	392,100	192,140
	වෙළඳ දැන්වීම්	42,400	24,000
	බැංකු ගාස්තු / කොමිස්	146,565	89,752
	අඩමාන ණය සඳහා වෙන්කිරීම්	(997,506)	997,506
	වෙනත් පරිපාලන සම්බන්ධ වියදම්	340,168	384,893
	රැස්වීම් වියදම් - ආයෝජන භාර අරමුදල (ETF)	188,600	291,750
		12,231,096	13,527,694

8.1 ජාල නඩත්තු වියදම්වලට ජාල සහ සේවා පද්ධති නඩත්තු ගිවිසුමෙහි ක්‍රමක්ෂය කළ පිරිවැය ඇතුළත් වේ. සටහන් කරන ලද ගාස්තුවලට 2023 ඔක්තෝබර් මාසය දක්වා වසර දෙකක කාලයකට අත්සන් කරන ලද ගිවිසුම සඳහා වන ගාස්තු ද ඇතුළත් වේ. (2021: ඔක්තෝම්බර් 2018 සිට ඔක්තෝම්බර් 2021)

9 ආදායම් බදු වියදම

ප්‍රවර්තන බදු වියදම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුව, ආයෝජන වලින් ලැබෙන ආදායම 14% ක ආදායම් බද්දකට යටත් වේ. ඒ අනුව 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂයෙහි ආදායම් බදු සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත:

	2022
	රු.
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය (පොළී ආදායම)	71,146,433
වෙනත් පොළී ආදායම්	67, 934,669
	139,081,102
පොළී ආදායම මත බදු (14% ක අනුපාතය යටතේ රු. 139,081,102/-)	**19,471,354**

		2022	2021
10	**මුදල් සහ මුදල් හා සමාන දෑ**	රු.	රු.
	බැංකුවේ ඇති මුදල්	1,078,010	739,184
	කෙටි කාලීන තැන්පතු ගිණුමෙහි ඇති මුදල්	-	500,000
	සුළු මුදල්	130,000	90,000
	ආයතනික ණය කාඩ්පත්	338,434	-
	මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන		
	ස්ථාවර තැන්පතු සහ ප්‍රතිම්ලදී ගැනීම් ගිවිසුම	54,762,815	175,554,936
	ප්‍රතිම්ලදී ගැනීම් ගිවිසුම - කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල	-	4,060,923
	ස්ථාවර තැන්පතු - පාරිතෝෂික	-	21,126,730
	භාණ්ඩාගාර බිල්පත්	165,793,332	78,636,430
		222,102,590	280,708,203

ආයෝජන - දීර්ඝ කාලීන

දීර්ඝ කාලීන ආයෝජන කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලබන පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ:

	2022	2021
	රු.	රු.
භාණ්ඩාගාර බැඳුම්කර	244,961,074	96,210,600
භාණ්ඩාගාර බැඳුම්කර – කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල	5,000,000	
සාංගමික ණයකරන	15,000,000	26,000,000
	264,961,074	122,210, 600

		2022	2021
12	**වෙළඳ ලැබිය යුතු දෑ**	රු.	රු.
	වෙළඳ ලැබිය යුතු ව්‍යාපෘති	7,304,776	11,181,012
	බොල් ණය සඳහා වෙන් කිරීම්		(997,506)
	බිල්පත් සකස් කරමින් පවතින	15,851,539	2,968,821
		23,156,315	13,152,327

		2022	2021
13	**තැන්පතු සහ පූර්ව ගෙවීම් - කෙටි කාලීන**	රු.	රු.
	පූර්ව ගෙවීම් (සටහන 13.1)	10,097,990	7,617,575
	තැන්පතු	970,350	343,750
	අත්තිකාරම් - සේවකයින් (ගමන් ආශ්‍රිත)	128,369	-
	වෙනත් සැපයුම්කරුවන්ට අත්තිකාරම් (සටහන 14.3)	1,259,329	130,140
		12,456,038	8,091,465

තැන්පතු සහ පූර්ව ගෙවීම් - දීර්ඝ කාලීන	2022	2021
	රු.	රු.
පූර්ව ගෙවීම් - නඩත්තු ගාස්තු	**-**	1,523,001
පූර්ව ගෙවීම් - මෘදුකාංග බලපත්‍ර ගාස්තුව	3,022,279	2,631,019
	3,022,279	4,154,020

		2022	2021
13.1	**පූර්ව ගෙවීම්**	රු.	රු.
	වෛද්‍ය රක්ෂණය	1,027,822	696,800
	වෙනත් රක්ෂණ	821,755	425,564
	වෙනත් පූර්ව ගෙවීම්	1,161,603	3,157,944
	නඩත්තු කිරීම් - කෙටිකාලීන	2,476,896	1,884,125
	මෘදුකාංග බලපත්‍ර ගාස්තුව - කෙටිකාලීන	4,609,915	1,453,142
		10,097,990	7,617,575

		2022	2021
14	**ලැබිය යුතු පොළී**	රු.	රු.
	ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම	82,421	-
	ස්ථාවර තැන්පත්	13,716	1,406,312
	භාණ්ඩාගාර බිල්පත	9,027,361	1,912
	භාණ්ඩාගාර බැඳුම්කර	11,879,243	4,002,061
	සාංගමික ණයකරන	783,308	824,192
		21,786,049	6,234,477

		2022	2021
15	**වෙනත් ලැබිය යුතු**	රු.	රු.
	කාර්ය මණ්ඩල ණය ගැනියෝ	4,959,001	3,457,030
	අය විය යුතු වෙනත් මුදල් (සටහන (15.1)	71,131,144	19,196,398
		76,090,145	22,653,428

		2022	2021
15.1	**අය විය යුතු වෙනත් මුදල්**	රු.	රු.
	ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු මුදල්	71,131,144	19,196,398
		71,131,144	19,196,398

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16 දේපල, පිරියත සහ උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2022 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,858,738	135,775,189	29,615,195	19,956,911	25,528,787	1,731,829	693,475,147
එකතු කිරීම්	-	-	2,141,200	-	8,500	4,270,276	-	6,411,476
දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**137,916,389**	**29,615,195**	**19,965,411**	**29,799,064**	**1,731,829**	**699,886,624**
සමුච්චිත ක්ෂය								
2022 ජනවාරි 01 දිනට ශේෂය	-	70,660,729	99,010,809	12,898,423	19,492,311	22,663,574	1,728,462	226,454,308
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,432,576	6,529,243	2,865,180	84,197	720,317	1,599	16,633,112
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**77,093,305**	**105,540,052**	**15,763,603**	**19,576,508**	**23,383,891**	**1,730,061**	**243,087,420**
2022 දෙසැම්බර් 31 වැනි දිනට	**156,000,000**	**247,765,431**	**32,376,337**	**13,851,592**	**388,903**	**6,415,173**	**1,768**	**456,799,204**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16 දේපළ, පිරියත සහ උපකරණ (තවදුරටත් ...)

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2021 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,858,736	135,775,189	29,615,195	19,965,411	25,404,287	1,730,529	656,272,081
එකතු කිරීම්	-	-	2,141,200	-	-	124,500	1,300	37,203,126
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**137,916,389**	**29,615,195**	**19,965,411**	**25,528,787**	**1,731,829**	**693,475,148**
සමුච්චිත ක්ෂය								
2021 ජනවාරි 01 දිනට ශේෂය	-	64,263,892	92,788,470	10,049,160	19,407,077	22,226,579	1,726,180	210,461,358
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,396,837	6,222,339	2,849,263	85,234	436,995	2,282	15,992,950
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**70,660,729**	**99,010,809**	**12,898,423**	**19,492,311**	**22,663,574**	**1,728,462**	**226,454,308**
2021 දෙසැම්බර් 31 වැනි දිනට	**156,000,000**	**254,198,007**	**36,764,380**	**16,716,772**	**473,100**	**2,865,213**	**3,367**	**467,020,840**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2022	2021
17	**ලැබිය යුතු වෙළඳ**	රු.	රු.
	උපචිත (සටහන 17.1)	13,475,008	11,941,444
	සේ.භා.අ. සහ සේ.නි.භා.අ. ගෙවිය යුතු	2,762,060	1,088,041
	ගෙවිය යුතු උපයන විට බදු	25,565	-
	ගෙවිය යුතු මුද්දර බදු	3,925	3,775
	ගෙවිය යුතු ආදායම් බදු	8,018,661	2,190,404
		24,285,219	15,223,664

		2022	2021
17.1	**උපචිත**	රු.	රු.
	කාර්යාල පිරිවැය	2,831,256	3,160,867
	බාහිර විගණන ගාස්තු - IPS	624,000	552,000
	වෘත්තීය සහ නීති ගාස්තු - IPS	689,367	416,900
	වෘත්තීය සහ නීති ගාස්තු - ETF	160,000	239,916
	විදුලිය ගාස්තු	543,210	490,016
	දුරකථන / අන්තර්ජාල ගාස්තු	513,053	326,214
	ඉන්ධන	71,360	40,148
	පර්යේෂණ ව්‍යාපෘති වියදම්	8,042,761	6,715,382
		13,475,008	11,941,444

		2022	2021
18	**ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම්**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	36,314,558	25,986,235
	වර්ෂය තුළ ලැබීම්	141,537,784	70,101,993
	වර්ෂය තුළ ගෙවීම්	(4,885,169)	-
	හඳුනාගත් ආදායම්	(65,553,952)	(59,773,670)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**107,413,221**	36,314,558

		2022	2021
19	**සේවක ප්‍රතිලාභ**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	21,262,898	21,716,143
	වර්ෂය තුළ හඳුනාගත් වියදම් (සටහන 19.1)	8,272,692	1,295,505
	වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(707,252)	(1,748,750)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,828,338**	21,262,898

2022 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 45 ක් වේ (2021: 45).
2022 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 45 ක් වේ (2021: 45).
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

වට්ටම් අනුපාතිකය	18.00% (20121: 10%)
වැටුප් අනුපාතිකයෙහි වර්ධනය	15.00% (2021: 9.20%)
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	22% (2021: 15%)

		2022	2021
19.1	**වර්ෂය තුළ හඳුනාගත් වියදම්**	රු.	රු.
	ප්‍රවර්තන සේවා පිරිවැය	2,175,856	1,748,120
	පොළී පිරිවැය	2,126,290	1,737,313
	ආයුගණක (ලාභය)/පාඩුව	3,970,546	(2,189,928)
		8,272,692	1,295,505

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

20 කල් බදු වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2021: නැත)

21 ප්‍රාග්ධන වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2021: නැත)

22 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

22.1 ආයතනයෙහි ආයෝජන භාර අරමුදල

ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2022 දෙසැම්බර් 31 දිනට රු. 510,341,348/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2021 රු. 510,341,848/-). භාරයේ මුළු ආදායමම IPS වෙත ලබා දෙන අතර භාර අරමුදලේ කළමනාකරණ වියදම් IPS විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ. වෙනම ම විගණනය කරනු ලබන ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ම ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. මෙම භාර අරමුදල භාරකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ).

22.2 ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස ("KMP")

SLPSAS 14 ට අනුව "සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්", KMP යනු ආයතනයේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරියක් සහ වගකීමක් ඇති පුද්ගලයන් වේ.

IPS කාර්ය මණ්ඩල පිරිවැය තුළ (සටහන 6) ප්‍රධාන කළමනාකරණ සේවක පිරිසට ගෙවනු ලබන වැටුප රු. 25,106,376/- (2021: රු. 19,740,000/-) ඇතුළත් වේ.

22.3 වෙනත් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

පුනරාවර්තන වියදම් සඳහා 2021 දී ශ්‍රී ලංකා රජය විසින් රු. 27,812,000/-ක මුදලක් ආයතනයට ප්‍රදානය කරන ලදී. මෙම වසර තුළ කිසිඳු මුදලක් ප්‍රදානය කොට නොමැත.
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, මහ බැංකුවේ අධිපති සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයට නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ.

23 අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

24 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

25 පාලක මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/ඩී/අයිපීඑස්/එස්එස්/2022

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 ජූනි 23 දින

සභාපති
ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2003 ජූනි මස 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (i) 9.2 (බී) ඡේදය	ආයතනය සඳහා කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොමැති අතර ආයතනයේ මෙහෙයුම් අත්පොතට අනුකූලව අවුරුද්දක කොන්ත්‍රාත් පදනම මත සහ ඊට අඩු කාල පරිච්ඡේදයක් සඳහා කෝන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලය සේවයේ යොදවාගෙන තිබුණි.
(ii) 9.3.1 (I) ඡේදය	රාජ්‍ය ව්‍යවසායක් වශයෙන් ආයතනය සඳහා බඳවාගැනීම් සහ උසස් කිරීම් පටිපාටියක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය විසින් චක්‍රලේඛය ප්‍රකාරය කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුව පරිඝණක උපාංග මිලදී ගැනීමට සැලසුම් කර නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.2,141,260 ක් වටිනා පරිඝණක උපාංග වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයට (Shopping) වරින් වර මිලදී ගෙන තිබුණි

2.3 වෙනත් කරුණු

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනය විසින් 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද 2022 වර්ෂය දක්වා දිවෙන ව්‍යාපෘති 05 ක් පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
විගණන වාර්තාව සඳහා පිළිතුරු
LSW/D/IPS/FS/2022

මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම 2022

2. වෙනත් නීති, රීති, රෙගුලාසි වලට අනුකූල වීම

2.2.2

(අ) (i) මාණ්ඩලික සේවක සංඛ්‍යාව කළමනාකරණය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හේතු දෙකක් නිසා ලියාපදිංචි සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන නොයයි. පර්යේෂණ ව්‍යාපෘති ආදායම් උපයා ගැනීම මත දැඩි ලෙස රඳා පවතින එහි අරමුදල් සපයා ගැනීමේ ස්වභාවය පළමුවන හේතුවයි. ප්‍රතිපත්ති පරිසරය සහ පරිත්‍යාගශීලීන්ගේ උනන්දුව ඇතුළු හේතු ගණනාවක් නිසා ව්‍යාපෘති ආදායම් ස්ථාවර තත්ත්වයක නොපවතියි. රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා වෙනස් වන විට පර්යේෂණ ක්ෂේත්‍ර වෙනස් වීම දෙවන හේතුවයි. මෙම සාධක දෙක නිසා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ස්වකීය කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව සථිල සහ පිරිවැය ඵලදායී ලෙස ගළපා ගැනීම සඳහා නම්‍යශීලීභාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය වේ. පසුගිය වසර ගණනාවක් මුළුල්ලේ මෙම කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර, 2015 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශයේ විගණන කමිටුවේ දී එය සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීම අවශ්‍ය නොවන බවට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එකඟ විය.

(ii) බඳවා ගැනීම් සහ උසස්වීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් අත්පොත (Manual of Operations) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පටිපාටිය, උසස්වීම් සහ වේතන ඇතුළු මෙහෙයුම් ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා සකස් කර ඇත. ආයතනය පාලනය වන නීති සහ නියමයන් සම්පාදනය කිරීම සඳහා ආයතනය පිහිටුවනු ලැබූ නීතිය වන 1988 අංක 53 දරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතෙහි 6(අ) වගන්තිය මගින් බලතල පවරා ඇති ආයතනයේ පාලක මණ්ඩලය විසින් මෙම මෙහෙයුම් අත්පොත අනුමත කර ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති නීති සහ නියමයන්ට අනුව ආයතනය ක්‍රියාත්මක වීමට නම්, එම මෙහෙයුම් අත්පොත මුදල් අමාත්‍යාංශය වෙතින් විධිමත් ලෙස අනුමත කරවා ගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) ඉල්ලා සිටියේය. ඒ අනුව මෙහෙයුම් අත්පොත මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර, 2014 වර්ෂයේ දී ඒ සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණි. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු පිළිතුරු ලිපිය විගණකවරුන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා විගණකවරුන් වෙත ලබා දෙන ලදී.

2.2.4

2022 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2022 අපේක්ෂිත වෙනස්කම් සහ නව අවශ්‍යතා ඇතුළත් කිරීම පිණිස වරින් වර සංශෝධනය කරන ලදී. ඒ අනුව අතිරේක වත්කම් අවශ්‍යතා ද පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීම සඳහා සභාගත කරන ලදී. ඒ සම්බන්ධ පාලක මණ්ඩල පත්‍රිකාව විගණන සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, නිරීක්ෂණ යටතේ සඳහන් කර ඇති උපකරණ ද ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කොටසක් වේ.

2.3

පහත සඳහන් ව්‍යාපෘති 2021 වර්ෂයේ දී ආරම්භ කර තිබූ නමුත් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති බව විගණන වාර්තාව මගින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, පහත ලැයිස්තුගත කර ඇති ව්‍යාපෘති පහ ම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර, අපගේ පැහැදිලි කිරීම් පහත දක්වා ඇත:

ව්‍යාපෘති කේතය	ව්‍යාපෘතියේ නම	වාර්ෂික සැලැස්මට ඇතුළත් කර ඇත	සටහන්
PJ 361 F (B)	දේශපාලන ආර්ථික විශ්ලේෂණය - දුම්කොළ ප්‍රතිසංස්කරණ ගැටළු	ඔව්	2022 මෙය ප්‍රධාන ව්‍යාපෘති කේතය වන PJ 361 F හි අනු කේතයක් වේ. 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා PJ 361 F- සම්පූර්ණ ප්‍රදානය සලකා බලන ලදී.
PJ 361 F (C)	ශ්‍රී ලංකාවේ බීඩි පරිභෝජනය අඩු කරන්නේ කෙසේද?	ඔව්	
PJ 367 F	උපාය මාර්ගික සැලසුම්කරණය, කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ සෞඛ්‍ය මුල්‍යකරණය සඳහා ප්‍රමුඛතාවය ලබා දීම සඳහා දත්ත සහ දැනුම වැඩි දියුණු කිරීම	තොග වටිනාකම තුළ ඇතුළත් කර ඇත.	2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2021 ඔක්තෝම්බර් මාසයේදී සකස් කරන ලදී. වී වන විට අත්සන් කර තිබූ ව්‍යාපෘති ගිවිසුම් 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද අතර, අපේක්ෂිත නව ව්‍යාපෘති සඳහා තොග ඇස්තමේන්තුවක් (රු.මි. 9) සපයා දෙන ලදී. මෙම කේත ඔක්තෝබර් 21 දිනෙන් පසුව විවෘත කරන ලද බැවින් වීවා තොග වටිනාකමෙන් නියෝජනය වෙයි.
PJ 369 F	දකුණු ආසියානු සංවර්ධන සහ සහයෝගිතා වාර්තාව	තොග වටිනාකම තුළ ඇතුළත් කර ඇත.	
PJ 370 F	ශ්‍රම සංචලනය සහ සංක්‍රමණිකයින් සඳහා වන දකුණු ආසියානු මධ්‍යස්ථානය (SALAM)	තොග වටිනාකම තුළ ඇතුළත් කර ඇත.	



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
ටෙලි: +94 11 2143100 | +94 11 2665065
ඊමේල්: ips@ips.lk, Website: www.ips.lk
බ්ලොග්: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
ට්විට්ර්: www.twitter.com/TalkEconomicsSL